# රණවිරුවා

2024 ජනවාරි • 262 කලාපය



## පරපුරකට ආදර්ශයක් පෙන්වූ උඩු ගුවනේ හපන්කම...





ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# රණවිරු සවියෙන් නවීකරණය කළ ක්‍රීඩා පිටිය ජනතා අයිතියට



ගලේවෙල ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය කරන ලද පොදු ක්‍රීඩාපිටියක් ඉකුත් ජනවාරි 21 වන දින නිල වශයෙන් විවෘත කර ජනතා අයිතියට පත්කිරීමේ අවස්ථාවට වැඩබලන ආරක්ෂක අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන්, මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී වූහ.



වැඩබලන ආරක්ෂක අමාත්‍ය තුමන්ගේ මඟපෙන්වීම සහ යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ හා ඉංජිනේරු සේනාංකයේ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සිදුවිය. යාන්ත්‍රික ඉංජිනේරු බලසේනාව යටතේ රාජකාරියෙහි නියුතු 4 (ස්වේච්ඡා) සහ 7 ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා හටපිරිස්හි තාක්ෂණික හා ශ්‍රම දායකත්වය මේ සඳහා හිමිවූහ. තවද, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ මෙම ව්‍යාපෘතිය සිදුකෙරිණ.



මෙය නියමිත කාලසීමාවේදී අවසන් කිරීම සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සාමාජිකයින් වෙත වැඩබලන ආරක්ෂක අමාත්‍ය තුමන් එහිදී සිය කෘතවේදීත්වය පුදකරනු ලැබීය. අනතුරුව, ස්වාභාවික විපත්වලදී ප්‍රදේශයේ ජනතාවට මෙම ප්‍රතිසංස්කරණය කරන ලද ක්‍රීඩාපිටිය මගින් ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳව ද එතුමන් අවධාරණය කරනු ලැබීය.

භාවිතයට ගත නොහැකි *Saladin* සන්නාහ සන්නද්ධ රථයක් සහ *MV4* වර්ගයේ බිම්බෝම්බ ඉවත් කිරීමේ රථයක්ද මෙම ක්‍රීඩාපිටියට අලංකාරත්වයක් සහ අභිමානයක් එක්කරමින් එහි ස්ථාපිත කොට විවෘත කිරීම ද එම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති අතින් සිදුකෙරිණ.





# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සංචාරයක







ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් ඉකුත් ජනවාරි මස 12 වන දින කොස්ගම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ සංචාරයක නිරත වෙමින් එහි සේවයේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයන් හමුවී සුහද පිළිසඳරක නිරතවිය. එම පරිශ්‍රය වෙත සපැමිණි අමාත්‍ය තුමන් එහි සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සමගින් නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. එම මූලස්ථානයේ ස්ථාපිත කපිතාන් සාලිය අලදෙණිය ගේ පිළිරුවට පුෂ්පෝපහාර පුදකළ එතුමන් වෙත ඉන් අනතුරුව හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය ද පුදකෙරිණ.

සිය සංචාරයේදී අමාත්‍යතුමන් හැපිරිස් අමතමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ගේ වත්මන් කාර්යභාරය ඇගයීමට ලක්කළේය. එසේම, එම මූලස්ථානය යටතේ සේවයේ නියුතු සාමාජිකයන් ආමන්ත්‍රණය කිරීම සඳහා එතුමන් හට අවස්ථාව සලසාදීම වෙනුවෙන් අමාත්‍යවරයා එහිදී යුද්ධ හමුදාධිපති වෙත සිය කෘතඥතාව පුදකළේය.

# 96 වන ජාතික මුෂ්ටි ප්‍රහාර ශූරතාවලිය - 2023






"96 වන ජාතික මුෂ්ටි ප්‍රහාර ශූරතාවලිය - 2023" කොළඹ රාජකීය විද්‍යාලයීය ගයාස්ට ක්‍රීඩාංගණයේ දී ජනවාරි මස 13 සිට 17 දින දක්වා පැවැත්විණ. ඒ සඳහා යුද්ධ, නාවික, ගුවන් සහ පොලිස් කණ්ඩායම් ඇතුළු දිවයින පුරා ක්‍රීඩා සමාජ 17 ක තරඟකරුවෝ 151 දෙනෙක් සහභාගී වූහ.

එහිදී, රන් පදක්කම් 10 ක්, රිදී පදක්කම් 06 ක් සහ ලෝකඩ පදක්කම් 10 ක් දිනාගනිමින් "වසරේ දක්ෂතම මුෂ්ටි ප්‍රහාර කණ්ඩායමට" හිමි කුසලානය දිනාගැනීමට යුද්ධ හමුදා කණ්ඩායම සමත්විය. තවද, තරඟාවලියේ කාන්තා අංශයේ අනු ශූරතාවයද යුද්ධ හමුදා කාන්තා බලකා මුෂ්ටි ප්‍රහාර කණ්ඩායම හිමිකරගත්තේ රන් පදක්කම් 02 ක්, රිදී පදක්කම් 05 ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගනිමිනි.

පිරිමි අංශයේ දක්ෂතම මුෂ්ටි ප්‍රහාරකයාට හිමි කුසලානය යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කෝප්‍රල් පද්මසිරි කේජීසී දිනාගත් අතර, කාන්තා අංශයේ දක්ෂතම පරාජිත ක්‍රීඩිකාව ලෙස කාන්තා සෙබළ දසුනිකා එම්ජීඑම්ටී කුසලාන දිනාගත්තාය.

සම්මාන ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගී වූ අතර, යුද්ධ හමුදා බොක්සිං කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ඇතුළු පිරිසක් ද එම අවස්ථාවට එක්වූහ.







# 2024

# නව වසරේ වැඩ අරඹයි

2024 වර්ෂයේ පළමු වැඩකරන දිනය සනිටුහන් කරමින් සංවිධානය කෙරුණු උත්සවයක් ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ජනවාරි 01 වන දින උදෑසන පැවැත්විණ. එහිදී ධජ එසවීම, රාජ්‍ය ප්‍රතිඥාව කියවීම සහ යුද්ධ හමුදාධිපති තුමන්ගේ පණිවිඩය කියවීම ඇතුළු අංග රැසක් ඊට ඇතුළත් විය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේදී ඊට එක්වූ සියලු නිලයින් ඇමතීමටද හෙතෙම කටයුතු කළේය. එහිදී, යුද්ධ හමුදා සාමාජිකයන් විසින් පසුගිය දශක කිහිපය තුළ විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් කැපවීමෙන් සිදුකළ කාර්යභාරය පිළිබඳ මතක ආවර්ජනය කළ යුද්ධ හමුදාධිපති රටේ යහපත වෙනුවෙන් යුද්ධ හමුදාවට පැවරී ඇති නව වගකීම් හමුවේ ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව ද පැහැදිළි කළේය.





## නව වසරේ රාජකාරී ආරම්භ කරමින් "මිහිඳු සෙත් මැදුරේ" හි විරුවන් හමුවී

2024 නව වසරේ රාජකාරී කටයුතු ආරම්භ කරමින් යුද්ධ හමුදාධිපති ඉකුත් ජනවාරි 02 වන දින අත්තිඩිය "මිහිඳු සෙත් මැදුර" සුවතා නිකේතනයේ රණෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා එක්විය. මෙම නිල සංචාරය සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

එහිදී, ඔවුහු නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුවදුක් විමසා ඔවුන් වෙත නව වසරට සුභපැතුම් එක්කරමින් විශේෂ ත්‍යාග පාර්සල් ද බෙදාදුන්හ.

# යුද්ධ හමුදා මූලධර්ම ප්‍රකාශන ග්‍රන්ථ එළිදැක්වේ



යුද්ධ හමුදා පුහුණුව, අධ්‍යාපනය සහ කාර්ය මණ්ඩල කටයුතු සඳහා නව පරිච්ඡේදයක් එක් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගමන්මගෙහි සුවිශේෂී අවස්ථාවක් සනිටුහන් කරමින් යුද්ධ හමුදා මූලධර්ම ප්‍රකාශන ග්‍රන්ථ එළිදැක්වීම ඉකුත් ජනවාරි 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ. එම උත්සව අවස්ථාවට යුද්ධ හමුදා පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීසීඑල් ගුණවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ පිළිගැනුම මධ්‍යයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්විය.



එහිදී, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති වෙත සංශෝධිත ග්‍රන්ථයන්හි මංගල පිටපත් ප්‍රදානය කරනු ලැබිය. එහිදී, *Army Field Manuals on Formation Tactics and Internal Security Operations, Glossary of Military Terms Handbook, Military Abbreviation Handbook, Operational Staff Work Handbook, Staff Officers' Handbook,* සහ *Command and Control and Leadership Handbooks* යන ප්‍රකාශනයන් ද *'Historical Reminiscences of Army Training Command and Directorate of Research Concept and Doctrine 2012-2023'* යන මැයෙන් වූ සමරු ග්‍රන්ථය ද එළිදැක්විය.




එමගින් යුද්ධ හමුදා දැනුම සියලුම හමුදා සාමාජිකයින්ට අධ්‍යයනය කළ හැකි පරිදි සංශෝධනය කර ඇති අතර, සියලුම ප්‍රකාශනයන්හි විද්‍යුත් පිටපත් යුද්ධ හමුදා විද්‍යුත් ද්වාරය වෙත උඩුගත කිරීමට ද කටයුතු කර ඇත.





# ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ වර්ණ ප්‍රදානෝත්සවය - 2024 උත්කර්ශවත් අයුරින්








ඉංජිනේරු බලකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලබා ඇති සුවිශේෂී ජයග්‍රහණ ඇගයීමට ලක්කරමින් සංවිධානය කෙරුණු ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ "ඉංජිනේරු බලකා වර්ණ ප්‍රදානෝත්සවය - 2024", පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් ජනවාරි 19 වන දින පැවැත්විණ. එම අවස්ථාවට ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

එහිදී, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ජාත්‍යන්තර, ජාතික, ආරක්ෂක සේවා, අන්තර් රෙජිමේන්තු තරගවලදී ඉසව් 24 ක් නියෝජනය කරමින් විශිෂ්ට දස්කම් දැක්වූ එම බලකායේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 107 දෙනකු වෙත වර්ණ ප්‍රදානය කරනු ලැබූහ. යුද්ධ හමුදාධිපති මෙම අවස්ථාවේදී, ඉංජිනේරු බලකායේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තවදුරටත් දිරිගැන්වීමේ අරමුණින් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියනයක මූල්‍ය පරිත්‍යාගයක් ද ලබාදෙනු ලැබීය. මෙම අවස්ථාවට එම බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද හිටපු යුද්ධ හමුදාධිපතිවරයකු වූ ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක (විශ්‍රාමික) ඇතුළු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් ද සහභාගී වූහ.

# රට සුරකින "මෙරූන් හිස්වැසුම" පැළඳි වගයි




කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාඨමාලා අංක 51 ඊ, එෆ් සහ ජී යටතේ ක්‍රියාන්විත උපායමාර්ගයන් පිලිබඳ විශිෂ්ට වූ පුහුණුවක් හැදෑරූ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ විසිරයාම ඉකුත් ජනවාරි 13 වන දින කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි. විශිෂ්ඨයින් අතර විශිෂ්ටයින් ලෙස රට සුරකින මෙහෙවරට පිළිපන් එම විරුවන්ගේ විසිරයාමේ අවස්ථාවට කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

එහිදී, නිලධාරීන් 03 දෙනෙක් සහ සෙසුනිලයින් 162 දෙනෙක් සඳහා මෙරූන් හිස්වැසුම පැළඳවීම ද පාඨමාලාවේ විශිෂ්ට දක්ෂතා දැක්වූ නව කමාන්ඩෝ සාමාජිකයන් වෙත කුසලාන හා සහතිකපත් ප්‍රදානය ද යුද්ධ හමුදාධිපති අතින් සිදුකෙරිණ.











එම උත්සවය සමාප්තියේ, කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේ පිහිටි පැරෂුට් පතිත කලාපයේදී කමාන්ඩෝ සාමාජිකයෝ ඔවුන් සතු ශක්තිමත්භාවය, උපායමාර්ගික කුසලතාවයන් හා ප්‍රහාරක හැකියාවන් මනාව පිළිබිඹු කළහ. තවද, කමාන්ඩෝ රෙජිමේන්තුවේ සැඟවුණු වෙඩික්කරුවන්ගේ ඉලක්කගත කිරීම, ජීව වෙඩි තැබීම, කමාන්ඩෝ භටයින්ගේ සැබෑ ආත්ම ආරක්ෂක සටන් ක්‍රම, ත්‍රස්තවාදී ග්‍රහණයට හසුවූ ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීම, ත්‍රස්ත මර්දන ක්‍රියාත්මක නිදසුන්, යුද සුනඛ (K9) සංදර්ශන සහ නිදහස් ආර පැරෂුට් සංදර්ශන ආදී අංග රැසක් ඉදිරිපත් කරමින් සහභාගී වූවන් මහත් විස්මයට පත්කළේය.

එම පාඨමාලාවේ දක්ෂතම කමාන්ඩෝ භටයා ලෙස ලුතිනන් එස්එම්එල්ඩී කරුණාරත්න ද හොඳම ශාරීරික යෝග්‍යතාවය හිමි සෙබලා ට හිමි සම්මානය සාමාන්‍ය සෙබල ඉලන්දර අයිපීඑම්ඩී ද දක්ෂතම වෙඩික්කරුට හිමි සම්මානය සාමාන්‍ය සෙබල ලක්ෂාන් ආර්කේඑස්ටී විසින් ද හිමිකරගනු ලැබූහ. එසේම, කමාන්ඩෝ රෙජිමේන්තුව වෙතින් ඉදිකිරීමට යෝජිත ලිඩෝ ජම්ප් කලාපයේ ප්‍රථම පස් පිඩැල්ල කැපීම සඳහා ද රෙජිමේන්තු අධිපතිගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති සහභාගී විය.



# යුද හමුදාධිපති සුහද හමුවීම් රැසක



ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලෙස රාජකාරි භාරගනු ලැබූ කොමදෝරු එම් මොනිරුසාමන් (ටීඒඑස්) එන්ජීපී පීඑස්සී බීඑන් (*Commodore M Moniruzzaman (TAS) NGP psc BN*) ඉකුත් ජනවාරි මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූයේය. එම සුහද හමුවේ ප්‍රධාන අරමුණ වූයේ දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර පවතින ද්විපාර්ශ්වීය සබඳතා, මෙරට හමුදා සාමාජිකයින් සඳහා යුද්ධ පුහුණු පාඨමාලා සහ එම ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමයි.



කොළඹ පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නව සහකාර ආරක්ෂක උපදේශක ලෙස රාජකාරි භාරගනු ලැබූ ලුතිනන් කර්නල් මන්දීප් සිං නෙගී එස්එම් (*Lieutenant Colonel Mandeep Singh Negi SM*) ඉකුත් ජනවාරි මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම සුහද හමුවේදී, දෙරටේ ත්‍රිවිධ හමුදාවන් අතර පවතින සුහදතාවය, සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳව අදහස් හුවමාරු කර ගැනිණ.

විශ්‍රාම ගැනීමට නියමිත නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී රියර් අද්මිරාල් කේජේ කුලරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඉකුත් ජනවාරි 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූයේය.





නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ධූරය භාරගැනීම සඳහා පිටත්ව යාමට නියමිත ශ්‍රී ලංකා නාවික හමුදාවේ කපිතාන් වයිඅයි ද සිල්වා ආර්ඩබ්ලිව්පී පීඑස්සී ඉකුත් ජනවාරි 24 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම සුහද හමුවේදී, යුද්ධ හමුදාධිපතිතුමන් විසින් ජාතියේ උන්නතිය වෙනුවෙන් ආරක්ෂක උපදේශකයකු ලෙස තමාට ඉටු කළ හැකි ප්‍රධාන රාජ්‍යතාන්ත්‍රික කාර්යභාරයෙහි වැදගත්කම අවධාරණය කරමින් කපිතාන් වයිඅයි ද සිල්වා ආර්ඩබ්ලිව්පී පීඑස්සී වෙත සිය සුබපැතුම් පිරිනැමීය.



යුද්ධ හමුදාවේ 22 වන යුද්ධ හමුදාධිපති සහ විශේෂ බලකා රෙජිමේන්තුව නියෝජනය කළ ජ්‍යෙෂ්ඨතම නිලධාරියකු වන ජෙනරාල් මහේෂ් සේනානායක (විශ්‍රාමික) ඉකුත් ජනවාරි මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති හමුවූයේය. එහිදී, එතුමන් සිය සේවා කාලය තුළ විවිධ ධූරයන්හි රාජකාරී සිදුකරමින් යුද්ධ හමුදාව වෙනුවෙන් කළ අගනා සේවය වත්මන් යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට ලක්විය.

# උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත යුද්ධ හමුදාධිපති සුරතින් නිල ලාංඡන



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 05 දෙනෙක් වෙත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් ඉකුත් ජනවාරි 02 වන දින සංකේතාත්මකව නිල ලාංඡන පැළඳවීය.

ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් අධ්‍යක්ෂ ජෙනරාල් ගමන් පාලන මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ඒසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, යුද්ධ හමුදා පොදු සේවා බලකායට අයත් අධ්‍යක්ෂ ජෙනරාල් අයවැය සහ මුදල් පරිපාලන මේජර් ජෙනරාල් ඒඑම්කේජීපීඑස්කේ අබේසිංහ, ගැමුණු හේවා බලකායට අයත් ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ සේනාවිධායක මේජර් ජෙනරාල් සීඒ රාජපක්ෂ ආර්එස්පී සහ ගැමුණු හේවා බලකායට අයත් පාබල පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එලෙස උසස්වීම් ලැබූ නිලධාරීහු වූහ.

ඔවුන් දේශය වෙනුවෙන් දශක තුනහමාරක පමණ කාලයක් තිස්සේ සිදුකරනු ලැබූ කැපකිරීම ඇගයූ යුද්ධ හමුදාධිපති ඔවුනට සිය සුබ පැතුම් පිරිනමනු ලැබීය. උසස්වීම් ලැබූ එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත මේජර් ජෙනරාල් නිලයේ අසිපත ද එහිදී පිරිනමනු ලැබීය.

# මාතලේ ඇල්වල විද්‍යාලීය බටහිර තූර්ය වාදක කණ්ඩායමට පරිත්‍යාගයක්



මාතලේ ඇල්වල විද්‍යාලයීය බටහිර තූර්යවාදක කණ්ඩායමට මෙතෙක් පැවති විශාල අඩුපාඩුවක් සපුරාලමින් ඔවුනගේ ප්‍රයෝජනය සඳහා සංගීත භාණ්ඩ ප්‍රදානය කිරීමට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පි ආර්එස්පී එන්ඩීයූ විසින් කටයුතු කරන ලදී. අදාළ භාණ්ඩ ප්‍රදානය පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරුණු අතර, එම අවස්ථාවට විද්‍යාලයේ විදුහල්පති කේජ්බීකේකේ කොඩිතුවක්කු මහතා, ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායම් පුහුණුකරු ඇතුළු ශිෂ්‍යයින් පිරිසක් සහභාගී වූහ.

# තුවාල ලැබූ යුද්ධ හමුදා පැරෂුට් භටයින්ගේ සුවදුක් විමසමින්





කොළඹ, ගාලු මුවදොර පිටියේදී 76 වන නිදහස් දින සැමරුම් පෙළපාලි පෙරහුරුවට සමගාමීව පැවති පැරෂුට් පුහුණුවීම් අතරතුරදී සිදුවූ අනතුරින් තුවාල ලැබූ යුද්ධ හමුදා නිලධාරියාගේ සහ සෙබළාගේ සුවදුක් විමසීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පි ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජනවාරි මස 30 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහල වෙත පැමිණියහ. එහිදී, යුද්ධ හමුදාධිපති රෝහලේ වෛද්‍ය නිලධාරීන් සමග ද සාකච්ඡා කරමින් අනතුරට පත්වූවන්ගේ සෞඛ්‍ය තත්ත්වය සහ ඔවුන්ගේ ඉදිරි ප්‍රතිකාර කටයුතු පිළිබඳව ද විමසා බැලීය.









# ඉතිහාසය වෙනස් කළ යුද්ධ හමුදාපතිගේ ගුවන් පිම්ම

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ පසුගිය ජනවාරි මස 22 වන දින ඓතිහාසික පිම්මක් පනිමින් පැරෂුට් හමුදා භටයකු ලෙස සිය අභීත බව විදහා දැක්විය. දෙස් විදෙස් නිලධාරීන් හා සෙබළ කණ්ඩායමක්ද, සමගින් ඔහු එම හපන්කම පෙන්වූයේ පැරෂුට් ඉතිහාසයට නව පරිච්ඡේදයක් එක් කරමිනි.

උෑව කුඩාඔය කොමාන්ඩෝ පුහුණු පාසලේ පැරෂුට් පුහුණු අංශය තුළදී සිදුකළ පැරෂුට් පැනීම සඳහා අවශ්‍ය මූලික ශිල්පයන් ප්‍රගුණ කිරීමෙන් අනතුරුව උහන ගුවන් හමුදා කඳවුරෙහි පැරෂුට් පතිත කලාපයේදී ඔහු එම පිම්ම සිදුකරන ලද්දේ මාලදිවයින් නිලධාරීන් තිදෙනෙක් හා සෙබළ 15 දෙනෙක්, යුද්ධ හමුදා විනයාරක්ෂාධිපති ඇතුළු කොමාන්ඩෝ සෙබලු 13 දෙනෙක් ද සමගිනි.

යුද්ධ හමුදාව තුළ පැරෂුට් පැනීම් කොතෙකුත් සිදුවුවද, මෙම අවස්ථාව සටහන් වනුයේ ඓතිහාසික වූත් අසමසම වූත් එකක් ලෙසය. විශේෂයෙන්ම යුද්ධ හමුදාපතිවරයකු ලෙසද, යුද්ධ හමුදාව තුළ වයසින් ජ්‍යේෂ්ඨතම නිලධාරියා ලෙසද ඔහු මෙම පැරෂුට් පැනීමට එක්වීම ඉතිහාසගත ක්‍රියාවකි. එසේම, එය මෙරට පමණක් නොව ජාත්‍යන්තරයේ පවා එවන් හපන්කමක් සිදුකළ ප්‍රථම හා එකම අවස්ථාව වීමටද, බොහෝ සෙයින් ඉඩ ඇත.

යුද්ධ හමුදාධිපති මෙම සුවිශේෂී පිම්ම හරහා සිය නිර්භීත බවත් වයස හෝ තනතුර නොසලකා ඉලක්ක ජය ගැනීමට ඇති කැපවීමත් මනාව ප්‍රකට කළේය. ඒ හරහා යුද්ධ හමුදාවේ වත්මන් තරුණ පරපුරටද ඔහු ලබා දී ඇති ආදර්ශය අතිමහත්ය. එදා මෙදා තුර ගුවන ජයගත් අසහාය පැරෂුට් භටයින්ගේ නාමාවලියට මෙතැන්පටන් වත්මන් යුද්ධ හමුදාපතිගේ නාමයද එකතු වන්නේ එය තවත් එක් පැරෂුට් පැනීමක් ලෙස නොව එම ක්ෂේත්‍රයේ යෝධ සන්ධිස්ථානයක් සනිටුහන් කරමිනි.

# “ඒක අරමුණක කටයුතු කරනවා නම් අපේ ඉලක්කය ජයගන්න පුළුවන්”



**ඔබතුමා අපේ රටේ යුද්ධ හමුදාධිපති. ඉතින් ඇයි මේ වගේ පැරෂුට් පැනීම් කරන්න අවශ්‍යයයි කියලා තිරණයක් ගත්තේ ?**

මම කපිතාන්වරයෙක් විදිහට ඉන්දියාවේ පූනාවල ශාරීරික උපදේශක පාඨමාලාව අවසන් කරලා ලංකාවට ආවට පස්සේ පැරෂුට් පුහුණුව සඳහා ඉල්ලුම් කළා. නමුත්, මට ඒ අවස්ථාව ලැබුණේ නෑ. ඒ වෙලාවෙ මට හොඳ ශාරීරික යෝග්‍යතාවයක් තිබුණා ඒ පුහුණුව සඳහා. ඒත් මම මේ ගැන තියෙන උනන්දුව අඩු කරගත්තේ නෑ. මේ පාඨමාලාව සඳහා කමාන්ඩෝ සහ විශේෂ බලකා සෙබළුන් වගේම පාබල සේනාංකවල දක්ෂයින් යොමු වෙනවා. ඒ අය තමන්ගේ පුහුණුව අවසන් කරලා පැරෂුට් භටයෙක් විදිහට සුදුසුකම් සම්පූර්ණ කරනවා දකිද්දි මගේ ඒ සඳහා තියෙන ආශාව වැඩි වුණා. ඒ වගේම ඒ සඳහා අවශ්‍ය ශාරීරික යෝග්‍යතාව ගැන සැලකිලිමත් වුණා. ඒ දේවල්වල ප්‍රතිඵලයක් විදිහට තමයි මම මේ පැරෂුට් පැනීම් සිදුකරනවා කියන තීරණය ගත්තේ. ඇත්තටම මේ සම්බන්ධයෙන් මම විශාල උනන්දුවකින් පසුවුණා. විශේෂයෙන්ම විදේශීය නිලධාරීන්ට මෙරට පැරෂුට් පැනීම පුහුණු කිරීම වෙනුවෙන් අනුමැතිය දෙන්න මම කටයුතු කළෙත් ඒ නිසාමයි.

**ඔබ ඒ ගත්ත තීරණය අතිශයින්ම තීරණාත්මකයි වගේම අවදානම් සහගතයි. ඒ පිළිබඳව ඔබට දැනුණේ මොනවගේ හැඟීමක්ද?**

මේක අවදානමක් කියලා මම දන්නවා. නමුත්, මම විශ්වාස කළා කමාන්ඩෝ පුහුණු පාසලේ පුහුණුව සහ එහි උපදේශකයින් පිළිබඳව. මම හැමවෙලාවෙම ඔවුන්ගේ උපදෙස් පිළිපැද්දා. මොකද ඔවුන් ගුවන් සංග්‍රාම ගැන විශේෂ අවබෝධයක් තියෙන පිරිසක්. ඒ වගේම මට මම ගැන විශාල ආත්ම විශ්වාසයක් තිබුණා. මම මගේ වයස ගැන තැකීමක් කළේ නෑ. ඒ වගේම මම මේ දේ කළොත් ඒක මගේ කණිෂ්ඨ නිලධාරීන්ට විශාල අභිප්‍රේරණයක් වෙයි කියලා මම විශ්වාස කළා.

**ඔබ මේ තීරණය ගත් පසු ජනාධිපතිතුමාට සහ ආරක්ෂක ලේකම්වරයාට මේ පිළිබඳව දැනුම් දුන්නාද? එහිදී, ඔවුන්ගේ ප්‍රතිචාරය වුණේ මොකක්ද?**

ඔව්, ඔවුන් දෙදෙනාම මාගේ තීරණය අගය කළා. ඒ වගේම මාගේ තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කළා. ඔවුන් සතුටු වුණා මගේ ආත්ම විශ්වාසය පිළිබඳව. ඒ විතරක් නෙවෙයි ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක සාගල රත්නායක මැතිතුමා වගේම ජනාධිපති ලේකම් සමන් ඒකනායක මැතිතුමාත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා නිලධාරීතුමාත් මේ සම්බන්ධයෙන් මට ඔවුන්ගේ ප්‍රශංසාව පළකළා.

**සාමාන්‍යයෙන් තරුණ නිලධාරියකු පැරෂුට් පැනීමක් කරනවාට වඩා අතිශය අභියෝගාත්මක කටයුත්තක් ඔබ කළේ. ඔබේ පවුලේ සාමාජිකයින්ගෙන් මේ ගැන ලැබුණේ මොනවගේ ප්‍රතිචාරයක්ද ?**

හැමදාම වගේ මගේ බිරිඳ, දුව සහ පුතා මේ සම්බන්ධයෙන් මට හොඳ ආත්ම විශ්වාසයක් ගොඩනැගුවා. ඔවුන් මගෙන් මුලින් ඇහුවා මට මේක

කරන්න පුළුවන්ද කියලා. ඒ වගේම ඔවුන් දන්නවා මම යම් අරමුණක කටයුතු කළොත් අනිවාර්යයෙන්ම ඒ අරමුණ ඉටු කරගන්නවා කියලා. ඔවුන්ගෙන් කිසිම බාධාවක් මට තිබුණේ නෑ. ඔවුන් මට පුහුණුවීම් සිදුකරන අවස්ථාවන්හි සිටම මා හට ශක්තියක් වුණා. මාගේ යුද්ධ හමුදා ජීවිතයේ අනෙකුත් සෑම අභියෝගයකදීම වගේම මේ අවස්ථාවේදීත් ඔවුන් මාගේ පිටුපසින් සිටියා. ඒ වගේම ඔවුන් මගේ පුහුණු උපදේශකවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විශාල විශ්වාසයකින් කටයුතු කළා. ඔවුන්ට යම් තැතිගැන්මක් තියෙන්න ඇති. හැබැයි ඔවුන් මගේ මානසිකත්වය බිඳවැටෙන කිසිම දෙයක් මට දැනෙන්නවත් දුන්නෙ නෑ.

**පැරෂුට් පැනීමක් කියන්නේ සරල දෙයක් නෙවේ. ඒ සඳහා ඔබ ප්‍රගුණ කළයුතු කුසලතා ඔබ ප්‍රගුණ කළේ කොහොමද?**

පළමු වතාවට කරන පැරෂුට් පැනීමක් කියන්නේ ලේසි කටයුත්තක් නෙවෙයි. මම මුලින්ම මෙම විෂය හා කුසලතාවය සම්බන්ධව ඇති න්‍යායාත්මක කරුණු කාරණා පිළිබඳව මනා අධ්‍යයනයක් සිදුකළා. අනතුරුව මා රාජකාරීන් අතරතුර ලද විවේකයන්හි දී එම ප්‍රායෝගික පුහුණුවීම්වල නිරත වෙමින් අදාළ ශිල්පීය ක්‍රම ප්‍රගුණ කළා. සමහර දවස්වලට මම පුහුණුවීම් පටන් ගන්නේ රෑ නවයට විතර. මධ්‍යම රාත්‍රිය පහුවෙනතුරු මම පුහුණුවීම් කළා. ඒ විදිහට මම මාසයක් විතර දැඩි කැපකිරීමක් කළා මේ වෙනුවෙන්. මා හඳාරා ඇති ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවෙන් ලද පන්නරයත් මට විශාල පිටුවහලක් වුනා. ඒ වගේම තමයි මේජර් වසන්ත දිසානායක, සාජන් සුදේශ් කුමාර, කෝප්‍රල් සූරිගේ මට උපදේශන කටයුතු කළා. ඔවුන් තරුණ නිලධාරීන් පුහුණු කරන ආකාරයෙන්ම තමයි මට ඒ පුහුණුව ලබාදුන්නේ. මමත් ඔවුන්ගේ උපදෙස් අනුව ශාරීරිකව සහ මානසිකව ඒ වෙනුවෙන් පුහුණු වුණා. ඇත්තටම උපදේශනයේ තිබූ ගුණාත්මක බව ඉහළ නිසා මට මේ කටයුත්ත පහසු වුණා.

**ඒ පුහුණුවේදී ඔබට ලැබුණු අමතක නොවන අත්දැකීම් මොනවාද ?**

න්‍යායාත්මක කරුණු අධ්‍යයනයේදී මා හට මෙම විෂය සම්බන්ධ විශාල අවබෝධයක් ලැබුණා. ප්‍රායෝගික



පුහුණුවීම් නිර්මාණය කර තිබෙන්නේ ලුතිනන්, කපිතාන් වැනි නිලයන් හොබවන තරුණ නිලධාරීන්ටයි. යුධ හමුදාධිපති ලෙසින් එම ශිල්පීය ක්‍රම ප්‍රගුණ කිරීම මා හට අමතක නොවන සහ නවක අත්දැකීමක්. මගේ පුහුණුකරුවන් මාව පියවරෙන් පියවර මේ සඳහා පුහුණු කළා. ඇත්තටම තරුණ නිලධාරීන් වෙනුවෙන් තියෙන පාඨමාලාවක පුහුණුවීම් මම කරපු එක මට අමතක නොවන අත්දැකීමක්. මොකද වයස කියන කාරණය ගැන නොසිතා අරමුණ වෙනුවෙන් කැපවෙන්න කියන දේ ඔවුන් මට හැමවෙලාවෙදීම කිව්වා. හැබැයි ඒ පුහුණුවේ දී මම හමුදාපති කියන කාරණය මම විසින්ම අමතක කරලා මම තවත් පුහුණුවෙන්නෙක් කියන දේ විතරක් හිතට අරන් කටයුතු කිරීම නිසා මට මේ දේ පහසු වුණා.

**පැරෂුට් පැනීම් කුසලතාවය ප්‍රගුණ කරද්දී කවුද ඔබට ඒ සඳහා ගුරුහරුකම් ලබාදුන්නේ ?**

කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ පැරෂුට් පුහුණු අංශයේ ප්‍රධාන උපදේශක මේජර් නලින් කුලතුංග මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ වගේම ඔහුගේ උපදේශක මණ්ඩලය මා හට නිරතුරුවම අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබාදුන්නා. ඒ වගේම කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් මගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරී සහ ඔහුගේ සහයක නිලධාරී ඇතුලු කණ්ඩායම මා හට මෙම කර්තව්‍ය ආරම්භ කළ අවස්ථාවේ සිට අවසානය තෙක්ම මා ලඟින් රැඳී සිටිමින් අවශ්‍ය මගපෙන්වීම් කටයුතු සිදුකළා. ඔවුන් සියලු දෙනා හට මා මේ අවස්ථාවේ කෘතඥ විය යුතුයි. ඒ වගේම තමයි අවසාන මොහොතේදී මට ගුවන් හමුදා පැරෂුට් අංශයේ අණදෙන නිලධාරී වින්ග් කමාන්ඩර් විජිත ගෝමස් සහ ඔහුගේ කාර්ය මණ්ඩලය විශාල සහයෝගයක් ලබා දුන්නා.

**මේ අත්දැකීම ලැබෙන්නේ බොහොම සුළු පිරිසකට. එදා හෙලිකොප්ටරයෙන් බිමට පනිද්දී ඇතිවුණු හැඟීම මොකක්ද?**

මට උපදේශකයින් කිව්වේ උඩදී කිසිම වෙලාවක බිම බලන්න එපා කියලා. නමුත්, ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. පනින්න කලින් බිම බැලෙනවාමයි. මගෙ JUMP MASTER මේජර් නලින් කුලතුංග මට පනින්න විධානය දුන්න ගමන්ම මම ක්ෂණිකව පැන්නා. පළවන තත්පර කිහිපය ගතවුණා. පැරෂුට් එක ඇරෙන්න පටන් ගද්දි මම ගුවනේ ඉන්නේ කියන එක දැනුණා. පැරෂුට් එක ඇරුණට පස්සේ මම ආරක්ෂිතයි කියන එක තහවුරු කර ගත්තා. ඒ වෙලාවේ ලොකු සතුටක් දැනුනා.

**ඔබ පැරෂුටය හසුරවමින් ගුවනේ සිටිය කාලය ඔබට දැනෙන්නේ කොහොමද ?**

ගුවන් යානයෙන් මිදුනු මොහොතේ සිට පොළවට පතිත වන තෙක් එම කෙටි කාලය මාගේ ජීවිතයේ නවතම අත්දැකීමක්. මම සැබවින්ම එම කෙටි කාලය තුළ තෘප්තියක් ලැබුවා. කුරුල්ලෙක් ලෝකය දකින විදිහ කොච්චර ලස්සනද කියන හැඟීම මට ඒ වෙලාවේ ලැබුණා. අපි ගුවන් යානයකදී වටපිටාව දකින විදිහටත් වඩා හාත්පසින්ම වෙනස් අත්දැකීමක් ඒක.

**ජනිත සීමාවට පැමිණ අවසන් ජනිතය සාර්ථක කළාම ඔබට දැනුණේ මොනවගේ හැඟීමක්ද ?**

තමන් දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව ගත්තු අභියෝගාත්මක තීරණයේ අවසාන ප්‍රතිඵලය ලැබෙද්දී කාටද සතුටක් නොලැබෙන්නෙ. මම ඒ අත්දැකීම ලැබුවා. හැබැයි මට මගේ උපදේශකයින් කියලා දුන්නු විදියට ජනිතයේ දී ගත යුතු සියලුම තාක්ෂණික ක්‍රමවේද මම අනුගමනය කළා. හිතුවාට වඩා ඉක්මනින් මම මගේ ජනිතය සිදුකළා. ඒ වගේම මගේ ජනිතය සාර්ථකව සිදුකරද්දී ඒ අසළ රැඳී සිටි සියලුම දෙනා මට ලබාදුන් ධෛර්යය නිසා මම තව තවත් ශක්තිමත් වුණා.

**ලංකාවේ යුද්ධ හමුදාධිපතිවරයෙක් මේ විදිහට පැරෂුට් පිම්මක් පැන්න පළමු අවස්ථාව මේක. ඒ වගේම ඔබ තමයි පැරෂුට් පැනීම් සිදුකළ මෙරට වයසින් වගේම නිලයෙන් ජ්‍යේෂ්ඨතම සක්‍රිය සේවයේ ඉන්න එකම නිලධාරියා. මේ පිළිබඳව ඔබේ අදහස මොකක්ද ?**

මම පැරෂුට් එක දානකම් ඇත්තටම ඒ ගැන හැඟීමක් මට තිබුණේ නෑ. හැබැයි අවසන් දවස වෙද්දි මට කල්පනා වුණා ඒ දේත්. නමුත් මගේ අරමුණ වෙන දෙයක්. මම ඒ අරමුණ සාර්ථක කරගන්න අවශ්‍ය දේවල් කළා මිසක අනිත් කාරණා ගැන මම අවධානය යොමු කළේ නෑ. හැබැයි ජනිතය සාර්ථක වුණාට පස්සේ මම ඔබ ඔය කියන කාරණය ගැන අතිශයින්ම සතුටට පත්වුණා වගේම නිහතමානී ආඩම්බරයකුත් ඇතිවුණා. ඒ ඇරෙන්න ඔය කාරණය පිළිබඳ විශේෂ අවධානයක් තිබුණෙ නෑ මට.

**පැරෂුට් පැනීමෙන් පසුව ඔබට පළමු සුබපැතුම ලැබුණේ කාගෙන්ද ? ඔබේ පවුලේ සාමාජිකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාරය මොනවගේද ?**

මගේ බිරිඳ සහ පුතා තමා මට මුලින්ම සුබපැතුවේ. ඊට පස්සේ නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරාල් ප්‍රසන්න ගුණරත්න, කමාන්ඩෝ බලකා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ශානක රත්නායක, මගේ පුද්ගලික ආරක්ෂක නිලධාරී බ්‍රිගේඩියර් අනුජීව බාලසූරිය, අම්පාර සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් නලින් හෙට්ටිආරච්චි, පුහුණු පාසැලේ සේනාවිධායක කර්නල් චමින්ද කරුණාරත්න, උභන ගුවන් හමුදා කඳවුරේ අණදෙන නිලධාරී ගෲප් කැප්ටන් ලලිත් සුගතදාස ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලය, මගේ පුහුණු උපදේශකවරුන් ඇතුළු ඒ අවස්ථාවේ හිටපු සියලුම දෙනා මට සුබපැතුවා.

**යුද්ධ හමුදාවට අලුතින් බැඳෙන ඕනෑම කෙනකුට මෙවැනි පැරෂුට් පැනීම් වෙනුවෙන් තියෙන්නේ මොනවගේ අවස්ථාවක්ද?**

මෙම අවස්ථාව හිමිවන්නේ යුද්ධ හමුදාවේ ඉතාම සුලු පිරිසකට. පැරෂුට් සොල්දාදුවන් කියන්නෙ හමුදාවක් තුළ සිටින විශේෂ කුසලතාවයෙන් පිරි කොටසක්. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මේ සඳහා අවශ්‍ය සියලු පහසුකම් කුඩාඔය කමාන්ඩෝ පුහුණු පාසලේ ස්ථාපනය කරල තියෙනවා. ඒ වගේම ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය සහ චීනය වැනි විවිධ රටවල් අප යුද්ධ හමුදාව වෙත පැරෂුට් පුහුණු අවස්ථාවන් ලබාදෙනවා. මම බලාපොරොත්තු වෙනවා මේ තිබෙන පහසුකම් තවත් ඉහළ නංවන්න. ඒ වෙනුවෙන් මම ඉන්දියාව සහ පකිස්ථානය වගේ රටවලින් සහයෝගය ඉල්ලලා තියෙනවා. ඔවුන් ඒ සඳහා ඒකඟතාව පළකර තියෙනවා. ඒ අනුව ඉදිරියේදී යුද්ධ හමුදාවට බැඳෙන සෑම නිලධාරියකුටම මේ පැරෂුට් පුහුණුව ලබාදෙන්න අපිට හැකියාව ලැබෙයි කියන විශ්වාසය මට තියෙනවා.

**ඔබ යුද්ධ හමුදාවේ මේ වනවිට සිටින ජ්‍යේෂ්ඨතම නිලධාරියා ලෙස තරුණ නිලධාරීන්ට මේ ඔබේ පැරෂුට් පැනීම් තුළින් ලබාදෙන පණිවිඩය මොකක්ද ?**

යුද්ධ හමුදාධිපති වශයෙන් මා ඔවුන්ට යුද්ධ හමුදා ජීවිතයේදී අවදානම් ගැනීමේ අවශ්‍යතාවය, සියලුම නිලයන් හට මනා ශාරීරික සෞඛ්‍ය පවත්වා ගැනීමේ වැදගත්කම, කැපවීම, ඒ වගේම ඕනෑම අභියෝගයකට නොපැකිළිව මුහුණදීමේ හැකියාව වර්ධන කරගැනීමේ වැදගත්කම වගේ දේවල් මම ඔවුන්ට මෙහිදී සිහිපත් කරනවා. ඒ වගේම තමයි අපි නිසි ඉලක්කයක් වෙනුවෙන් එක අරමුණක හිඳ කටයුතු කරනවානම් බාහිරින් එන සෑම බලවේගයක්ම පරාජය කරමින් අපේ ඉලක්කය අපිට ජයගන්න පුළුවන් කියන දේ මම ඔප්පු කරලා පෙන්වලා තියෙනවා.

**රටේ තරුණ තරුණියන්ට ඔබට කියන්න තියෙන පණිවිඩය මොකක්ද ?**

මම අපේ රටේ තරුණ තරුණියන්ට ආරාධනා කරනවා එන්න අපේ යුද්ධ හමුදාවට එකතු වෙන්න කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම සහ යුද්ධ හමුදා ඉදිරි සැලසුම් අනුව අනාගතයේ දී තාක්ෂණය සමඟ ඉදිරියට යන වෘත්තීයමය හමුදාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර අපි අරගෙන තියෙනවා. අපි නිපුණතාවෙන් ඉහළ වෘත්තීයමය භාවයෙන් යුතු නිලධාරියකු සහ සොල්දාදුවකු නිර්මාණය කිරීමේ පියවර දැන් ආරම්භ කර තියෙනවා. ඒ නිසා කුසලතාවෙන් පිරි අපේ තාරුණ්‍යයට මම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමඟ එක්වෙන්න කියන ආරාධනය කරනවා.

**පැරෂුට් පැනීම් ක්‍රීඩාවක් වශයෙන් මෙරට සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් යොදා ගන්නවා නම් යුද්ධ හමුදාවෙන් ලබාදෙන්න පුළුවන් දායකත්වය මොකක්ද?**

ඒක වැදගත්ම කාරණයක්. අපි සූදානම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවත් එක්ක එකතු වෙලා මේ පැරෂුට් පැනීම ක්‍රීඩාවක් වශයෙන් මෙරට දියුණු කරලා ඒ සඳහා සංචාරක ආකර්ෂණය දිනාගන්න වැඩපිළිවෙලක් ගොඩනගන්න. ඇත්ත වශයෙන්ම ලෝකයේ දියුණු රටවල් රසක සුලභව මෙම පැරෂුට් ක්‍රීඩාව කිරීමේ පහසුකම් සංචාරක ව්‍යාපාරයන් සමඟ ඒකාබද්ධව සිදුකරගෙන යනු ලබනවා. අපිට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ටත් මෙම අවස්ථාව පහසුවෙන්ම උදාකරන්නට පුළුවන්. ඊට අවශ්‍ය ශිල්පීය දැනුම ඇති උපදේශකයින් යුද්ධ හමුදාව සතුව සිටිනවා. ඉදිරියේදී ගුවන් හමුදාව සමඟ එක්වී අවශ්‍ය පුහුණු යටිතල පහසුකම් සහ උපකරණ වැඩි දියුණු කිරීමෙන් මම විශ්වාස කරනවා යුද්ධ හමුදාව හා ගුවන් හමුදාව ඒකාබද්ධව මෙම කාර්ය සාර්ථක කරගන්න හැකියාව ලැබෙයි කියල.



සටහන -:
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය



# විදේශ විනිමය ඉතිරි කරන යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ මෙහෙවරක්

යුද හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය මගින් Mitsubishi Lancer CS-1 වර්ගයේ මෝටර් රථ 10 ක් CS II මාදිලියේ මෝටර් රථ ලෙස නවීකරණය කොට පසුගියදා යුද හමුදාවේ භාවිතය සඳහා එක්කරන ලදී. තවද, Toyota Camry රථයක් ද එලෙස නවීකරණය කරන ලද රථ අතර විය. මෙම මෝටර් රථ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් පසුගිය ජනවාරි මස 31 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පරීක්ෂා කරනු ලැබීය.

නවතම්යෙන් අලුත්වැඩියා කරන ලද මෙම වාහන පරීක්ෂා කිරීමෙන් අනතුරුව රටට විශාල විදේශ විනිමයක් ඉතිරි කර දීම සඳහා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ භටපිරිස් විසින් කාලෝචිතව ගනු ලැබූ මෙම උත්සාහය යුද්ධ හමුදාධිපති විසින් ඇගයීමට ලක් කරන ලදී. තවද, නවීකරණය කරන ලද මෙම වාහන සඳහා වන අමතර කොටස් සහ අනෙකුත් කොටස් වෙනුවෙන් ද විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වීම පිළිබඳවද හෙතෙම එහිදී සිය ප්‍රශංසාව පල කළේය.

මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපල - කොළඹ, කටුබැද්ද, උඩවලව, අනුරාධපුර, කිලිනොච්චිය, යාපනය සහ තවත් මූලික වැඩපල කිහිපයක් දිවයින පුරා ස්ථාපනය කර ඇත. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත යුද හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ මගපෙන්වීමෙන් පාපැදි, යතුරුපැදි, සැහැල්ලු වාහන, වෑන්, ලොරි, ට්‍රක්, බර වාහන සහ බස් රථ ආදිය නවීකරණය කර යුද හමුදාවේ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කොට ඇති අතර, ඒ හරහා මේ වනවිටත් විශාල විදේශ විනිමයක් ඉතිරිකර ගැනීමට හැකිවීම විශේෂත්වයකි. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපල - කොළඹ අධීක්ෂණය යටතේ මෙම අලුත්වැඩියා කටයුතු සිදුකරනු ලබයි.





# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී වෙත ගජබා රෙජිමේන්තුවේ ගෞරවාචාරය







යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ධූරයේ රාජකාරී භාරගනු ලැබූ මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ වෙත ඉකුත් ජනවාරි 05 වන දින සාලියපුර, ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී එහි හටපිරිස් හමුදා ගෞරවාචාර පිරිනමනු ලැබූහ. උත්සව කටයුතු අවසන සියලු නිල තේ පැන් සංග්‍රහයකටද එක්වූ එතුමන් එහි හටපිරිස් සමගින් සුහදව අදහස් හුවමාරු කරගන්නටද අමතක නොකළේය.



# රාගම රණවිරු සෙවණ සුවතා නිකේතනයේ සංචාරයක්



එළැඹි 2024 නව වසර නිමිත්තෙන් යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ඉකුත් ජනවාරි 02 වන දින රණවිරු සෙවණ සුවතා නිකේතනයේ සංචාරයක නිරතවෙමින් එහි නේවාසික ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයාබලමින් ඔවුන් වෙත අලුත් අවුරුදු ත්‍යාග ද පිරිනමනු ලැබීය. මෙම සංචාරය සනිටුහන් කරමින් නේවාසික රණවිරුවකු විසින් මාණ්ඩලික ප්‍රධානී වෙත විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# "ළමා පියස" ඉදිකිරීම ඇරඹේ





කරාපිටිය ශික්ෂණ රෝහලේ ඉදිකිරීමට යෝජිත ළමා පියස දෙමහල් ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීම ඉකුත් ජනවාරි 04 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සහභාගී විය.

රෝහල් කාර්ය මණ්ඩලයේ ඉල්ලීමකට අනුව මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණයෙන් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා යුද්ධ හමුදාධිපතිගේ අනුමැතියෙන් 12 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ භටපිරිස් සිය තාක්ෂණික දැනුම හා ශ්‍රම දායකත්වය ලබාදෙනු ලබති.

## කඹුරුපිටිය අභිමංසල 2 සුවතා නිකේතනයේ සංචාරයක





යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඉකුත් ජනවාරි 02 වන දින කඹුරුපිටියේ ස්ථාපිත අභිමංසල 2 සුවතා නිකේතනයේ සංචාරයක නිරත වෙමින් එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලූහ. එහිදී, එම රණවිරුවන් හට අලුත් අවුරුදු තෑග පිරිනැමීමට ද කටයුතු කෙරිණ.

# "අංගම්පොර"

# සටන් කලා පුහුණු පාඨමාලාවක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා අංගම්පොර කමිටුව මගින් 1 බලකාය සහ ඒ යටතේ ස්ථාපිත ඒකක සඳහා මසක කාලසීමාවක "අංගම්පොර" පාඨමාලාවක් ආරම්භ කරනු ලැබීය. මෙම සටන් කලා පුහුණු පාඨමාලාව එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අධීක්ෂණය යටතේ පැවැත්වේ.

1 බලකා මූලස්ථාන පරිශ්‍රයේදී ඉකුත් ජනවාරි 14 වන දින මෙම පාඨමාලාවේ ආරම්භක උත්සව අවස්ථාව පැවති අතර, ඒ සඳහා බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා අංගම්පොර කමිටුවේ සභාපති, යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිල පිරිසක් සහභාගී වූහ.

## නව විහාර මන්දිරයට මුල්ගල් තැබේ





නාවට්කුලි සම්ද්ධි සුමන විහාරස්ථානයේ නව විහාර මන්දිරයක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමේ පුණ්‍යෝත්සවය ඉකුත් ජනවාරි මස 13 වන දින පැවැත්වුණු අතර, ඊට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය.

52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඑල්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මූලිකත්වයෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරුණු අතර 523 වන පාබල බලසේනාවේ බලසේනාධිපති සහ 11 ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරී ගේ අධීක්ෂණය මත එම ඒකකයේ හටපිරිස් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය හා තාක්ෂණික දැනුම ලබාදෙනු ලබති. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය අම්පාර දිසාවේ ගරු ප්‍රධාන විනිසුරු නුෂාකා කුමාරි ධර්මකීර්ති මහත්මිය විසින් ලබාදෙනු ලබන්නීය. මෙම අවස්ථාව සඳහා යුද හමුදා නිලධාරීන්, සෙසුනිලයන් සහ බැතිමතුන් විශාල පිරිසක් එක්ව සිටියහ.

# රණවිරු සහයෙන් රථවාහන ප්‍රතිනවීකරණය කෙරේ





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ අයෝග්‍ය තත්ත්වයේ පැවති යුද්ධ හමුදා රථවාහන සහ උපකරණ නැවත භාවිතයට සුදුසු පරිදි ප්‍රතිනවීකරණය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය.

මෙම ව්‍යාපෘතියේ මූලික අදියරේදී පාපැදි 20 ක්, යතුරුපැදි 2 ක්, බර සහ සැහැල්ලු වාහන 20 ක් (ට්‍රැක්ටර්, ගිලන් රථ ඇතුළු) ***LED*** විදුලි බුබුළු 440 ක්, ගෑස් ලිප් 25 ක්, බැලස්ටික් හිස්වැසුම් 1000 ක් සහ කාර්යාල පුටු 50 කට අධික ප්‍රමාණයක් ප්‍රතිනවීකරණය කර පසුගිය ජනවාරි මස 05 වන දින යුද්ධ හමුදාවේ ප්‍රයෝජනය වෙනුවෙන් නැවත යොදවන ලදී. 5 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය සහ 2 ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබූහ. ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති සහ ඒ යටතේ ස්ථාපිත ඒකකයන්හි අණදෙන නිලධාරීන්ගේ අධීක්ෂණය මත මෙම වැඩසටහන ක්‍රියාවට නැංවිණි.

# ජංගම භටපිරිස් සඳහා නවාතැන් සංකීර්ණයක්





වන්නි ආරක්‍ෂක සේනා මූලස්ථානයේ ජංගම රාජකාරීන්හි නිරත භටපිරිස් සඳහා වව්නියාව බස් නැවතුම්පොළ පරිශ්‍රයේ නවීකරණය කරන ලද නවාතැන් සංකීර්ණයක් ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි මස 06 වන දින විවෘත කෙරිණ.

ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති ගේ මඟපෙන්වීම යටතේ එම මූලස්ථානයේ පිහිටි 22 ඉංජිනේරු සේවා බළගණය විසින් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. එම නවාතැන් සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

# බලකාධිපති ඒකක සංචාරයක







ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්කේජූපී ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් ජනවාරි මස 06, 07 සහ 08 තෙදින තුළ 2 (සේවා), 3 (සේවා) සහ 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා ඒකකයන්හි නිල සංචාරයක නිරත වූයේය.

එම ඒකක මූලස්ථානයන් හිදී බලකාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර පුදකිරීමෙන් අනතුරුව එම ඒකකයන්හි අණදෙන නිලධාරීන් විසින් එතුමන් උණුසුම් අයුරින් පිළිගන්නා ලදී. මෙම සංචාරය අතරතුර බලකාධිපති හටපිරිස් ආමන්ත්‍රණය කරමින් ඔවුනගේ අවශ්‍යතා හා සුබසාධන කටයුතු පිළිබඳව ද සොයා බැලීය.

# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





11(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් කොක්කඩිචෝලේ ප්‍රදේශයේ ඉස්ලාම් සහ දමිළ පාසල් දරුවන් හට සිංහල භාෂාව ඉගැන්වීමේ ත්‍රෛමාසික පාඨමාලාවක් කොක්කඩිචොලෙයි සංස්කෘතික මධ්‍යස්ථානය තුළ ඉකුත් දෙසැම්බර් 30 වන දින ආරම්භ කරන ලදී. ඒ සඳහා ළමුන් 103 දෙනකු සහභාගී වූ අතර, ඔවුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එන්කේජූපී ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය.

# පාකිස්ථාන ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මහනුවර ප්‍රදේශයේ සංචාරයක






සිව්වන පාකිස්ථානු ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ආරක්ෂක සම්මන්ත්‍රණය සඳහා දින 05 ක නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණි පාකිස්ථානයේ ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) ලුතිනන් ජෙනරාල් හමූඩ් උස් සමාන් කාන් ඉකුත් ජනවාරි 02 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බල ප්‍රදේශයට අයත් ඓතිහාසික මහනුවර ප්‍රදේශයේ සංචාරයක නිරතවිය.

එහිදී, ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු නිලධාරීහු එම පිරිස උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.

එහිදී, ඔවුහු ශ්‍රී දළදා මාළිගාව වැඳපුදා ගනිමින් පේරාදෙණිය උද්භිත උද්‍යානය, මහනුවර නැරඹුම් ස්ථාන නිරීක්ෂණය කර පල්ලෙකැලේ යුද්ධ හමුදාධිපති නිල නිවසේදී දිවා භෝජන සංග්‍රහයකට එක්වූහ. පාකිස්ථානයේ ආරක්ෂක ලේකම්තුමන් ඇතුළු රාජ්‍යතාන්ත්‍රික දූත පිරිස හා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ඇතුළු නිලධාරීන් අතර සමරු තිළිණ හුවමාරුවක් ද එහිදී සිදුවූහ.






# 'KINAADMAN : MNSA RC 56'

## ජාත්‍යන්තර සඟරාවෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට අභිමානයක්

මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් සහ ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් "ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ සහ මැඩලීමේ උපායමාර්ගික ප්‍රවේශයන්: ශ්‍රී ලංකාවේ 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්" මැයෙන් රචිත රන් පදක්කම්ලාභී නිබන්ධනය පිලිපීනයේ ආරක්ෂක, සංවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානයේ "KINAADMAN : MNSA RC 56" සඟරාව සඳහා තෝරාගෙන ඇත. පිලිපීන ජාතික ආරක්ෂක විද්‍යාලයේ නිත්‍ය පාඨමාලා අංක - 56 (2020/2021) යටතේ සාර්ථක පුහුණුවක් හදාරා ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී එහිදී හොඳම නිබන්ධනය වෙනුවෙන් රන් පදක්කම ද අධ්‍යයන විශිෂ්ටත්වය වෙනුවෙන් ලෝකඩ පදක්කම ද දිනාගනු ලැබීය. ශ්‍රී ලංකා යුද හමුදාවට ද රටට ද අභිමානයක් ගෙනදුන් එම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත "රණවිරුවා" මෙලෙස සුබ පැතුම් එක්කරයි.

# ඉංජිනේරු සේවා බලකායේ 74 වන සංවත්සරය අභිමානවත්ව සැමරේ





ඉංජිනේරු සේවා බලකායේ 74 වන සංවත්සරය සනිටුහන් කරමින් ඉකුත් ජනවාරි මස 10 දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ පිහිටි එම රෙජිමේන්තු මූලස්ථානයේ දී සැමරුම් උත්සවයක් පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

රෙජිමේන්තු මූලස්ථානය වෙත සපැමිණි බලකාධිපති වෙත හටපිරිස් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුද කළහ. අනතුරුව රෙජිමේන්තු රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුද කළ කර්නල් සේනාවිධායක වෙත හටපිරිස් විසින් සම්මාන මුරයේ ගෞරවාචාරය ද පිරිනැමූහ. එහිදී, හටපිරිස් ඇමතූ බලකාධිපති දීර්ඝ ඉතිහාසයක් ඇති රෙජිමේන්තුවේ කාර්යභාරය සිහිපත් කරමින් සියලු නිලයින් වෙත සිය සුභාසිංසන පිරිනැමීය. මෙම අවස්ථාව සඳහා ඉංජිනේරු සේවා බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.

# අභිමානවත් 15 වන සංවත්සරය සමරමින්



58 වන පාබල සේනාංකයේ 15 වන සංවත්සරය සනිටුහන් කරමින් එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ථිරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම මත එම සේනාංක මූලස්ථාන පරිශ්‍රයේදී ඉකුත් ජනවාරි මස 03 වන දින අභිමානවත් සැමරුම් උත්සවයක් පැවැත්විණ.

එළුවන්කුලම "නිර්මල මාතා" වැඩිහිටි නිවාස පරිශ්‍රය පිරිසිදු කර එහි නේවාසික වැඩිහිටියන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමීම, සේනාංකය යටතේ ස්ථාපිත පාබල බලසේනා සහ ඒකක අතර සුහද ක්‍රිකට්, පාපන්දු සහ වොලිබෝල් තරගාවලියක් පැවැත්වීම, සේනාංක මූලස්ථාන පරිශ්‍රය තුළ පිහිටි විහාරස්ථානයේදී ආශිර්වාදාත්මක බෝධිපූජා පිංකමක් පවත්වමින් යුද්ධ හමුදාවට සහ සියලුම යුද්ධ හමුදා හටපිරිස් වෙත ආශිර්වාද එක්කිරීම ආදී අංග රැසක් සංවත්සර සැමරුමට එක්ව තිබිණ. තවද, සංවත්සර දිනයේදී සේනාංකාධිපති වෙත 1 ගැමුණු හේවා බලකායේ හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය ද පුද කළහ. එසේම, සේනාංකය යටතේ ස්ථාපිත බලසේනා, ඒකකවල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද පැවැත්විණි.

# සංවත්සර දිනයේ මතක සටහන්





561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ජී බංඩාරනායක යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ එම පාබල බලසේනාවේ 14 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් 07 වන දින කනගරායන්කුලම් කඳවුරේදී පැවැත්විණ. එහිදී, නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා දක්ෂතා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් වොලිබෝල් සහ ක්‍රිකට් තරගාවලියක් හා ලේ දන්දීමේ වැඩසටහනක් ද පැවැත්විණ. තවද, බලසේනාධිපති වෙනුවෙන් පැවැත්වූ කඳවුරු සම්මාන මුරය, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, රාත්‍රී භෝජන සංග්‍රහය සහ සංගීත ප්‍රසංගය ද සංවත්සර දිනයේ වැඩසටහන් අතර කැපී පෙනුණි.





14 විජයබාහු පාබල රෙජිමේන්තුවේ අභිමානවත් 16 වන සංවත්සර සැමරුම ඉකුත් ජනවාරි 06 වන දිනට යෙදී තිබිණ. ඊට සමගාමීව යුද්ධ හමුදා සම්ප්‍රදායට අනුව වැඩසටහන් මාලාවක් එම ඒකක අණදෙන නිලධාරී මේජර් එස්ජේජීජේකේ සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 05 සහ 06 යන දිනයන් හිදී පැවැත්විණ. ඒකකයේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී රට දැය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිපත් කරමින් සර්ව රාත්‍රික ධර්ම දේශනාවක් හා සංඝයා වහන්සේලා උදෙසා දහවල් දානය පූජා කිරීම ඇතුළු ආගමික වතාවත් සංවත්සර දින කැපී පෙනුණි.





මින්නේරිය කාලතුවක්කු හමුදා සංකීර්ණයේ ස්ථාපිත ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු (කාලතුවක්කු) බලඇණියේ 11 වන ඒකක සංවත්සරය ඉකුත් ජනවාරි 03 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී මේජර් ඒඑම්වීඒ අත්තනායක එල්එස්සී ගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත් පෙරදැරිව අභිමානවත් සැමරුම් උත්සවයක් පැවැත්වූයේ එහි සියලු නිලයින්ගේ සහභාගීත්වයෙනි.

# ඔරු පැදීමේ තරඟාවලියක්





68 වන පාබල සේනාංකයේ හටපිරිස්හි ක්‍රීඩාශීලීත්වය, සුහදතාවය වර්ධනය කිරීම හා විනෝදාස්වාදය වෙනුවෙන් 593 සහ 681 වන පාබල බලසේනා මගින් සංවිධානය කළ ඔරු පැදීමේ තරඟාවලියක් ඉකුත් ජනවාරි 23 වන දින පුදුමාතලන් කලපුවේදී පැවැත්විණ. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම තරඟාවලියට ඒක පුද්ගල, ද්විත්ව, ත්‍රිත්ව සහ ප්‍රදර්ශන යන ඉසව් යටතේ ක්‍රීඩකයෝ තරඟ වැදුනහ. එහිදී, 68 පාබල සේනාංකය ඒක පුද්ගල ඉසව්වෙහි ද, 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව ද්විත්ව ඉසව්වෙහි ද, 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව ත්‍රිත්ව ඉසව්වෙහි ද, ජයග්‍රහණ හිමිකරගැනීමට සමත් විය. ඔරු පැදීමේ තරඟය බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මරදමඩුකුලම් වැවේ දේශීය ධීවර සමිතිය විසින් ඔරු සහ හබල් ප්‍රදානය කරමින් තරඟය සාර්ථක කරගැනීම සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබාදීම විශේෂත්වයකි. හමුදා සාමාජිකයින් සහ සිවිල් වැසියන් විශාල පිරිසක් මෙම අකර්ශණීය අවස්ථාවට සහභාගී වූහ.

# *Dinner's Club* වැඩසටහනක්





21 වන පාබල සේනාංකයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු "ආරක්‍ෂාව සබැඳිව මුහුණ පෑමට සිදුවන අභියෝග පිළිබඳ දේශනයක්" (**Contemporary Security Challengers to the Globe**) ඉකුත් දෙසැම්බර් 11 වන දින එම පාබල සේනාංක නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් අයිඒඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුහද ඇරයුමෙන් මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න (විශ්‍රාමික) විසින් එම දේශනය මෙහෙය වන ලදී.

# මහරගම "අපේක්ෂා" රෝහලේ රෝගීන් සඳහා දිවා ආහාර වේලක්



රට වෙනුවෙන් දිවිපිදූ 14 විජයබාහු පාබල රෙජිමේන්තු සාමාජිකයින් වෙත උපහාර පිදීමේ අරමුණින් එම ඒකක හටපිරිස් සමාජ සත්කාරයකට උරදුන්හ. ඒ අනුව ඉකුත් දෙසැම්බර් මස 27 වන දින මහරගම "අපේක්ෂා" රෝහලේ රෝගීන් සඳහා දිවා අහාර වේලක් ලබාදීමට කටයුතු කෙරිණ. මේ සඳහා එම ඒකක නිලධාරීහු සහ සෙසු නිලයෝ රැසක් සහභාගී වූහ.

# පාසල් සිසුවියන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක්





අම්පාර බණ්ඩාරනායක බාලිකා විද්‍යාලයේ සහ දමන මහා විද්‍යාලයේ ගුරුභවතුන්ගේ ඉල්ලීමකට අනුව 24 වන පාබල සේනාංකයේ හටපිරිස් විසින් එම පාසල්වල සිසුවියන් 90 දෙනකු සඳහා නායකත්ව පුහුණු වැඩමුළුවක් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින පවත්වන ලදී. පන්තිකාමර විෂය මාලාවට අමතරව මූලික නායකත්ව ගුණාංග සහ වගකීම් සහිත පුරවැසියන් බිහිකිරීම අරමුණු කරගමින් එහි සේනාංකාධිපති විසින් සැලසුම් කරන ලද මෙම වැඩසටහනට ආචාර විධි, තීරණ ගැනීම, කළමනාකාරිත්වය, විනය පවත්වාගැනීම, ආත්ම විශ්වාසය, ගරුත්වය, ඵලදායිතාවය , ඉවසීම, සමාජානුයෝජනය, සන්නිවේදනය ආදී කුසලතාවන් ප්‍රගුණ කිරීම සම්බන්ධයෙන් දැනුම ලබාදෙන ලදී. මේ සඳහා සහභාගී වූ සිසුන් අතර, රුක් රෝපණ පුරුදු ඉහළ නැංවීමේ අරමුණින් 24 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් මී පැළ 90 ක් ද බෙදාදෙන ලදී. තවද, වැඩමුළුවට සහභාගී වූ ගුරුවරුන්, පාසල් සිසු සිසුවියන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් ද පැවැත්විණි.

# නව නිලධාරී නිවස්නය විවෘත කෙරේ





දඹින්න යුද්ධ හමුදා කඳවුරෙහි ස්ථාපිත 12 වන ගැමුණු හේවා බලකායේ පැරණි ගොඩනැගිල්ලක පිහිටා තිබූ නිලධාරී නිවස්නය ප්‍රතිසංස්කරණය කර විවෘත කිරීම ඉකුත් ජනවාරි 01 වන දිනට යෙදුණු සුබ මොහොතින් එහි අණදෙන නිලධාරී මේජර් ජීඑස් රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් සිදුවිය. අණදෙන නිලධාරීගේ අදහසකට අනුව ප්‍රාදේශීයව සපයාගත් අමුද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් ඉදිකරන ලද මෙම නිලධාරී නිවස්නය සඳහා එහි සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වය හිමිවිය.

# හරවත් දේශනයක්

21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් අයිඒඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ "ළමා අපචාර සහ පවුල් ආරවුල් සමතයකට පත්කිරීමේ ක්‍රමය" යන මැයෙන් දේශනයක් ඉකුත් දෙසැම්බර් 21 වන දින 21 වන පාබල සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ. අමාත්‍ය ආරක්ෂක කොට්ඨාසයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විෂයභාර උප පොලිස් පරීක්ෂක සුනිල් රත්නායක මහතා විසින් මෙම දේශනය මෙහෙය වූ අතර, ඒ සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් 175 කට අධික පිරිසක් සහභාගී වූහ.



# බළඇණි පුහුණු පාඨමාලාව ආරම්භ කරමින්





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ 11 වන රෙජිමේන්තුවේ පාබල බළඇණි පුහුණු පාඨමාලාව ඉකුත් ජනවාරි 17 වන දින ආලංකුලම පිහිටි පාබල බළඇණි පුහුණු පාසලේදී ඇරඹිණ. 54 වන පාබල සේනාංකයේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන එම පාඨමාලාවට නිලධාරීන් 12 ක් සහ සෙසුනිලයෝ 311 දෙනෙක් සහභාගී වූහ. එහි ආරම්භක අවස්ථාවට ප්‍රධාන අමුත්තා වශයෙන් 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. මෙම අවස්ථාවට 543 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, බළඇණි පුහුණු පාසලේ සේනාවිධායක ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක - 74







2023 නොවැම්බර් 20 වන දින ආරම්භ කරන ලද "විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක - 74" හි විසිරයාමේ පෙළපාලිය සහ පාඨමාලා නිල ලාංඡන පැළඳවීමේ උත්සවය අධ්‍යක්ෂ ජෙනරාල් පාබල මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 15 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ.

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් 24 දෙනෙක් සහ සෙසුනිලයන් 155 දෙනකු සහභාගී වූ අතර, එය පුරා මාස 06 ක කාලසීමාවක් පැවැත්විණ. අධියර 07 කින් සමන්විත මෙම පාඨමාලාවේ විශේෂ දක්ෂතා පෑ නිලධාරීන් සහ සෙසුනිලයින් හට ප්‍රධාන අමුත්තාගේ සුරතින් කුසලාන සහ සහතිකපත්‍ර හිමිගන්වන ලදී. පාඨමාලාවේ හොඳම වෙඩික්කරු ලෙස 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් කපිතාන් එන්ඩී රාජපක්ෂ ද දක්ෂතම නිලධාරී ලෙස 18 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් ලුතිනන් එන්එම්එස්එච් නිකලංසූරිය ද හොඳම ශාරීරික යෝග්‍යතාවය වෙනුවෙන් 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ලා/කෝ වීරසිංහ ඩබ්ලිව්එම්එල්යූකේ ද දක්ෂතම සෙබළා ලෙස 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් ගංගනාත් එස්ජේකේටී ද සම්මාන හිමිකරගත්හ. හොඳම පෙළට හිමි සම්මානය දිනාගන්නා ලද්දේ 5 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසිනි.

# "විගණන නිරීක්ෂණ අවමකර ගැනීම" සැබැඳි දේශනයක්







යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත විගණන නිරීක්ෂණ අවම කරගැනීම අරමුණු කරගෙන එම විෂයන් සබැඳිව ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරි නියුතු භටපිරිස් දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 24 වන දින පනාගොඩ යුද්ධ හමුදා ශාස්ත්‍ර ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහිදී, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ මේජර් ඩබ්ලිව්ජීජේඑම්ඩීඑස් ජයසිංහ සහ ලුතිනන් එච්පීආර් රණසිංහ විසින් දේශනය මෙහෙය වූ අතර, මේ සඳහා නිලධාරීන් 53 දෙනෙක් සහ සෙසුනිලයෝ 354 දෙනෙක් සහභාගී වූහ.

# "යුද සාහිත්‍යය" සහ "නිර්භීත සොල්දාදුවන්" මැයෙන් දේශන පෙළක්





පල්ලෙකැලේ ස්ථාපිත 11 වන පාබල සේනාංක මූලස්ථානය හා එම සේනාංකයට අයත් ඒකකයන්හි සේවයේ නියුතු භටපිරිස්වල චිත්ත ධෛර්යය වර්ධනය කිරීම සඳහා වූ දේශන පෙළක් එම සේනාංක මූලස්ථාන පරිශ්‍රයේදී ඉකුත් ජනවාරි 17 වන දින පැවැත්විණ. එහිදී, ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරි නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් යුද සමයේ අත්දැකීම් සහ සත්‍ය සිදුවීම් පිළිබඳ මතකාවර්ජනය කරමින් "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" යන මැයෙන් ද, 1 විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ටීපීජීකේපී ද අල්විස් ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් "වික්‍රමාන්විත සොල්දාදුවා" යන මැයෙන් ද දේශන පැවැත්වූහ.

11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත සහ ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන පවත්වනු ලැබූ අතර, ඒ සඳහා නිලධාරීන් සහ සෙසුනිලයන් 150 දෙනෙක් සහභාගී වූහ. එසේම, තවත් 400 දෙනෙක් පමණ *ZOOM* තාක්ෂණය ඔස්සේ ද ඊට සම්බන්ධ වූහ.

# ‘සීගල්’ යුද අභ්‍යාසය - 2024










ත්‍රිවිධ හමුදා භටපිරිස්වල සහභාගීත්වයෙන් යාපනය අර්ධද්වීපයේ උතුරු මුහුදු ප්‍රදේශයේ පලතිව් දූපතේදී ජනවාරි මස 08 දින සිට 11 දින දක්වා "සීගල්" යුද අභ්‍යාසය පැවැත්විණි. මෙමගින් ක්‍රියාන්විත කාර්ය සාධක බලකායක් නිර්මාණය කිරීම, වෙරළ තීරයේ ආරක්ෂාව තරකිරීම සඳහා භටපිරිස් යෙදවීම, නාවික යාත්‍රාවලින් පැමිණෙන භටපිරිස් ස්ථානගත කිරීම, සතුරු පාර්ශ්වය අඩපණ කිරීම, ප්‍රාණ ඇපකරුවන් මුදවා ගැනීම, තුවාලකරුවන් ඉවත් කිරීම සහ ආපදා සහන සේවා සැපයීම ආදී කටයුතු සඳහා භටපිරිස් පුහුණු කිරීම සිදුකෙරිණ. මෙම අභ්‍යාසය සඳහා යුද්ධ හමුදාවේ නිලධාරීන් 42 ක්, සෙසු නිලයින් 360 ක්, නාවික හමුදාවේ නිලධාරීන් 62 ක්, සෙසු නිලයින් 618 ක්, ගුවන් හමුදාවේ නිලධාරීන් 03 ක් සහ සෙසු නිලයින් 09 ක් සහභාගී වූහ.

අවසන් යුද අභ්‍යාසය ඉකුත් ජනවාරි 12 වන දින පැවති අතර, එය නිරීක්ෂණය සඳහා 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී, උතුරු නාවික විධානයේ ආඥාපති රියර් අද්මිරාල් ටීඑම්ජේ තෙන්නකෝන් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී එන්ඩියූ ඇතුළු නිලධාරීන් සහ සෙබළ විශාල පිරිසක් ද සහභාගී වූහ.



# යාපනයේ විනෝද සංචාරයක





68 වන පාබල සේනාංකයේ භටපිරිස් ඉකුත් දෙසැම්බර් 30 සහ 31 යන දිනයන්හි යාපනය අර්ධද්වීපයේ විනෝද චාරිකාවක නිරතවූහ. මේ සඳහා නිලධාරීන් 04 දෙනක්, සෙසුනිලයෝ 35 දෙනක් සහ සිවිල් සේවක මහතුන් 03 දෙනෙක් සහභාගී වූහ. මෙම සංචාරයේදී සක්කොටෙයි කීරමලෙයි පොකුණ, දඹකොළ පටුන, සංඝමිත්තා විහාරය, කදුරුගොඩ පුරාණ විහාරය, පතුල නැති ළිඳ, නල්ලූර් කන්දස්වාමි කෝවිල, යාපනයේ පුස්තකාලය, යාපනය කොටුව, නාගදීප පුරාණ විහාරය, ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ස්මාරකය, සංගුපිඩ්ඩි පාලම සහ පුනරින් කොටුව යන ස්ථාන නැරඹීමේ අවස්ථාව ඔවුනට උදාවිය.

# විදුලි කෝෂ පරිත්‍යාගක්






58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ගිරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත "අඳුරෙන් එළියට" විදුලි කෝෂ පරිත්‍යාග වැඩසටහන යටතේ පුත්තලම, සින්නවිල්ලුවත්ත ප්‍රදේශයේ වෙසෙන පවුල් 65 ක් වෙනුවෙන් සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි පහන් ලබාදීමේ ප්‍රජාසත්කාරයක් ඉකුත් දෙසැම්බර් 29 වන දින සිදුකෙරිණ. මෙමගින් විදුලිය නොමැති නිවාස හිමි අධ්‍යාපන කටයුතුවල නිරත සිසු සිසුවියන් සිටින පවුල් වෙනුවෙන් ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. වික්ටෝරියා සහ නිව් සවුත් වේල්ස් ප්‍රදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික පරිත්‍යාගශීලීන් පිරිසක් මෙම වැඩසටහන සඳහා සිය අනුග්‍රාහකත්වය ලබාදී තිබේ. එම පිරිස නියෝජනය කරමින් පරාක්‍රම ගිරියාගම මහතා සහ මේජර් අරුණ පෙරේරා (විශ්‍රාමික) මෙම වැඩසටහනට සහභාගී වූහ.

# හිසට සෙවණක්



221, 222 සහ 223 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශ තුළ ජීවත් වන අවශ්‍යතා ඇති පවුල් තුනක් වෙනුවෙන් නව නිවාස තුනක් ඉදිකිරීම සඳහා ඉකුත් ජනවාරි 11, 12 සහ 15 යන දිනයන් හිදී ආගමික චාරිත්‍රානුකූලව මුල්ගල් තැබීමේ උත්සව පැවැත්විණ. ඒ අනුව තල්ගස්වැව, අග්බෝපුර පදිංචි ආර්.එම්. රංජිත් වසන්ත බණ්ඩාර, 10 සැතපුම් කණුව, කිතුල්විටු, මොරවැව ලිපිනයේ පදිංචි ජී.ආර්. චමින්ද කුමාර සහ මහසෙන්පුර, 07 කණුව ලිපිනයේ පදිංචි කේ. උපුල් ප්‍රියන්ත යන අය වෙත එලෙස නිවාස ඉදිකරදීමට නියමිතය. 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම සහ සම්බන්ධීකරණය යටතේ අනුරාධ කොතලාවල සහ ඉසුරු ප්‍රභාත් කුමාර යන මහත්වරු ඊට මූල්‍ය අනුග්‍රහකත්ව සපයනු ලබති.



# සුබ මොහොතින් නව වසරේ රාජකාරී අරඹයි



2024 වසරේ රාජකාරී ආරම්භ කරමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකක කාර්යාලයේදී එහි සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් තේපැන් සංග්‍රහයක් පැවැත්විණ. මේ සඳහා එම ඒකක කාර්යාල හමුදා සාමාජික සාමාජිකාවෝ සහ සිවිල් සේවකයෝද සහභාගී වූහ. එහිදී, ඔවුන් වෙත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.

# වියළි ආහාර සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් වියළි ආහාර සලාක පාර්සල් 200 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 16 වන දින එම රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. එම උත්සවය සඳහා යුද්ධ හමුදා විධායක ජෙනරාල්, යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.



# ගුරු පුහුණු වැඩමුළුවක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ අධීක්ෂණය යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි පවත්වා ගෙන යනු ලබන විරු කැකුළු පෙර පාසල්වල රාජකාරී නියුතු නිලධාරීන් හා ගුරුවරියන් සඳහා වූ ගුරු පුහුණු වැඩමුළුවක් ඉකුත් ජනවාරි මස 01 වන දින පැවැත්විණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී දියත් කෙරුණු මෙම වැඩමුළුව සඳහා නිලධාරීහු සහ සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.

මෙම ගුරු පුහුණු වැඩමුළුවේ ප්‍රධාන ආරාධිත දේශනය Eco - V ආරම්භක සභාපති මෙන්ම ඕස්ට්‍රේලියාවේ දේශගුණය, යුක්තිය සඳහා වූ චාරිකා හා ඉන්දියාවේ Edible Routers පදනමේ සම නිර්මාතෘවරිය වන කාංචනා දිල්රුක්ෂි කුමාරි වීරකෝන් මහත්මිය විසින් පවත්වනු ලැබුවාය. දැනුම, කුසලතා සහ ආකල්පවලින් පරිපූර්ණ කිරීම වෙනුවෙන් ගුරුවරියන් හැඩගැස්වීම මෙන්ම ඔවුන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීම, දැනුම යාවත්කාලීන කිරීම හා නව දැනුම බෙදාදීම එමගින් අරමුණ විය.

# "අභිමංසල - 1" සුවතා නිකේතනයේ සංචාරයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ඉකුත් ජනවාරි 18 වන දින අනුරාධපුර ස්ථාපිත අභිමංසල 1 සුවතා නිකේතනයේ සංචාරයක නිරත වූවාය. එහිදී, එතුමිය නේවාසික රණවිරුවන් සමඟ සුහද පිළිසඳරක නිරත වෙමින් ඔවුන්ගේ සුවදුක් විමසා බැලූ අතර, ඔවුන් වෙත ත්‍යාග පාර්සල් ද පරිත්‍යාග කරනු ලැබුවාය.

ජල ප්‍රතිකාර සඳහා යොදාගන්නා රණවිරු පිහිනුම් තටාකය නඩත්තු කිරීමට අත්‍යවශ්‍ය පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සුවතා නිකේතනය වෙත පරිත්‍යාග කිරීම ද එහිදී එතුමියගේ සුරතින් සිදුවිය. තවද, නේවාසික රණවිරුවන්ගේ අත්කම් නිර්මාණ ද ඇගයීමට ලක්කළ සභාපතිනිය, එම පරිශ්‍රයේ ස්ථාපිත ආයුර්වේද රෝහලේ ද නිරීක්ෂණයක නිරත වූවාය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.

# Gunners Super
## ව්‍යාපෘතිය විවෘත වූ වගයි





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් හබරකඩ ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ Gunners Super වෙළඳසැල එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ස්වෙන්දිනි රොද්‍රිගෝ මහත්මියගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ සුරතින් පසුගිය ජනවාරි 20 වන දින විවෘත කරනු ලැබුවාය.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී ද සහභාගී වූ අතර, කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් ද එම අවස්ථාවට එක්වූහ.

# "Seva Vanitha Budget Center" හි සංචාරයක





යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා මැනිංවුන් Seva Vanitha Budget Center හි පවත්වාගෙන යනු ලබන කාන්තා රූපලාවන්‍යාගාරයෙහි වත්මන් තත්ත්වය පිළිබඳ සොයාබැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය පසුගිය ජනවාරි මස 29 වන දින එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය.

# 2024 වර්ෂයේ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ප්‍රථම මාසික රැස්වීම



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මාසික රැස්වීම ඉකුත් ජනවාරි 10 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන්, විධායක මණ්ඩල සාමාජිකාවන් සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ එම රැස්වීම අවසානයේ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් නිවාස ඉදිකරමින් පවතින හමුදා සාමාජිකයන් තිදෙනකු වෙත රුපියල් 600,000.00 ක්, 500,000.00 ක් සහ 450,000.00 බැගින් වූ මූල්‍ය පරිත්‍යාග ද සිදුකරනු ලැබීය. එමෙන්ම, මානුෂීය මෙහෙයුමේදී ප්‍රහාරයකට ලක්ව ශ්‍රවණාබාධ වූ සෙබළකුට ශ්‍රවණ උපකරණයක් පරිත්‍යාග කිරීම ද තවත් සෙබළ බිරිඳකගේ ආබාධිත පියා වෙත රෝද පුටුවක් මිලදී ගැනීම සඳහා රුපියල් 42,000.00 ක මූල්‍ය පරිත්‍යාගය ද මෙහිදී සිදුකෙරිණ. තවද, මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උත්පලා හෙට්ටිආරච්චි මහත්මිය යුද්ධ හමුදා සේවා වනිතා අරමුදලට මූල්‍ය පරිත්‍යාගයක් සිදුකරනු ලැබුවාය.

# අකුරු කරන පුතුනට මිතුරු සත්කාරයක්






කැලේ පිපුණු මල් කැලේට පරවී යා නොදී රැකබලා ගැනීමේ උදාර අරමුණ පෙරදැරිව *Industrial Safety Equipment (Pvt) Ltd* මගින් ක්‍රියාත්මක කළ අකුරට සවියක් හෙට දිනන පොඩිත්තන්ට වැඩසටහන යටතේ වව්නියාව මහාමයිකුලම් ප්‍රාථමික විද්‍යාලයේ දරු දැරියන් හට පාසල් උපකරණ සහ දිවා ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 19 වන දින එම පාසලේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මඟපෙන්වීමෙන් 56 වන පාබල සේනාංකය මගින් සංවිධානය කළ මෙම වැඩසටහනට *Industrial Safety Equipment (Pvt) Ltd* ආයතනය අනුග්‍රාහකත්වය දැක්විය.

යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා ඒකකයේ සියලුම ව්‍යාපෘති අධීක්ෂණ ජ්‍යේෂ්ඨ සාමාජිකා මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මිය, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, *Industrial Safety Equipment (Pvt) Ltd* පුද්ගලික සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ සාලිය ගුණසේකර මහතා ඇතුළු පිරිසක් එක්වූහ.

# මාහැඟි පරිත්‍යාගයක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මූලිකත්වයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) සහ ඒ යටතේ ස්ථාපිත ඒකකයන්හි සේවයේ නියුතු යුද්ධ හමුදා සහ සිවිල් සේවක මහතුන් සඳහා වියළි ආහාර සලාක පාර්සල් 100 බෙදාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 19 වන දින එම ආරක්ෂක සේනා මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

මෙම පරිත්‍යාගයන් සඳහා "*Industrial Safety Equipment*" පුද්ගලික ආයතනය වෙතින් අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මෙම උත්සව අවස්ථාවට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවන්, නිලධාරීන්, අනුග්‍රාහකත්වය ලබාදුන් එම ආයතනයෙහි කාර්ය මණ්ඩලය සහ සෙසු නිලයෝ පිරිසක් ද සහභාගී වූහ.





# අභිමංසල II සුවසහන නිකේතනයට සත්කාරයක්





ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කායදානය ලබාදී රණඝෂිතයට පත්ව කඹුරුපිටිය අභිමංසල II සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය ජනවාරි 29 වන දින සංචාරයක නිරත වූවාය. මෙම අවස්ථාව සඳහා 61 වන පාබල සේනාංකයෙහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී ඇතුළු පිරිසක් ද එක්වූහ.

එහිදී, සභාපතිනිය එම රණවිරුවන්ගේ නේවාසික වාට්ටු වෙත ගොස් ඔවුන් සමග සුහද කතාබහක ද නිරත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතා, පවුලේ සාමාජිකයින්ගේ පවතින ගැටලු පිළිබඳව සොයා බැලීය. තවද, ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය ඉහළ නැංවීම හා චිකිත්සක ප්‍රතිකාරවල ප්‍රගතිය පිළිබඳව ද විමසුවාය. එහිදී, එම රණවිරුවන් සඳහා දිවා භෝජනය ද පිළිගැන්වීය. මෙම සංචාරය සනිටුහන් කිරීම සඳහා එම රණවිරුවන් වෙත ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ. එසේම, එම සුවසහන නිකේතනයේ අත්‍යවශ්‍යව තිබූ ජල චිකිත්සාව උදෙසා භාවිත කරනු ලබන පිහිණුම් තටාකය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ජල පිරිපහදු ද්‍රව්‍ය හා උපාංග ද සභාපතිනියගේ සුරතින් එහිදී පරිත්‍යාග කෙරිණ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ මිහිඳු සෙත් මැදුරේ සංචාරයක



කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ස්වෙන්දිනි රොද්‍රිගෝ මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් ජනවාරි 10 වන දින අත්තිඩිය මිහිඳු සෙත් මැදුරෙහි නේවාසික ප්‍රතිකාර ගනු ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා එක්වූහ. තවද, මෙම අවස්ථාවට එම රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ද එක්වූහ.



# පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ 13 වන සභාපතිනිය ලෙස වජීරා පෙරේරා මහත්මිය ඉකුත් ජනවාරි 16 වන දින එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිය ධුරයේ රාජකාරි කටයුතු ඇරඹුවාය.

## සුබ මොහොතින් රාජකාරී අරඹමින්



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස තෙල්කා නානායක්කාර මහත්මිය ඉකුත් ජනවාරි 01 වන දින සුබ මොහොතින් රාජකාරී ඇරඹුවාය.

## ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ අදහසකට අනුව එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් සහ පරිත්‍යාගයෙන් ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී නියුතු සිවිල් සේවක මහතුන් 50 දෙනකු සඳහා වියලි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 20 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

## යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවෙන් මාහැඟි පරිත්‍යාගයක්





යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් සෙසුනිලයින්ගේ 2023 ශිෂ්‍යත්ව විභාගය සමත් දරු දැරියන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 29 වන දින පැවැත්විණ. තවද, මාලි රාජ්‍යයේ රාජකාරී කරමින් සිටියදී ආබාධිත තත්ත්වයට පත් වූ මා/සැරයන් ඒකනායක ඊජී යන ජ්‍යෙකොනොමි හට රුපියල් ලක්ෂ 20 කට ආසන්න වටිනාකමක් ඇති විදුලි රෝද පුටුවක් පරිත්‍යාග කිරීමද එහිදී සිදුවිය. එම අවස්ථාවට යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මිය ඇතුලු පිරිසක් සහභාගී වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සාමාජිකාවෝ අභිමංසලෙහි සංචාරයක



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දිලූපා පීරිස් මහත්මිය ඇතුළු එහි සාමාජිකාවෝ පිරිසක් ඉකුත් ජනවාරි 17 වන දින කඹුරුපිටිය අභිමංසල 2 සුවසහන නිකේතනයේ නේවාසිකව වෙසෙන රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා සංචාරයක නිරත වූහ. එහිදී, එම රණවිරුවන් හට කෙටි ආහාර වේලක් ද ලබාදෙන ලදී.

# අකුරු කරන දූ දරුවන්ට ඉංජිනේරු සේවා බලකා සේවා වනිතාවෙන් අතහිත

ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුරංගි අමරපාල මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තුවේ රාජකාරියෙහි නියුතු හමුදා සහ සිවිල් සේවක මහතුන්ගේ, දූදරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පිටුවහලක් වීමේ අරමුණින් වැඩසටහනක් සංවිධානය කරන ලදී. ඉකුත් ජනවාරි 15 වන දින පැවති එම උත්සවයේදී සභාපතිනිය විසින් 12 (ස්වේච්ඡා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ රාජකාරියෙහි නියුතු සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කරන ලදී.



එම වැඩසටහනට සමගාමීව අක්ෂි පිළිකාවකින් පෙළෙන කොමිෂන් නොලත් නිලධාරියකුගේ දියණියක වෙත *MRI* ස්කෑන් පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය රුපියල් 100,000/- ක මුදලක් ද පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# රණවිරුවන් හට සෙත්පතා බෝධිපූජා පිංකමක්





දිවංගත, රණඝිතයට පත් සහ සේවයේ නියුතු රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු රටවැසියන්ට ආශිර්වාද එක්කරමින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් විශේෂ පිංකමක් ඉකුත් ජනවාරි 19 වන දින පනාගොඩ ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේදී පවත්වනු ලැබීය. මෙම අවස්ථාවට සමගාමීව එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ සුරතින් පිංකම සඳහා සහභාගී වූ 1 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සාමාජිකයන් සහ ඔවුන්ගේ භාර්යාවන් වෙත සුදු රෙදි පිරිනැමීමට ද කටයුතු කරනු ලැබුවාය.

# සේවා බලකා සේවා වනිතා ශාඛාව



1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය යටතේ රාජකාරී නියුතු ඩීඑස් රෝහණ යන සිවිල් සේවක මහතාගේ විශේෂ අවශ්‍යතා සහිත වයස අවුරුදු 17 ක් වන දියණිය වෙනුවෙන් ඉදිකරන ලද අංගසම්පූර්ණ නාන කාමරයක් ඉකුත් දෙසැම්බර් 29 වන දින භාරදෙනු ලැබීය. සේවා බලකා සේවා වනිතා ශාඛාවේ ලේකම් තුමිය වන නිරෝමා විතානගේ මහත්මියගේ මූලික අනුග්‍රාහකත්වය මත මෙම මාහැඟි කටයුත්ත සිදුකෙරිණ.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවෙන් නත්තල් කැරොල් ගී ප්‍රසංගයක්





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රහයෙන් සංවිධානය කෙරුණු නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් එම බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් පීජීසී ප්‍රනාන්දු යූඑස්පී හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය ඒ නිල්මිණි ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2023 දෙසැම්බර් මස 18 වන දින යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. එහි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන සියලුම අයවලුන් හට මෙම නත්තල් ගී රස විඳීමට ද අවස්ථාව සලසා තිබූ අතර, එම රෝගීන් වෙනුවෙන් තිළිණ ප්‍රදානය කිරීමට ද කටයුතු කෙරිණ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා රෝහල් අධ්‍යක්ෂ ඇතුළු වෛද්‍ය බලකා සේවා වනිතා සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව





ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති (උතුර) හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඑට්ඕ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මියගේ මගපෙන්වීම මත එම සේවා වනිතා ශාඛාව වෙතින් හොරණ, ගල්පාත පිහිටි "සුබිත" ආබාධිත ළමා නිවාසයේ ළමුන් වෙනුවෙන් පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය. ඉකුත් ජනවාරි 07 වන දින පැවැත්වූ මෙම වැඩසටහන මගින් එම ළමයින්ට ප්‍රණීත දිවා භෝජන සංග්‍රහයක් ලබාදී විනෝදාස්වාද වැඩසටහනක් පවත්වා ත්‍යාග පාර්සල් පිරිනැමීමට ද කටයුතු කරන ලදී. මලින්දා ගුණවර්ධන, විශ්‍රාමික කර්නල් උපුල් ගුණවර්ධන යන මහත්ම මහත්මීන්ගේ පවුලේ සාමාජිකයෝ "සුබිත" ආබාධිත ළමා නිවාසයේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කළ ත්‍යාග සහ වියළි ආහාර සලාක වෙනුවෙන් අනුග්‍රාහකත්වය ලබාදුන්හ.

## කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවෙන් ඉගෙනුමට අත්වැලක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායට අයත් සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 05 වන දින එම බලකා ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එම බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේපීඑස්පී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී කේඑස්පී එන්ඩියූ සහ එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශෙහානි ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ 2(සේව) කෘෂි හා පශු සම්පත් බලකායට අයත් සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දූ දරුවන් 23 දෙනකු සහ 5 වසර ශිෂ්‍යත්වය සමත් දූ දරුවන් තිදෙනකු සඳහා පාසල් උපකරණ බෙදාදෙනු ලැබීය.

## පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව නත්තල සමරයි





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියන්තිකා ද සොයිසා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය දෙසැම්බර් මස 29 වන දින එම රෙජිමේන්තු මූලස්ථානයේදී නත්තල් කැරොල් ගීතිකා ප්‍රසංගයක් පැවැත්විණ. නාරාහේන්පිට ශාන්ත තෙරේසා දේවස්ථානයේ කැරොල් ගීතිකා කණ්ඩායම, යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සාමාජිකයින් එම බලකායේ සංගීත කණ්ඩායම සමග එක්ව මෙම කැරොල් ගීතිකා ප්‍රසංගය පවත්වනු ලැබූහ. මෙම උත්සව අවස්ථාවට සමගාමීව පාසල් ළමුන් 36 දෙනකු වෙනුවෙන් පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි. එහිදී, සභාපතිනිය විසින් සංකේතාත්මකව පාසල් ළමුන් 15 දෙනකු වෙත පොත් බෙදාදුන් අතර, සහභාගී වූ අනෙකුත් ළමුන්ට නත්තල් තෑගි සහ රසකැවිලි ද ප්‍රදානය කෙරිණි. උත්සව අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විනයාරක්ෂාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී, එම බලකා සේවා වනිතා සාමාජිකාවන් සහ ක්‍රිස්තියානි බැතිමතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

## "කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටළු" මැයෙන් හරවත් දේශනයක්






ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ඉකුත් ජනවාරි 10 වන දින කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී "කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටලු" මැයෙන් අධ්‍යාපනික සැසියක් පැවැත්විය. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නයෝමි ගුණරත්න මහත්මියගේ ආරාධනයකට අනුව කොළඹ, ද සොයිසා මාතෘ රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය රුවන් සිල්වා (එම්බීබීඑස්, එම්ඩී) විසින් මෙම දේශනය පවත්වනු ලැබීය. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ, සෙසුනිලයන් විශාල පිරිසක් සහභාගී වූහ.



# බෞද්ධයා සතු සිතීමේ හා විමසීමේ නිදහස

මුළු ලෝකයේම දැනට විද්‍යාමානව ඇති සියලු ආගම් අතර බුදු දහමට අද්විතීය ස්ථානයක් හිමිකර දෙන කරුණු අතර සිතීමේ හා විමසීමේ නිදහස ප්‍රමුඛස්ථානයක් ගන්නා බව ඒ පිළිබඳව කරුණු විමසා බලන විට පෙනී යන්නකි. මේ කාරණය මෙසේ වුවද මිනිසා සතු විමසීමේ හා ඒ අනුව ක්‍රියා කිරීමේ නිදහස පිළිබඳ අදහස බුද්ධ කාලයට නැතිනම් බුද්ධාගමට පමණක්ම සීමා කිරීමටද පුළුවන්කමක් නැති බව භාරතීය ඉතිහාසය අපට පෙන්නුම් කර දෙයි. ඒ අනුව විමසන විට උතුරු ඉන්දියාවේ ජනාවාස පිහිටුවාගත් ආර්ය ජනතාව ස්වකීය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට උපකාරී වූ හිරු එළිය,වැස්ස,සුළග,ගින්න ආදී ස්වභාවික දේ දෙවියන් වශයෙන් සලකා ඒවාට වැඳුම් පිදුම් කළ අයුරුත් පසුව ස්වාභාවික දෙවිවරුන් අතර, ප්‍රධාන වූ ලෝකය පාලනය කරන්නාවූ බලවත් දෙවි කෙනෙක් ඇතැයි අදහස් කළ ඔහු ඒ බලවත් වූ එකම දෙවියා ගැන විශ්වාසය තැබූ අයුරුත් අපට "ඒකදේවවාදය" පිළිබඳ තොරතුරුවලින් දැනගත හැක. එපමණක්ද නොව මිනිසාගේ සිතීමේ විමසීමේ ක්‍රියා පටිපාටියට අපට වුවමනා නම් මින් ඔබ්බටද ගෙන යා හැකි බව වනචාරී ජීවිත ගත කළ මිනිසුන් එඬේර යුගයට පා තැබීම ආදී යුග ගැන සිතා බලන විට පෙනේ.

## බුද්ධිවාදය

තෙල කාරණය කෙසේ වෙතත් බුදු දහමින් බෞද්ධයින්ට සිතීමටත් විමසීමටත් පමණක් නොව ඒ අනුව ක්‍රියාකාරිවීමටත් ලබාදී ඇති නිදහසට සමාන නිදහසක් බුදුන් වහන්සේ ලොව පහළවීමට පෙර හෝ නැතිනම් ඉන් පසුව හෝ ඇති වූ ආගම ධර්මයකින් මිනිසාට ලබාදී නැති බව පෙනේ. මෑත යුගයේ පවා සමහර බටහිර චින්තකයින්ට සිතීමටත් විමසීමටත් ඒ අනුව ක්‍රියා කිරීමටත් යාමේදී තම ජීවිතය අනුව බලන කලද විද්‍යානුකූලව සෑම දෙයක්ම පරීක්ෂාවට භාජනය කිරීමත්, සමහරවිට අද විද්‍යානුකූල යැයි පිළිගත් දෙය හෙට වැරදි යැයි ඔප්පු වූ විට කලින් ගත් මතයෙහි එල්බ නොගෙන එය අතහැර දැමීමත් විද්‍යාවේ පදනම බව දැකිය හැකිය. ක්‍රි:පූ: 6 වන සියවසේදී බුද්ධිවාදයක් ලෙස ලොව පහළ වූ බුද්ධ ධර්මයෙහි පදනම සකස්ව හැඩ ගැසී ඇත්තේ ද විද්‍යාවට අනුගතව බව පෙනී යයි.

බුදු දහම පිළිගැනීම හෝ නොපිළිගැනීම යන දෙකින් එකක් තමන්ගේම නුවණින් විමසා බලා කළ යුතු බවත් බුදුන් වහන්සේගේ ඉගැන්වීම විය. එසේ නොවී පරම්පරාගතව පැවතෙන අදහසක් වශයෙන් හෝ ගුරුවරයා කී නිසා හෝ එසේත් නැතිව පොතක පතක ඇති සිද්ධාන්තයක් වශයෙන් හෝ පිළිගැනීම බුද්ධිවාදයක් වූ බුදුදහම බැහැර කරන ලද බවට හෙළිවේ. අතටගත් තෙල්ලි ගෙඩියක හෝ මැණිකක ස්වභාවය විශ්වාසයක් මත සිටීමෙන් නොව තමන්ගේම ඇස් දෙකෙන් දැකීමෙන්ද අතින් අතගා බැලීමෙන්ද අවබෝධයෙනුත් ප්‍රත්‍යක්ෂයෙනුත් දැන ගන්නාක් මෙන් බුද්ධ ධර්මයද ප්‍රත්‍යක්ෂය පදනම් කොට ඇති බව "ඒහි පස්සිකෝ" ඇවිත් බැලිය යුතුය. "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤෝහීති" නැණැතියන් විසින් තෙමේම පසක් කළ යුතු යයි තමාගේ නිදහස තමන්ටම පැවරූ මෙලොව එතෙක් පහළ වූ යම් ශාස්තෘවරයෙක් වේ නම් ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ බව මේ සාධකවලින් ඔප්පු වේ.

## උපාසකයා

"විමසීමෙන් තොර අන්ධ භක්තියෙන් යමක් විශ්වාස නොකළ යුතු බව තමන්ගේ අනුගාමිකයන්ට ඉගැන්වූ ලෝකයේ එකම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේය. ඒ නිසා "නවීනය කියා කිව හැකි එකම ලෝක ව්‍යාප්ත ආගම බුද්ධ ධර්මය බව කීම අතිශයෝක්තියක් නොවේ" යන එච්.ජී. වෙල්ස් නමැති විචාරකයාගේ ප්‍රකාශයෙන්ද ඉහත සඳහන් අදහස සනාථ වන බව පැහැදිලි වෙයි. මජ්ඣිම නිකායේ උපාලි ගෘහපතියා කර්මවාදය පිළිබඳව බුදුන් වහන්සේ හා වාද කොට ඉන් පරාජයට පත්ව තමා උපාසකයකු හැටියට පිළිගන්නා ලෙස බුදුන්ගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ "අනුවිච්ච කාරකො ගහපති කරොහි අනුවිච්ච කාරො, තුම්හා දිසානං ඤාත මනුස්සානං සාධු හොතීති ගෘහපතිය කල්පනාකොට බලා සරණ යෑම තොප වැනි ප්‍රසිද්ධ නායකයකුගේ ශ්‍රාවකයන්ට සුදුසුය යනුවෙනි උන්වහන්සේ වදාළේ.

## ආශිර්වාදය

බුදුරජාණන් වහන්සේ විසින් අනුදන්නා ලද සිතීමේ නිදහස වැනි දෙයක් ආගමික ඉතිහාසයෙහි අන් කිසි තැනෙක දක්නට නොලැබෙන බවත්, තමාම සත්‍යය අවබෝධ කර ගැනීමත් විනා කීකරු යහපත් ගතියට සැලකිල්ලක් හැටියට දෙවියකු විසින් පිරිනමනු ලබන දායාදමය ආශිර්වාදයක පිහිටෙන් මිනිසකුට දුකින් මිදිය නොහැකි බවත් එහෙයින් මේ නිදහස වුවමනාම බව බුදුරජාණන් වහන්සේගේ අදහස වූ බවත්, උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට නිදහස දුන්නේ හැම පුද්ගලයකුම තමා ගැන වගකිව යුතුය යන අදහසින් බවත් වල්පොල රාහුල හිමියෝ ප්‍රකාශ කරති.

අංගුත්තර නිකායේ එන කාලාම සූත්‍රයෙහිදී කොසොල් රට කෙසපුත්ත නම් නියම් ගම් වැසියන් සිතීමේ හා විමසීමේ අනුස්ස දක්වන තැනදී මා අනුස්ස වෙන, මා පරම්පරාය, මා ඉතිකරාය, මා පිටක සම්පදා නේන, මා තක්ක හේතු මානය හේතු ආදී වශයෙන් කරුණු ගෙන හැර දක්වමින් මා කියූ දෙය වාර්තාවකැයි කියා හෝ පරම්පරාගත පැවතෙන්නකැයි කියා හෝ පෙර කාලයේ දේශනා කරන ලද්දේකැයි කියා හෝ තමන්ගේ ගුරුවරයා පැවිදි වූවෙකැයි කියා හෝ නොපිළිගන්න. එය තමාගේත් අනුන්ගේත් යහපත පිණිස සැපත පිණිසවේ යැයි වැටහෙන්නේ නම් පිළිගන්න යනු උන්වහන්සේගේ දේශනාව විය.

තෙල දේශනාවල ගාම්භීරත්වය තේරුම් ගැනීමට නම් බුදුරජුන් වැඩ සිටි කාල පරිච්ඡේදය ගැන තරමක හෝ අවබෝධයක් තිබිය යුතුය. ඒ අනුව එදා සමාජය බ්‍රහ්මාණ්ඩය පරමාර්ථය කොටගත් නිර්මාණවාදී බ්‍රාහ්මණයෝ මහා බ්‍රහ්මයාගේ මුණයෙන් උපන්හ යයිද, එනිසාම ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර යන අය ඔවුන්ගේ අතවැස්සන් වීමට තරම්වත් නොසුදුසු යැයිද ශුද්‍රයකු ශුද්ධ වූ වේදපාඨ යම් හෙයකින් හදාළ හොත් ඔහුගේ දිව සිඳිය යුතු යයිද පවසමින් මුලු සමාජ ව්‍යුහයම බමුණු බලයට යට කර ගෙන සිටි අවධියක බුදුන් ලොව පහළ නොවුනි නම් ගෙදර සිට තනියම සිතනවාත් විමසනවාත් හැර ජනතාවට ඒ පිළිබඳව ප්‍රකාශ කරන්නට අද වැනි වකවානුවක ඉඩක් කෙසේවත් නොලැබෙන බව පසුගිය කාලච්ඡේදය තුළ ලංකාවේ සිදුවූ දේවලින් සනාථ වේ.

මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රයෙන්ද තමන් වහන්සේ ගැන පවා විමසා බැලිය යුතු බවත්, තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුද්ධද නැද්ද යන්න වටහා ගත හැක්කේ එවිටය යනුවෙන් දේශනා කිරීමෙන් තම ශ්‍රාවකයන් තුළ ජනිත විය හැකි සැකය දුරු කිරීමට උත්සාහ දරා ඇති අයුරු පසක් කරගත හැකිය.

> කසිප්පු වැනි දෙයින් මහ ජනතාව බේරා ගැනීමටත් රජයට යම් ආදායම් මාර්ගයක් ඇති කර ගැනීමටත් කැමති කෙනකුට පොල් ගස් දෙකක් මැද ගැනීමට අවසර දීමටත් යෝජනා කළ බව කවුරුත් දනිති. මෙය අවස්ථාවක් කරගත් අපේ සමහර අය ලංකාවෙන් බුද්ධාගම නැති කිරීමේ උපායක් හැටියට එදා එය දුටහ. නමුත් අද අපේ රටම සුරාවෙන් සූදුවෙන් මත් කුඩු වලින් හා නොයෙකුත් දූෂණයන්ගෙන් දුශ්චරිතයන් ගෙන් රට හොඳා පාලුවී තිබියදී එදා සිටියවුනට කුමක් සිදුවී තිබේදැයි කෙනකුට සිතෙනු බැරිය.

## බලලෝභීන්

එයට හේතුව සැකය තිබෙන තුරු අධ්‍යාත්මික දියුණුවේ උසස්ම ඵලය වන සත්‍යාවබෝධය ලබන්නටවත් කෙටියෙන්ම කියතොත් වර්තමාන සමාජ ව්‍යුහය තුළ අපට මිනිසුන් වශයෙන් ජීවත් වීමටත් හැකියාවක් නැත. විශ්වාස කිරීම සඳහා යම් යම් බල ලෝභීන් කියන කියුම්වලින් යමක සත්‍යය කිසිසේත්ම කිසිම කෙනකුට වටහා ගත නොහැකි වනු ඇත. ඉත්ථි ධුත්තො සුරා ධුත්තො අක්ඛ ධුත්තොච යොනරො ලද්ධං විනාසෙති. තං පරාභවතො මුඛං.

## අන්ධ භූතයෝ

අන්ධ භූතයෝ යනුවෙන් පරාභව සූත්‍රයෙහිදී ඉතා පැහැදිලි වශයෙන් ස්ත්‍රී ධූර්ත බව, සුරා ධූර්ත බව හා සූදුව පරාභවයට හේතු භූත වන බව හා දේශනා කොට තිබියදී, තමන් මහා ධර්මධරයන්ය. විනය ධරයන්යයි සිතා ඒ නිසා හැම

කෙනෙක්ම තමන් දෙසාබාන ඕනෑම දෙයක් හුදු භක්තියෙන් යුක්තව සාමාන්‍ය අය පිළිගත යුතුය, පිළිගනීවිය යන අදහස ඇතිව සමහර දේශකයන් වහන්සේලා සුදුව වුවත් යහපත් අදහසින් කෙරෙතොත් එහි වරදක් නැතැයි කීමට තරම් අන්ධ භූත තත්ත්වයට පත්ව තිබීම වර්තමාන සමාජය ගිහි පැවිදි බේදයකින් තොරව කොතරම් දුරට පිරිහී ඇද්ද යන කාරණය සපථ කරන්නකි. කරණීය මෙත්ත සූත්‍රයෙහි එන "සන්තුස්සකොච සුභරොච අප්පකිච්චෝච සල්ල හුකවුත්ති" යන භික්ෂු ජීවිතය හැඩ ගැසිය යුතු හා වැඩ ගැසී ඇති පිළිවෙල සඳහන් දෙසුම හා කොතෙක් දුරට ගැලපේද යන්න විමසුමට ලක් කිරීම නුසුදුසු නොවන බව පෙනී යයි. යතෝක්ත කරුණ පිළිබඳව අපේ අවධානය දැඩි ලෙස යොමු වන්නේ කතෝලික පල්ලියේ තත්ත්වයට පන්සල පත්වනු දැකීමට බෞද්ධයන් බලාපොරොත්තු නොවන නිසාය. අචාර්ය එන් එම් පෙරේරා මුදල් ඇමති වශයෙන් සිටියදී මේ රටේ කෘත්‍රිම රෙදි නිෂ්පාදනය කොට එමගින් රට ස්වයං පෝෂණය කිරීමේ අදහස ඇතිව පටපණුවන් බෝ කිරීමේ ව්‍යාපෘතියක් ද කසිප්පු වැනි දෙයින් මහ ජනතාව බේරා ගැනීමටත් රජයට යම් ආදායම් මාර්ගයක් ඇති කර ගැනීමටත් කැමති කෙනකුට පොල් ගස් දෙකක් මැද ගැනීමට අවසර දීමටත් යෝජනා කළ බව කවුරුත් දනිති. මෙය අවස්ථාවක් කරගත් අපේ සමහර අය ලංකාවෙන් බුද්ධාගම නැති කිරීමේ උපායක් හැටියට එදා එය දුටහ. නමුත්, අද අපේ රටම සුරාවෙන් සුදුවෙන් මත් කුඩුවලින් හා නොයෙකුත් දූෂණයන්ගෙන් දුශ්චරිතයන් ගෙන් රට හෝදා පාලුවී තිබියදී එදා සිටියවුනට කුමක් සිදුවී තිබේදැයි කෙනකුට සිතෙනු බැරිය.

## කොළඹ ගණිකාවන්

එක් නිදසුනක් නම්, අද කොළඹ නගරය තුළ පමණක් ගණිකාවන් සුලබව දැකගත හැකිය. මේ අන්දමට මුලු මහත් සමාජ ව්‍යුහයම අන්ත ප්‍රපාතයකට වැටී තිබියදී එදා සිටි වාදීහසිංහයන් අද මේ හැමෙකක්ම නොඇසූ කන් ඇතිවැ නොදුටු විරූ ඇස් ඇතිව සිටීමේ දීර්ඝ කාලයක් ලක්දිව පැවති බුද්ධ ශාසනයේත් සිංහල බෞද්ධයන්ගේත් මහත් අවාසනාව බවම පෙනී යයි.

මෙවන් අදහසක් පළ කළේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට ආසන්නව සිටියදී පවා තම ශ්‍රාවකයන් තුළ තමන් වහන්සේ දෙසූ ධර්මය පිළිබඳව යම් සැකයෙක් වේ නම් තමන් වහන්සේ ගෙන් එය ඇසිය යුතු යැයිද, එසේත් නැතිනම් යහලු භික්ෂුවකගේ මාර්ගයෙන් හෝ අසා සැකය දුරුකර ගන්නා හැටියට දේශනා කිරීමෙන් උන් වහන්සේ සෙස්සන්ගේ සිතුම් පැතුම්වලට කුමන ආකාරයක ගෞරවයක් දක්වා තිබේද? යන කාරණය නිසාය. අවුරුදු දෙදහස් පන්සියක පමණ සිංහල බෞද්ධ ඉතිහාසය හාරා අවුස්සා බලන විට යම් යම් අය යම් යම් වකවානුවලදී බෞද්ධයන්ට බුදු දහම මගින් සිතීමට විමසීමට හා ඒ අනුව ක්‍රියාකිරීමට ලබාදී ඇති නිදහස වළ දමන්නට උත්සාහ කළද එය සාක්ෂාත් කරගත නුහුණු දෙයක් වූ බව බෞද්ධ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කර දෙන බව කිව හැකිය.

*1987 ජුනි මිහතර සඟරාව ඇසුරිනි*

# ගිමන් හරින්නට නවාතැනක්







දඹුලුහල්මිල්ලෑව, යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ නවතමයෙන් ඉදිකරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරී නිවස්න ගොඩනැගිල්ල එම රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබලිව්ඩබලිව්ඩබලිව්එස්සිබී වික්‍රමසිංහ ආර්ඩබලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් ඉකුත් දෙසැම්බර් 24 වන දින විවෘත කරන ලදී.





## යුද්ධෙ කාලෙ කතාවක්

# කල්‍යාණි සිනාසුනාය

**මිදුලේ** කොනක වන් අඹගහ යට වූ බංකුවෙහි හිඳගත් සිරිල් සති තුනක අවෑමෙන් ලද කල්‍යාණිගේ හසුන දිගහැරියේ අපමණ සෙනෙහසකිනි. එදවස ඇගේ ලිපිවල දුටු මුතුවන් අත්අකුරු, සොඳුරුබර වදන් මෙන්ම ඇගේ සුවඳද අද වුව එලෙසම නොවේදැයි ඔහුට සිතිණ.

ආදරණීය සිරිල් ! ඔයා එව්ව දෙවෙනි ලිපියත් ලැබුනා. ඒත් අද තමයි පිලිතුරක් ලියන්න ඉඩක් ලැබුනෙ. හිතාමතාම ලිපි ප්‍රමාද කරනව නෙවෙයි මං. ඒ වුනත් මේ පරිසරයේදී එහෙම දේකට වේලාව වෙන්කරන එක හරිම අමාරුයි. මගෙ රැකියාවේ තියෙන අවිවේකීබව ගැන ඔයාට අමුතුවෙන් කියන්න ඕන නැහැනෙ. ඒ වුනත් ඉස්සර වගේ නිතරම ඔයාට ලියන්න නොලැබෙනකොට මගෙ හිතට හරිම දුකක් දැනෙනව. ඔයාගෙන් වුනත් ලිපියක් ප්‍රමාද වෙනකොට ඒ දුක තවත් වැඩිවෙනව. ඒත් මම දන්නව ඔයාට තියෙන වැඩකටයුතුත් මට දෙවැනි නැති බව.

ලිපියෙන් මදකට හිස ඉවතට ගත් සිරිල් මොහොතක් වටපිට බැලුවේ කිසිවකු තමා අසල ගැවසෙන්නේදැයි සැකහැර දැනගනු රිසියෙනි. කල්‍යාණි එවූ ලිපියක් කියවන සෑම මොහොතකදීම ඇය තමා අසල ගැවසෙන සෙයක් ඔහුට හැඟිණ. හෙතෙම නැවතත් කුතුහලයෙන් යුතුව ලිපිය වෙත නෙත් යොමුකළේය.

ඒක නෙවෙයි සිරිල් ! මේ පැත්තෙ කලබල වැඩියි. හැම දවසකම මොකක් හරි සිදුවීමක් වෙනව. දැන් දැන් මේ පැතිවල කරන මෙහෙයුම්වලින් වැඩිපුර වාසි අපටයි. මෙතෙක් කලක් නොනැවතුණු යුද්දෙක අවසානය පේන මානෙ කියලයි මට හිතෙන්නෙ. මොනතරම් දුෂ්කරතා විඳගෙන වුනත් මෙහෙ ඉන්න අපේ කොල්ලො රට වෙනුවෙන් කරන කැපවීම දකිනකොට මට ගැනුකම අමතක වෙන තරම් සිරිල්. කෙල්ලො හැටියට අපි පෙරමුණේ නැතත් අපිට හැකි අයුරින් යුද්දෙට සම්මාදම් වෙනව. ඒත් අපෙන් තවම රට වෙනුවෙන් කොල්ලන්ට සාපේක්ෂව හරි දායකත්වයක් ලැබිල නැහැ කියලයි මට හිතෙන්නෙ. ජීවිතේ පරදුවට තියල අපේ කොල්ලො කරන මෙහෙයුම් දිහා බැලුවහම අපි කරන්නෙ මොනවද කියල හිතෙනව සිරිල්. ඒ අතින් අපේ රටේ වෙන රැකියාවල් කරන කෙල්ලන්ට සාපේක්ෂව හමුදාවෙ කෙල්ලෙක් වුන එක ගැන මම හොඳටම ආඩම්බර වෙනව. ඒකෙ ගෞරවය හිමිවෙන්න ඔයාටයි. බිරිඳව යුද්දෙට යවන්න තරම් එඩිතර වුන සැමියෙක් හැටියට ඔයත් අනෙක් සැමියන්ට ආදර්ශයක් සිරිල්.

මෙහෙ මාත් එක්ක කෙල්ලො ගොඩාක් ඉන්නව. ආ... ඔයාට කියන්න බැරි වුනා ඔයාලගෙ ගම් පැත්තෙ කෙල්ලො දෙන්නෙක්ම මෙහෙ ඉන්නව. ඒ අයනම් ඔයාව දන්නවලු. යාළුවොත් එක්ක එකතු වුනාම නම් පාළුවක් දැනෙන්නෙ නෑ සිරිල්. ඒත් හැම කෙනෙක්ම ඔයා ගැන කියල විහිළු කරනව. මෙහෙ ඉන්න අයගෙන් විවාහ වෙලා ඉන්න එකම කෙනා මම විතරයි. ඒ වුනත් අනිත් හැම කෙල්ලක් එක්කම කරට කර වැඩ කරන්න තරම් මට හැකිවීම ගැන මට හරිම සතුටුයි. ඒ අතින් ඔයාගෙ හැම ලියුමකම මාව දිරිමත් කරල එවන වචන ටික මට මහමෙරක් තරම්.

ඔයා දන්නවද ජීවිතෙ හැමදේටම ඔරොත්තු දෙන්න මම දැන් පන්නරය ලබලා. ඒක මේ වෘත්තියෙන් ලබපු ආභාසෙ. මෙහෙ කොච්චර කලබල තිබුනත් ඔයා මම ගැන පොඩ්ඩක්වත් බයවෙන්න එපා. ඔයා මට ආදරෙන් හෙවනැල්ලක් වගේ ඉන්නකොට මට කවදාවත් වරදින්නේ නෑ කියල හොඳටම විශ්වාසයි. ඉස්සර මම පොඩි දේටත් ඇඬුව. ඒත් දැන් එහෙම නෑ. ඒ හැමවෙලාවකදීම හමුදාවෙ කෙල්ලෙක් හැටියට හිතන්න කියල දවසක් ඔයාමයි මට කියල දුන්නේ.

"ලියුම් කියව කියවා හුල්ලල හරියන්නේ නෑ ලොකු පුතේ. උඹ ආපහු මෝලෙ රස්සාවට පලයං. නැත්නම් වෙන්නේ උඹට හැමදාම ගෑනුන්ගෙ පදේට නටන්නයි"

නොදැනීම අම්මා තමා ළඟටම පැමිණ ඇත. ඇයගේ සැරපරුෂ හඬ හමුවේ ලිපිය කියවමින් සිටි සිරිල්ගේ දෑහැන් බිඳුණි.

"හමුදාවේ කෙල්ලෙක් උඹට හරියන්නේ නෑ සිරිල්. උඹම ටිකක් හිතල බලපන්. උඹ ඉන්නෙ මෙහෙ.

ඒකි ඉන්නෙ රට කෙරෝලෙ. යුද්ධ කරනවයි කියල මාස ගණන් ගෙදරින් පිට. උඹ කොහොමද ගෙදරට වෙලා තනියම මේ වැඩ කරන්නෙ. දැන් මේ ගෙදර පිරිමි ගැනු මාරු වෙලා. ඔන්න ලොකු පුතේ මම නොකිව්වයි කියන්න එපා. උඹලා දරුවෙක් මල්ලෙක් එහෙම හදාගන්න දවසට මට එහෙම බෑ ආවතේවකං කොරන්ඩ. ඒකිට රස්සාව දමල ගහලා ගෙදර නතරවෙන්ඩ කියපං."

තොරතෝංචියක් නැති අම්මාගේ ගෝරනාඩුව හමුවේ සිරිල් තුළ මතුවූයේ නොරිස්සුමකි. හමුදාවෙ කෙනකු විවාහ කරගැනීම මහා වරදක් බව අම්මා මුලසිටම දැරූ ස්ථාවරය විය. එහෙත්, නිතර දෙවේලේ රණවිරුවන්ට සෙත්පතා පන්සලේ පැවැත්වෙන බෝධිපූජා ආදී පිංකම් සියල්ලකදීම අම්මා පෙරමුණගෙන ක්‍රියාකරනුයේ "අපේ රට බේරගන්ඩ ඉන්න දරු පැටව් ටිකට රත්නත්තරේම පිහිටයි...!" කියමිනි. එහෙත්, අම්මාගේ ඒ ප්‍රාර්ථනය තම පුතුගේ බිරිඳ වූ කල්‍යාණිට පමණක් වලංගු නොවන්නේ ඇයිද යන්න ගැටළුවකි. එසේම, උදේ සිට රෑ වනතුරුම ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රචාරය වන ප්‍රවෘත්ති විකාශයන්ට සවන්දෙමින් හමුදා සාමාජිකයකුට කිසියම් විපතක් සිදුව ඇත්නම් ත්‍රස්තවාදීනට ශාපකිරීමටද, ඉහ නිකට බඳාගෙන අනේ අපොයි කියන්නටද ඈ පසුබට නොවන්නීය. අම්මාගේ මේ දෙබිඩි පිලිවෙත අප දෙදෙනාගේම අවාසනාවට සිදුව ඇති සෙයකි.

තවදුරටත් එහි රැඳී සිටීමෙන් සිදුවන්නේ අම්මාගෙන් දිගින් දිගටම එල්ල වන රැවුම් ගෙරවුම්වලට මැදි වන්නට බව වටහාගත් සිරිල් කිසිත් නොදොඩාම නිවසින් නික්මුණි. හෙතෙම වෙල්යාය මැදිකර දිවෙන ගුරුපාර දිගේ ඇවිද යන්නට වූයේ අරමුණකින් තොරවය.

------------------------------

"තාම පවුල ගෙදර ආවෙ නැද්ද සිරිල්"

තම නිවස පෙනෙන මානයේ ඇති බෝක්කුව උඩට වී කල්පනාවක නිමග්නව සිටි සිරිල් වෙත පැමිණි විමලෙ අසන්නට වූයේ සරදමට මෙනි.

"තාම නෑ විමලේ සමහරවිට ලබන සතියෙ දිහාට එයි. මේ දවස්වල එහෙ හරියට යුද්දෙලු"

සිරිල් ඉවත බලාගෙනම පිළිතුරු දුන්නේය.

"උඹනං පුදුම මිනිහෙක්. ගෑනි යුද්දෙට යවල උඹ මෙහෙට වෙලා ඉන්නවා"

විමලෙගේ එවදන් හී පහරක් ඇනෙන්නාක් මෙන් සිරිල්ට දැනුනි.

"උඹ හොඳටම දන්නවනෙ විමලෙ මම කල්‍යාණිව අඳුනගන්නකොටත් ඒකි හමුදාවට බැඳිලා ඉවරයි. අනික මමත් ඒ තීන්දුව ගන්න හිතනකොට මගෙ වයස පහුවෙලා. ඒ සේරටම වඩා විමලෙ, හමුදාවට බැඳෙන්නත් වාසනාව තියෙන්න ඕන. එහෙමනං මටත් වඩා උඹට තිබුනනෙ හමුදාවට යන්න. මම හිතන්නෙ තාමත් උඹේ වයස වැඩි නෑ"

සිරිල් එක දිගට කියාගෙන ගියේ විමලේ දෙස තියුණු බැල්මක් හෙළමිනි.

"හරි හරි ඒ වුනාට අපි ගෑණු යුද්දෙට යවලා හම්බ කරවන් කන්නේ නෑනේ"

විමලේ අවඥාසහගත ලෙස පැවසීය. එසැනින් දත්ඩෙත් පහර කෑ නාගයකු මෙන් කිපුනු සිරිල් වාඩිවී සිටි බෝක්කුව මතින් නැගිට්ටේය.

"එහෙමනම් ඇයි උඹ ගෑනිව රට ඇරියේ. උඹලා කසාද බැඳලා මාස කියද එකට හිටියෙ මගෙ ගෑනි හමුදාවට ගියේ හම්බ කරන්න නෙවෙයි, රට ජාතිය බේරගන්න. රට වෙනුවෙන් සේවය කරනවා කියන්නේ කොයිතරම් උතුම් වැඩක්ද. උඹේ ගෑනි රට ගියේ එහෙම දේකට නෙමෙයි. කොහොම වුනත් ඒ ගෑනි එවන සල්ලිවලිනුත් උඹ කරන්නෙ බීබී නටන එක මිසක් වෙන අහවල් රාජකාරියක්ද? මගෙ කට අවුස්ස ගන්න එපා විමලෙ"

සිරිල් බෙහෙවින් කෝපාවිෂ්ටව ඇති සෙයකි. ඔහුගේ අත් කිටි කිටියේ තද වී ඇත. සිරිල්ගේ තර්ජනාත්මක වදන් හමුවේ විමලසිරි හිම්හිට පසුබසින්නට වූයේය. තමා මෙන්ම තම බිරිඳ පිළිබඳව විමලසිරි දක්වන පටු ආකල්පය සිරිල්ට ඉහිලුම් නොදෙන්නක් විය. එහෙත් විමලසිරි වැන්නකු සමග තර්ක කිරීම නිශ්ඵල ක්‍රියාවකැයි ඔහුට සිතුණි.

කෝපය හා කලකිරීම මුසු හැඟීමෙන් ඉක්මන් ගමනින් නිවස වෙත පියවර තැබූ සිරිල් කෙලින්ම කුස්සිය වෙත ගියේ ඉස්තෝප්පුවේ සිටි අම්මා සමග වචනයක් හෝ නොදොඩාය.

-------------

"ලොකු පුතේ.... ලොකු පුතේ...."

"ඇයි අම්මේ කෑ ගහන්නෙ..."

"අර බලපන් කවුද වඩින්නේ කියලා."

මහත් කලබලයෙන් සාලයට දිව ආ අම්මාගේ කෑ ගැසීම ඇසී සිරිල් මිදුල දෙස හිසහොවා බැලීය. පුදුමයකි ලොකු හාමුදුරුවන් නොදන්වාම ගේ දොරකඩට වැඩමකොට ඇත.

හදිසියේම ලොකු හාමුදුරුවන්ගේ පැමිණීම සිරිල් තුළ මෙන්ම අම්මා තුළද විමතියට හේතුවිය. පිරිතක් දාන ගෙයක් හෝ මලගෙයක් වැනි කටයුත්තකදී හැරුණු විට ලොකු හාමුදුරුවන් මෙසේ නිවසකට වඩිනුයේ ඉතා කලාතුරකිනි.

"ආ.... ලොකු හාමුදුරුවනේ වඩින්න ඇතුලට"

සිරිල් ගෞරවයෙන් ලොකු හාමුදුරුවන්ට නිවස තුලට පැමිණීමට ආරාධනා කරන අතරවාරයේ අම්මා සුදු පිරුවටයක් එලා පුටුවක් සූදානම් කොට තිබුනාය.

"ආ.... සිරිල් පුතත් ඉන්න එක හොඳයි. මං මේ තකහනියේම ආවේ දුව ළඟදි නිවාඩු එනවද කියල දැනගන්නයි"

"එන දවස්නම් පහු වෙලත් එක්ක ලොකු හාමුදුවනේ, කොහොමටත් මේ සතියෙනම් වරදින එකක් නැහැ. ගිය වතාවෙත් දවස් ගාණක්ම පහුවුනා"

සිරිල් පැවසුවේ මහත් ඕනෑකමිනි.

"අනේ එයාගේ නිවාඩු. ඇයි මේ ගෙදර ඔක්කොම මම කරනවනෙ ඉතිං මොකද නිවාඩු ගන්න හදිසි වෙන්නෙ. අනික අපෙ හාමුදුරුවනේ මම ඕවා කරගන්න කලින් කිව්වා."

අම්මා නොරිස්සුම් සහගත ලෙස පැවසුවාය.

"හා.... හා.... එහෙම කියන්න එපා උපාසක අම්මේ. ඒ ළමය එහෙ ඉඳං ස්වයං රැකියාවක් කරනවා නෙමෙයිනේ. හිතුන හිතුන දවසට නිවාඩු ගන්න. දුව ආපු ගමන් ඔය ළමයා මට පණිවුඩයක් එවන්නකො."

"අර මක්කටෙයි අපේ හාමුදුරුවනේ" අම්මා විමසුවාය.

"නෑ නෑ අපි පන්සලේ පොඩි උත්සවයක් සංවිධානය කරන්න යනවා ලබන පසලොස්වක දාට. ඒකට දුවට

ආරාධනා කරන්නයි ඉන්නේ."

"එයාටෙයි කියල මොකක්ද විශේෂ ආරාධනාව" අම්මා නොක්කාඩු ස්වරයෙන් ඇසීය.

"ඇල්පී නෝනා උපාසක අම්මා එහෙම හිතන එක වැරදියි. ඒ දරුවො මුළු රටේම ගැලවුම් කාරයො වෙච්චි. අනික මේ ගම් රටවල ඉන්න වෙන ගෑනු උදවිය කරනවා වගේ රස්සාවක් නොවෙයිනේ ඒක. මමනම් දකින්නේ ඒ දැරිවි කරන්නේ රස්සාවකට වඩා මේ රටට සේවයක් හැටියටයි. එහෙව් එකේ උපාසක අම්මා ඒ ගැන ආඩම්බර වෙන්න එපැයි."

"ලොකු හාමුදුරුවන්ගේ කරුණු දැක්වීම හමුවේ අම්මා මදක් මෙල්ල වූ සෙයකි.

"උත්සවයක් කිව්වේ අපේ හාමුදුරුවනේ..."

සිරිල් ඇසීය.

"ඒවා දැනගත්තැකි පස්සෙ. මම එහෙනම් ගෙහුං එන්නම්"

ලොකු හාමුදුරුවන් වහන්සේ හුනස්නෙන් නැගිටිත්ම අම්මා කලබල වූවාය.

"අනේ ඔබ වහන්සේට ගිලන්පස ටිකක්"

"නෑ නෑ නැතුවට කාරි නෑ උපාසක අම්මේ. මම අර එගොඩහ ජේම්ස් මුදලාලිවත් මේ ගමන්ම බලලා එන්න කියලා. අසනීපයෙන් පස්සේ ටිකට් කපන් ගෙදර ඇවිල්ලලුනෙ."

--------------

කලහාණිගේ මෙවර නිවාඩුව වෙනදාට වඩා ප්‍රමාද වුවද සිරිල් තුළ පැවතියේ පෙර නොවූ විරූ සතුටකි. ගියවර ඇය පැමිණි වාරයේ අඩක් නිමකර තිබූ නිවසේ බොහෝ කටයුතු මෙවර අවසන් කළ හැකි වෙතැයි ඔහුට සිතුණි.

"මෙ බලන්න සිරී මගෙ අත්දෙක, ඉස්සර වගේනම් නෙමෙයි. ගොරෝසු වෙලා"

සිය සැමියාගේ පපුතුරෙහි හිස හොවාගත් කලහාණි හෙමින් කොඳුරන්නට වූවාය.

"අත්දෙක සිනිඳු නැති වුනාට ඔයාගේ හදවත ගොරෝසු නැනේ කලහාණි. මට ඒ හොඳටම ඇති ඔයා කරන රස්සාව ගැන මට අමුතුවෙන් පැහැදිළි කිරීම් ඕන නෑ ළමයෝ. මම ඒ හැම දෙයක් ගැනම හොඳට දැනගෙනයි ඔයාව කසාද බැන්දේ"

ඔහුගේ සෙනේබර වදන් හමුවේ කලහාණිගේ නෙත තුටු කඳුලින් බරවිය. සිරිල් වැන්නකු තමාගේ ස්වාමියා වීම පිළිබඳ ඕ මහත් සතුටට පත්වූවාය. දෙමාපිය විරෝධතාවය මධ්‍යයේ වුව ඔහු තමා විවාහ කරගන්නට ගත් එඩිතර තීන්දුව මගින් සිරිල් තුළ තමා පිළිබඳ පවතින ආදරය හා විශ්වාසය කොතෙක්ද යන්න වටහාගැනීමට කලහාණිට අපහසු නොවිණි.

"සිරි අපි ගේ හදන පැත්තේ යමු. මටනම් ඉස්පාසුවක් නෑ"

"යමු යමු ඔයා නොහිටපු පහුගිය මාසේදි ගෙදර කොයිතරම් වැඩ කොටසක් මම කරලා තියෙනවද කියල බලන්නකෝ."

අලුතෙන් ඉදිවෙමින් පවතින නිවසට සිරිල්ගේ මහගෙදර සිට ඇත්තේ මීටර් 500 ක් තරමේ දුරකි. සිරිල්ගේ සුරතේ එල්ලුණු කලහාණි එම දුර ගෙවා දැමුවේ කුඩා දැරියක මෙන් බොහෝ සැහැල්ලුවෙනි.

"අපි අර පැත්තටත් තව ජනේලයක් දාමු සිරිල්. එතකොට වෙල පැත්තෙන් එන හුළං පාරත් ගේ ඇතුලටම එනවනෙ. මේ උළුවස්සත් තව ටිකක් පලල් කරමු."

"පිස්සු කෙල්ල අපිට හිතෙන හිතෙන විදියට එහෙම ගෙවල් වෙනස් කරන්න හොඳ නැහැ. වස්දොස් මතුවෙන්නෙ එතකොටයි."

"අනේ සිරී එහෙම කියලා කොහොමද?"

"හරි හරි ළමයෝ අපි ප්ලෑන් එක ඇන්ද කෙනත් එක්කත් කතා කරලා හොඳ විදියක් කරමු"

ගොඩනගමින් යන නව නිවස දෙස කලහාණි බලා සිටියේ මහත් උද්දාමයකිනි. සිරිල් සමග විවාහ වන්නට පෙර සිටම තමන්ගේම කැදැල්ලක් තනා ගන්නට ඇය තුළ වූ සිහිනය ක්‍රමයෙන් සැබෑ වන සෙයක් ඇයට හැඟිණ. ඕ අඩක් නිමකර තිබූ නිවසේ ඔබ මොබ ඇවිදින්නට වූයේ ජයග්‍රාහී හැඟීමකිනි.

"කලහාණි වැඩිය පරක්කු වෙන්න බෑ. අද හවස පන්සල් යන්නත් තියෙන හින්ද ඉක්මනට යමු."

"ඇත්ත නේන්නම් තව පොඩ්ඩෙන් ඒකත් අමතක වෙනව. සිරී මම මොකක්ද අඳින්නේ"

"ඔසරියක් අඳින්න. ඔයා උත්සවේ ප්‍රධාන ආරාධිතයෙක් හින්දා ලස්සනට යන්න එපැයි."

"එතකොට ඔයා"

"මම කොහොම ගියාම මොකද? මට නෙමෙයිනේ ආරාධනා කරලා තියෙන්නෙ"

"අනේ එහෙම කියන්න එපා. ඔයත් ලස්සනට යන්න ඕනෙ" ඕ සිරිල් ඉදිරියේ සුරතල් වන්නට වූවාය.

"හරි හරි.... යමු මම එන්නම්කො කුමාරයෙක් වගේ..." සිරිල් සිනාසෙමින් කීය. කලහාණි ඔහුත් සමගින් ගෙමිදුලට පියවර මැන්නාය.

----------

පන්සල වෙනදාට වඩා උත්සවශ්‍රීයක් ගෙන තිබුණි. තැන තැන එල්ලූ කොඩිවැල් මෙන්ම විදුලි ආලෝකයෙන්ද අවට හැඩ ගන්වා තිබුණේය. සුදුවත හැඳගත් උවැසි උවැසියෝ පෙහෙවස් සමාදන්වීමෙන් අනතුරුව බණ මඩුවට රොක් වෙමින් සිටියේ එහි පැවැත්වෙන උත්සව කටයුත්ත සඳහාය. පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ මූලිකත්වයෙන් ඇරඹි උත්සවයට ග්‍රාමසේවක මහතාද, ගමේ පාසලේ විදුහල්පතිවරයාද, තවත් ප්‍රභූන් රැසක්ද එකතුව සිටියහ. එම අවස්ථාවට ආරාධිතයන් ලෙස ඇරයුම් කොට තිබූ කිහිපදෙනා අතර කලහාණිට හිමිව තිබුණේ විශේෂ තැනකි. ඇය අසලින් වාඩිවී සිටි සිරිල්වද එය මහත් ආඩම්බරයක් ගෙන දෙන්නක් විය. එහිදී, සභාව අමතා උත්සවයේ අරමුණ පැහැදිලි කරමින් ලොකු හාමුදුරුවන් වහන්සේ දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කළ සේක.

"අද අපි මේ අවස්ථාව සංවිධානය කළේ අපේ ගමේ සිටින විරෝධාර රණවිරු දරුවන් කිහිපදෙනකුටම උපහාර පුදකිරීමේ අරමුණ ඇතිවය. මේ මොහොතේ උතුරෙ බොහොම දරුණු විදියට යුද්ධයක් සිද්ධ වෙනවා. ඒ හින්දා රටදැය බේරාගන්න දිවි නොතකා ඉදිරිපත් වෙලා ඉන්න අපේ මේ එඩිතර දරුවෝ වෙනුවෙන් අපිට හැකි පමණින් ශක්තිය ධෛර්‍යය ලබාදෙන එක පුරවැසියෝ විදියට මේ වේලාවේ අපි හැමෝගෙම

යුතුකමක්. ඒ හින්දා අපේ දායක සභාවේ ඉල්ලීම පරිදි අපි තීන්දු කළා අපේ ගමටත් ආඩම්බරයක් වෙච්ච මේ දරුවෝ කීපදෙනා කැඳවලා ඒ අයට උපහාරයක් පවත්වන්න. විශේෂයෙන්ම හමුදාවට සම්බන්ධ පුත්තු කීපදෙනෙක් අපේ ගමේ හිටියත් මේ අහල ගම් හතරටම වීර සෙබළියක් හැටියට ඉන්නේ අපේ මේ කල්‍යාණි මහත්මිය විතරයි. මෙතුමිය අපේ මේ ගමේ විහාරමහාදේවිය විදියටයි මම හඳුන්වන්නෙ. විශේෂයෙන්ම මම කියන්න ඕනේ අපේ දායක සභාවේ බොහොම ගුණ යහපත් දායිකාවක් වන මේ ඇල්පි නෝනා උපාසිකා මාතාවගේ ලේලිය තමයි ඒ. ඇල්පි නෝනා මැණියන්ට අපි හැමෝම ස්තුතිවන්ත විය යුතුයි. තමන්ගේ පුතාව ඒ වගේ එඩිතර දියණියකට විවාහ කරදීම පිළිබඳ...."

ලොකු හාමුදුරුවන් දිගින් දිගටම කල්‍යාණිගේ ගුණ වැනීම සිරිල්ට ඉහිලුම් නොදෙන සතුටක් වූයේ විශේෂයෙන්ම එය තම මැණියන් ඉදිරියේම සිදුකරන හෙයිනි... උත්සවය අවසන් වත්ම සිරිල් කල්‍යාණි සමඟින් අම්මා වෙත පැමිණ වැඳ නමස්කාර කොට සමුගත්හ. උපහාර උත්සවයේ දී කල්‍යාණිට වටිනා තිළිණයක් ද හිමිව තිබූ අතර, සිරිල් එය තුරුලේ හොවාගෙන ගමන් ඇරඹුවේ තමන්ද එහි කොටස්කරුවකු නොවේදැයි සිතමිනි.

"අම්මා අපිත් එක්ක යන්න එන්නෙ නැද්ද..." පන්සලෙන් නික්මෙන අතරතුරෙ කල්‍යාණි විමසුවාය.

"අම්මා හවස බෝධි පූජාවටත් ඉඳලම එයි... රෑ වුනොත් මම එයා එක්කන් යන්න ආපහු එන්නම්කෝ.."

-------------

උපහාර උත්සවයෙන් පසු ආවාස ගෙයි කොහක වාඩිවී පිරිත් පොතක් කියවමින් සිටි ඇල්පි නෝනා වෙත පැමිණි බේබි අක්කා

"අපි ඉතින් ඇල්පි නෝනා තරම් වාසනාවන්ත නෑ නොව."

"ඇයි බේබි අක්කේ එහෙම කියන්නේ"

"ඇල්පි නෝනා පුදුමයෙන් ඇසීය"

"මට හිටියනම් ඔය වගේ ලේලි පොඩ්ඩක්"

"අම්මපා මල් තියලයි වඳින්නේ"

"එකට අපේ එකා"

"ඔය උස්සාගෙන ඇවිත් තියෙන්නෙ මහ ලොකු තේ උඩ්ච්චියක්... තුප් නොදකින්.... මට ඕකිව දැහට පේන්න බෑ. දැන් ඇල්පි නෝනාගේ පුතයි ලේලියි දෙන්නම ඇවිත් නෝනෙට දත ගහල වැඳලා ගියේ. අම්මපා දැක්කත් බඩ පිරෙනවා. හා...මං කියන්නේ ඇල්පි නෝනෙ දැන් මං මේ උදේ ඉඳන් සිල් ගන්නවා. නිකමට ඔකුන් ආවද මට ගිලන්පස උගුරක් ගෙනත් දෙන්න. මෙලහට ගිහින් ඇති දෙන්නත් එක්ක රොන්දේ."

බේබි නෝනාගේ අඬවැඩියාව නෑසුනා සේ සිටියා මිස ඇල්පි නෝනා කිසිම ප්‍රතිචාරයක් දක්වන්නට නොගියාය. ඒ නිසාමදෝ ඇය "මෛත්‍රී භාවනාව පටන් ගන්න වෙලාවත් හරි. මං යනවා ඇල්පි නෝනේ බෝමළුව පැත්තට." යැයි කියමින් යන්නට ගියාය.

---------------------

කාලය සෙමෙන් පියඹා ගියද බොහෝ දේ වේගයෙන් වෙනස් වෙමින් තිබිණ. කල්‍යාණිගේ කැදැල්ල තුළ වෙනදා නොතිබූ සතුටක් මෝදුවන්නට විය. ඇය සිය නිවාඩුවෙන් වැඩි කොටසක් ගෙවා දැමුවේ අලුතෙන් ගොඩනගන නිවසේ කටයුතු සොයා බලමිනි.

"කල්‍යාණි දුවේ..."

අම්මාගේ කටහඬෙන් සිරිල් මෙන්ම කල්‍යාණි ද වික්ෂිප්ත වූයේය. මෙතුවක් කාලයක් එතරම් කාරුණික වදනක් අම්මාගෙ මුවින් ඇසූ ප්‍රථම අවස්ථාව එය බැවින් එය ඔවුන් තුළ නුපුරුදු තිගැස්මක් ඇති කළේය.

"මෙන්න මං පුතාලට තේ හැදුවා. දැන් ඉතින් සුතංගු නොකර මේ ඉතිරි වැඩ ටිකත් ඉවර කරගෙන පදිංචියට ආවනං නේද හොඳ"

ගත වූ දින කිහිපය තුළදී අම්මා බොහෝ ලෙස වෙනස් වී ඇති සෙයකි. විශේෂයෙන්ම එකී පරිවර්තනය ආරම්භ වූයේ පන්සලේ පැවති උපහාර උත්සවයෙන් පසුව නොවේදැයි සිරිල්ට සිතුණි.

"මම එහෙ ඉඳං යුද්ධ කරනකොට ඔයත් මෙහෙ ඉඳන් යුද්ධයක් කරලනෙ සිරිල්"

සිරිල්ට පමණක් ඇසෙන ගානට කල්‍යාණි කොඳුලේය.

"ඒ කිව්වෙ..."

"ඇයි අම්මගෙ හිත දිනාගන්න කරපු යුද්දෙ, කවුද හිතුවෙ නැන්දම්මා මේ තරම් මට ආදරෙ කරයි කියල..."

"මේ හැමදෙයක්ම හොඳ විදියට විසඳෙන්න ඕනෙ කල්‍යාණි. ඔයා කරන උතුම් රස්සාවෙ පින එල අපට ලැබෙන්න ඕනේ."

එවිටම කඩුල්ල අසල නැවැත්වූ වාහනයක හලාව කිහිප විටක්ම නාද වන්නට වූයෙන් කාගෙත් අවධානය ඒ වෙත යොමුවිය.

"අත්තම්මා අපි ආවා..."

දුර සිටම කාරයෙන් බැසගත් කුඩා දරු දෙදෙනකු තරඟයට මෙන් ඔවුන් දෙසට දුව එන්නට වූහ.

"හතේ හතේ අක්කල නොදන්වාම ආව නේද ? ඇති අපිට මතක් වුණා."

කල්‍යාණි පවසන්නට වූවාය. වාහනයෙන් බැසගත් ලොකු අක්කා ද අයියා සමඟින් ඔවුන් දෙසට පියමනින්නට වූහ.

"ශා...මල්ලිගෙ බකිංහැම් මාළිගාවේ වැඩ සැහෙන්න ඉවරයිනෙ. කවද්ද ඉතිං පදිංචියට එන්නේ. අපිටත් කාමරයක් ඕනෙ." අක්කත් අයියාත් තම නිවස දෙස මහත් ඕනෑකමින් බලමින් පැවසුවේ හදපත්ලෙන්ම උපන් අව්‍යාජ සතුටකිනි.

"කෝ බලන්න කෙලි පොඩ්ඩ ආ දැන් ඉස්සරට වඩා ලොකුයිනෙ. අයියා එක්ක හරි හරියට රණ්ඩු එහෙම අල්ලනව ඇති" කල්‍යාණි ලොකු අක්කාගේ සිඟිති දියණිය වඩාගනිමින් පවසන්නට වූයේ අපමණ සෙනෙහසකිනි.

"හැමදාම උඹලා අනුන්ගෙ ළමයි සුරතල් කරන්න ද කල්පනාව. තරක ද දෑං..."

අම්මා සිනහ මුසු බැල්මෙන් කල්‍යාණි දෙස බලා කීවාය. ලැජ්ජාවෙන් ඉවත බැලූ කල්‍යාණිගේ දෑස් කාටත් හොරා සිරිල් දෙසට එල්ල විය. බලාපොරොත්තු පිරි ඇගේ දෑස පෙරදාට වඩා දිලිසෙන බැව් සිරිල්ට දැනිත. ඔහු කල්‍යාණි දෙස බලා සිනාසුනාය. කල්‍යාණි ද සිනාසුනාය.

- නිමි -

*ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ*
*(රණවිරු සේවා අධිකාරිය මඟින් පවත්වන ලද 2008 රණවිරු සුවඳ සාහිත්‍ය උළෙලේ කෙටිකතා අංශයේ ජයග්‍රාහී නිර්මාණය.)*







# සෙනෙහස අවශ්‍ය දරුවන් සඳහාම වූ "සෙනෙහස"

"පුත්තාවත්තු මනුස්සානං" යන උතුම් බුදුවදනට අනුව මනුෂ්‍යයකුට මේ මිහිමත ඇති අගනාම වටිනාම වස්තුව තම දරුවන්ය. දසමසක් පෙරුම්පුරා තම කුසින්, තම ලෙයින් මෙලොවට බිහිකරනු ලබන දරුවා නිරෝගී, සෞඛ්‍ය සම්පන්න දරුවකු වනු දැකීම සෑම දෙමාපියකුගේම ඒකායන බලාපොරොත්තුවයි. එහෙත්, කිනම් හෝ හේතුවකින් තමන් මෙලොවට බිහිකළ දරුවා යම් ඌනතාවක් (Impairment), යම් විශේෂ අවශ්‍යතාවක් (Special Needs) සහිත දරුවකු බව දැනගැනීමට ලැබුණහොත් එය නිමේෂයකදී එම දෙමාපියන්ගේ හදවත් කම්පනයට පත්කරන කරුණක් වනු ඇත. කණගාටු නොවන්න. ඉවසීම, ආදරය, කැපවීම හා දරාගැනීම ආදී උතුම් මානුෂීය ගුණාංග වැඩි වැඩියෙන් ඔබ තුළ ඇතිකිරීම සඳහා දහසකුත් එකක් මව්වරුන් පියවරුන් අතරින් දෙවියන් වහන්සේ ඔබව තෝරාගෙන ඇති නිසා එවැනි දරුවකු ඔබට ලැබී ඇත.

මෙලොව උපත ලබන ඕනෑම දරුවකුට කායික දුබලතාවක් (Physical Disability) හෝ බුද්ධිමය දුබලතාවක් (Intellectual Disability) තිබුණද ඒ සෑම අයකුටම ලොව ජීවත් වන්නට අයිතියක් ඇත. නමුත්, ස්වභාවධර්මයා නිමිකරදී ඇත්තේ අභියෝග සමඟින් ලොව ජයගැනුමටය. එම අභියෝගය භාරගන්නටත්, එම අභියෝගය ජයගන්නටත් ඔබට අත්වැල් සපයන්නට අපි බැඳී සිටින්නෙමු. ආරක්ෂක අංශයන්හි සේවයේ නියුතු සාමාජික සාමාජිකාවන්ගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා විධිමත් චිකිත්සක සේවා හා පහසුකම් සැපයීම උදෙසා ඉදිකර ඇති ලංකාවේ එකම ආයතනය "සෙනෙහස" වන අතර, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සෙනෙහස මඟින් සැලසෙන මහඟු සේවාව සම්බන්ධයෙන් පාඨක ඔබ දැනුවත් කිරීම උදෙසා මෙම ලිපිය ඔබ වෙත ගෙන එයි.

"සෙනෙහස" නමින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා මධ්‍යස්ථානයක් 2006 වසරේ අගෝස්තු 31 වන දින පළමු වරට පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුළ ආරම්භ කළ අතර, එය එවක පැවති යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ නියාමන ව්‍යාපෘතියක් විය. අනතුරුව විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට වඩා පුළුල් හා විධිමත් සේවාවක් සැපයීමේ අරමුණින් නවීන පහසුකම් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් "සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය" (Senehasa Education Resource Research & Information Centre – SERRIC) නමින් නාරාහේන්පිට යුද්ධ හමුදා විවාහක නිවාස පරිශ්‍රය තුළ ඉදිකෙරුණු අතර, එය 2012 වසරේ මාර්තු මස 05 වන දිනට යෙදුණු සුබ මොහොතින් රණවිරු පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතියට පත්කෙරිණි.

යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ ස්ථාපිතව, කළමනාකරණ මණ්ඩලයක් යටතේ පරිපාලනය සිදුකරනු ලැබූ මෙම කේන්ද්‍රය මේ වනවිට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ රණවිරු සේවා අධිකාරිය වෙතින් පරිපාලනය සිදුකෙරේ. ත්‍රිවිධ හමුදා පොලිස් හා සිවිල් ආරක්ෂක බලකායට අයත් සාමාජිකයින්ගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට චිකිත්සක හා සේවා පහසුකම් සපයන සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් මෙම ආයතනය ක්‍රියාත්මකය. ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පිළිබඳ තොරතුරු ඒකරාශී කරමින් ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සඳහා පර්යේෂණාත්මකව මැදිහත් වෙමින් එම දරුවන්ට ස්වාධීන දිවි පැවැත්මක් තහවුරු කිරීම ද මෙම මධ්‍යස්ථානය හරහා සිදුකෙරේ. එසේම, සමාජය වෙත අන්තර්කරණය කිරීම මෙන්ම දෛනිකව යාවත්කාලීන වන තාක්ෂණය ද සමඟින් ඔවුන් රැගෙනයාමේ අරමුණින් ක්‍රියාත්මක වන සෙනෙහස දැයට මහඟු සේවාවක් සපයනු ලබන මධ්‍යස්ථානයකි.

සෙනෙහස කාර්ය මණ්ඩලය යුද, ගුවන්, නාවික හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින්ගෙන් සමන්විත වන අතර, ඔවුන් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් අධ්‍යාපනික හා චිකිත්සන සේවා සැපයීම සබැඳිව මනා වෘත්තීය දැනුමක් හා පළපුරුද්දක් මෙන්ම ඒ සඳහා අවශ්‍ය දරු සෙනෙහසින් පොහොසත් පුහුණු කාර්යය මණ්ඩලයකි. චිකිත්සන සේවා සැපයීම සඳහා භාවිතා කරන නවීන තාක්‍ෂණික උපකරණ හා මෙවලම් ඇතුළත් පූර්ණ පහසුකම් සහිත භෞත චිකිත්සන ඒකකයක්, කථන හා භාෂා චිකිත්සන ඒකකයක්, වෘත්තීය චිකිත්සන ඒකකයක්, ජල චිකිත්සන තටාකයක්, බහුවිධ ඉන්ද්‍රිය උත්තේජන උද්‍යානයක්, සෞන්දර්යය ඒකකයක්, පූර්ව ළමාවිය සංවර්ධන ඒකකයක්, ඔටිනම් කළමනාකරණ ඒකකයක්, දෛනික ජීවන නිපුණතා ඒකකයක්, පරිගණක තාක්‍ෂණ අංශයක් මෙන්ම වෘතිතීය පුහුණු අංශයකින් සෙනෙහස නෙමහල් ගොඩනැගිල්ල සමන්විත වේ.

වයස අවුරුදු 2 1/2 සිට 18 දක්වා දරුවන් සඳහා මෙමගින් චිකිත්සන හා සේවා පහසුකම් සැපයෙන අතර, කේන්ද්‍රය වෙතට පැමිණෙන දරුවන් පළමුව බහුවිධ අධ්‍යන කණ්ඩායමක් (Multi Discipliary Team) විසින් විධිමත් තක්සේරුවකට ලක්කර එම දරුවාගේ හැකියා හා දුෂ්කරතා (Strength and Difficulties) හඳුනාගැනීම සිදුකෙරේ. අනතුරුව එක් එක් දරුවන්ට සුවිශේෂි වූ පුද්ගලාභිමුඛ ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් (Individual Education Plan) දෙමාපිය සහභාගීත්වය ද සහිතව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සම්බන්ධීකරණ කමිටුවක් විසින් සකස්කර ඒ අනුව අවශ්‍ය පහසුකම් සැපයේ. සෙනෙහස කේන්ද්‍රය වෙතින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්, දෙමාපියන්, ගුරුවරුන්, විද්‍යාර්ථයින්, වෘත්තිකයින්, පර්යේෂකයින් සහ අධ්‍යාපනික පුහුණුව ලබන්නන් සඳහා සපයනු ලබන සේවාවන් මෙසේය.

භෞත චිකිත්සනය (Physiotherapy), කථන හා භාෂා චිකිත්සනය (Speech & Language Therapy), අධ්‍යාපන චිකිත්සනය (Education Therapy), වෘතිතීය චිකිත්සනය (Occupation Therapy), ජල චිකිත්සනය (Hydro Therapy), සංගීත චිකිත්සනය (Music Therapy), රංග චිකිත්සනය (Drama Therapy), බහුවිධ ඉන්ද්‍රිය එළඹුම (Multi Sensory Approch), තොරතුරු තාක්ෂණය (Information Technology), ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් (Sports and Co – curricular Activities), දෛනික ජීවන නිපුණතා (Daily Living Skills), බාලදක්ෂ පුහුණුව (Scout Training), වෘත්තීය පුහුණුව (Vocational Training), දෙමාපිය උපදේශණය (Parental Guidance), ගුරු බලවත්කරණය (Empowering Teachers), පර්යේෂණ සඳහා අවස්ථා (Opportunities for Researchers) ආදී වශයෙනි. ඔටිසම්, ඩවුන් සින්ඩ්‍රෝමිල මස්තිෂ්ක ආඝාතය, ශ්‍රවණ ඌනතා, දෘෂ්ටි ඌනතා, සංවර්ධන ප්‍රමාදය, ඉගෙනුම් දුබලතා, බහුවිධ දුබලතා ආදී විවිධ ඌනතා තත්ත්ව සහිත දරුවන් මෙම කේන්ද්‍රයෙහි පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව පහසුකම් ලබයි. දුබලතා සහිත පුද්ගලයන් සඳහා වන අධ්‍යාපන පනතෙහි ඉතා පැහැදිලිව සඳහන් කර ඇති පරිදි දුබලතා සහිත ළමයින්ට ඔවුන්ගේ වයසට සරිලන මිතුරන් සමඟ සාමාන්‍ය පංති කාමරයේ සාමාන්‍ය පාසල් විෂය මාලාවට ප්‍රවේශවීමේ අවස්ථාවන් තිබිය යුතුය. ඒ අනුව සෙනෙහස කේන්ද්‍රයේ අධ්‍යාපනය හා සේවාවන් ලබාගන්නා වූ දරුවන් සාමාන්‍ය දරුවන් මෙන් සම වයස් දරුවන් සමඟ එක්ව අධ්‍යාපනය ලබන්නට සුදුසුකම් සපුරන අවස්ථාවේදී සෙනෙහස කේන්ද්‍රය මැදිහත්ව මෙවැනි දරුවන් පාසල්ගත කිරීමද සිදුකෙරේ. එමෙන්ම, වයස අවුරුදු 16 ට වැඩි විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අනාගත සුරක්‍ෂිතතාවය ඇතිකිරීම සහ ඔවුන් ස්වාධීන පුද්ගලයන් ලෙස සමාජගත කිරීම උදෙසා වෘත්තීය පුහුණු වැඩසටහනක් ද මෙම මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කෙරේ.

> “සෙනෙහස ලොව වෙසෙන සියලුම දරුවන්ට ආමන්ත්‍රණය කරයි. දරුවන්ගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතාවයන් හිදී ඔවුන් සමඟ අත්වැල් බැඳගනිමින් එක්ව ගමන් කරන්නට සෙනෙහස සූදානම්ව සිටී. කිසිවකු අත් නොහරින්නටත්, වෙන් නොකරන්නටත්, සියලුම දරුවන් සෙනෙහසින් පිළිගන්නටත් නිසි ගෞරවය අත්පත් කර දෙන්නටත් සෙනෙහස වෑයම් දරණ අතර, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ලෝකයට නව අඟනාකම් හා වටිනාකම් අත්කරදීම උදෙසා අපි හා එක්වන්නට ඔබටත් මෙසේ ආරාධනා කරමු.”

යුද්ධ හමුදා රෝහල, සෞඛ්‍ය අමාත්‍යාංශය, රිජ්වේ ආර්යා ළමා රෝහල, දකුණු කොළඹ ශික්ෂණ රෝහල ආදී රෝහල් වෙතින් ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා ළමා මනෝ රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවාව මෙම කේන්ද්‍රය වෙත නිරතුරුව සැපයෙන අතර, දෙස් විදෙස් විශ්ව විද්‍යාල පුහුණුව ලත් චිකිත්සකවරුන් සහ ඇදුරු මඩුල්ලකගේ කැපවීම මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකබලා ගැනීම පිළිබඳ මනා පුහුණුව ලත් සුරක්‍ෂිකාවන්ගේ රැකවරණය යටතේ නිරතුරුව මෙම දරුවන්ගේ නිපුණතා හා ශක්තීන් වර්ධනය සිදුකෙරේ.

හැකිතාක් කල්වේලා ඇතිව එනම්, පූර්ණ ළමාවිය තුළදීම මෙවැනි දරුවන් හඳුනාගෙන ඔවුන්ගේ ශක්‍යතා වර්ධනයට මැදිහත්වීමෙන් කෙටි කාලයක් තුළ මෙම දරුවන් සමස්ත සංවර්ධිත දරුවන් බවට පත්කිරීමට හැකියාව පවතින හෙයින් හැකි ඉක්මනින් මෙම ආයතනය වෙත ඔබේ විශේෂ අවශ්‍යතා සහිත දරුවා යොමුකරන ලෙස ද වැඩිදුරටත් සිහිපත් කරමි.

*සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ*
*සහ තොරතුරු කේන්ද්‍රය*
*මාතාපාර, මැනිංටවුන්, නාරාහේන්පිට.*

**අපට කතාකරන්න**
011-2698760, 011-2669330, 076-4575278
විද්‍යුත් තැපැල :-
*serric@army.lk / serricit@gmail.com*



# 40 වසකට එපිට

# යාපනයේදී දිවිපිදූ විරුවන් 13 දෙනා

ශ්‍රී ලංකා යුද හමුදාවට එරෙහිව එල්ටීටීඊය එල්ල කළ පළමු වැනි ප්‍රබල ප්‍රහාරය වූයේ 1983 ජුලි 23 දා යාපනේ නගරබද සුපතළ තිරිනැල්වෙලි හෙවත් තින්නවෙලි ගමේ මහ පාරක දී සැඟවී පහරදීමයි. මේ සිද්ධිය යුද හමුදාව සහ එල්ටීටීඊය අතර මහ සටන් මාලාවේ ආරම්භක ලක්ෂණය වූයේය. පොදු වහරේ 1 වැනි ඊලම් යුද්ධය යැයි හඳුන්වන සටන ඇරඹෙන්නේ මින් පසුවය. එතැන් සිට අද දක්වා ගෙවුණු කාලය වසර 40කි.

## පළිගැනීම

1983 ජුලියට කලින් උතුරේ ආරක්ෂක හමුදා පිරිස් ඉලක්ක කරමින් එල්ටීටීඊය ප්‍රහාර දෙකක යෙදුණත් ඒවා සාර්ථක වූයේ නැත. ඒ අතර යුද හමුදාව විසින් එල්ටීටීඊයේ ප්‍රධාන ඝාතක සීලන් හෙවත් චාල්ස් ලූකස් ඇන්තනි 1983 ජුලි 15 වන දා මරාදමනු ලැබීම ගැන වහා පළිගත යුතු යැයි ප්‍රභාකරන් තීරණය කළේ ය. එනම් නිතිපතා රැයේ තිරිනැල්වෙලි හරහා කෙරෙන යුද හමුදා වාහන මුර සංචාරයට සැඟවී පහරදීමයි. යාපනේ-පලාලි පාරේ යාපනේ සරසවි බිමට ඔබ්බෙන් තිරිනැල්වෙලි තැපැල් පෙට්ටි හන්දිය නමැති තැන මේ සඳහා තෝරාගත්තා ලදී. මෙය එල්ටීටීඊයේ තුන්වැනි බිම්බෝම්බ පිපිරවීම වනු ඇත. ප්‍රහාරය මෙහෙයවීමත් බිම්බෝම්බ පිපිරවීමත් බාර කෙරුණේ සෙල්ලක්කිලි හෙවත් සතාසිවම් සෙල්ලනායගම් නමැති එල්ටීටීඊ ප්‍රබල ඝාතකයාටය. ප්‍රහාරයේ යෝජිත කාලහෝරාව වූයේ 1983 ජුලි 23 වන දා මැදියම් රැයයි. එල්ටීටීඊ නායක ප්‍රභාකරන් ඇතුළු සෙසු ප්‍රහාරක පිරිස 18 ක් විය. ඒ වනවිට එල්ටීටීඊයේ මුළු සාමාජිකත්වය 35 දෙනකු පමණකි.

## "ෆෝ ෆෝ බ්‍රාවෝ"

යාපනේ නගරබද පෙදෙසේ යුද හමුදා වාහන මුර සංචාර කටයුතු දිනපතා කෙරෙන්නකි. 1 ශ්‍රී ලංකා පාබල හමුදා "සී" කණ්ඩායම ස්ථානගතව සිටි මාදගල් කඳවුර පිහිටියේ යාපනේ නගරයට කි.මී. 20ක් උතුරිනි. ඒ කඳවුරට සිරිත් පරිදි ජුලි 23 වන දා පැවරුණු මුර සැරි වැඩපිළිවෙළ මෙසේය. රැය උදාවත් සමග 2/ලුතිනන්වරයකු යටතේ 14 දෙනකුගෙන් සැදුණු සෙබළ පිරිසක් වාහන දෙකකින් මාදගල් කඳවුරෙන් ගමන් අරඹා පලාලියේ බළඇණි මූලස්ථානයට පැමිණ නියෝග ලබාගෙන යාපනේ ගුරුනගර්හි පිහිටි ආරක්ෂක සේනා මූලස්ථානය වෙත ළඟාවෙයි. එතැනින් රෑ 10 ට මුර සංචාරය අරඹනු ලැබේ. එකී සංචාරය ගුරුනගර් මූලස්ථානයේ සිට යාපනේ කඩ වීදිය, නල්ලූරුව, කෝපායි හන්දිය, උරුම්පරාය හන්දිය, කොන්ඩාවිල්, තිරිනැල්වෙලි ඔස්සේ යළි යාපනේ කඩ වීදිය දක්වා මාර්ග පරීක්ෂා කරමින් රෑ 12 ට ආපසු ගුරුනගර් මූලස්ථානය කරා පැමිණීමෙන් අවසන් වේ. මෙදින මුර සැරිය පැවරුණේ "සී" කණ්ඩායමේ බණ්ඩයකටය. එකී බණ්ඩභාර නිලධාරී 2/ලුතිනන් නිස්සංක ද වාස් ගුණවර්ධනගේ අණ යටතේ පිරිසකට ඒ වගකීම භාර කරන ලදී. මුර සංචාරක පිරිසේ රේඩියෝ රහස් කේතය

"44 බී" යන්නය. රේඩියෝවෙන් "ෆෝ ෆෝ බ්‍රාවෝ" යනුවෙන් අමතන මෙකී රහස් කේතය යටතේ සෑම විනාඩි 5 කටම වරක් යාපනේ මූලස්ථානය සමඟ මේ පිරිස රේඩියෝ සම්බන්ධතාව පැවැත්විය යුතුය.

මාදගල් කඳවුරේ 44 බ්‍රාවෝ මුර සංචාරක පිරිස රෑ 8 ට පමණ යාපනේ මූලස්ථානයට ළඟා වූ අතර, එහි සිට මුර සංචාරය ඇරැඹුවේ රෑ 10.06 ටය. 15 දෙනකුගෙන් සැදුණු පිරිස මුරසැරියේ යෙදුණේ ජීප් රියකින් සහ අඩ බඳැති කැනපි රහිත ටාටා ට්‍රක් රියකිනි. මේ පිරිසෙන් 2/ලුතිනන්ගේ අතේ SMG අවියක් සහ රිවෝල්වරයකි. සෙසු සියලු දෙනා සතුවූයේ SLR අවිය බැගිනි. ට්‍රක් රියේ සිටි මුනිස්සම් තුවක්කුකරු (Shot Gunner) අත රැඳුණේ රිපීටර් මුනිස්සම් තුවක්කුවකි. තවද, සෑමට ග්‍රෙනේඩ දෙක බැගින් තිබිණ.

## යුහ 4889 දරන ජීප් රියේ භටපිරිස

2/ලුතිනන් ඒපීඑන්සී ද වාස් ගුණවර්ධන (මුරයේ අණදෙන්නා), ලා/කෝ පෙරේරා ජීපී (පද්මසිරි), සාසෙ අමරසිංහ එස්එස්, සාසෙ කරුණාරත්න කේඩී, සාසෙ රාජතිලක එස්පීජී යන 1 ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් භටපිරිස හා 1 ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකායට අයත් සාසෙ මනතුංග එම්ඊ (ජීප් රියැදුරු).

## 26 ශ්‍රී 3193 දරන ට්‍රක් රියේ භටපිරිස

සැරයන් වේලකරත්න එස්ඒ (බණ්ඩහාර සැරයන්), කෝප්‍රල් පෙරේරා ආර්ඒයූ (1 පෙළ අණදෙන්නා), ලා/කෝ සුමතිපාල අයිඑච්, සාසෙ ප්‍රනාන්දු ඒජේආර්, සාසෙ මානපිටිය ඩීඑම්ඒඩී, සාසෙ රොබට් බී (මුනිස්සම් තුවක්කුකරු), සාසෙ විජේසිරි බීඩී, සාසෙ සුනිල් එම්බී, කෝප්‍රල් ප්‍රේරා පීපී (ට්‍රක් රියැදුරු) යන 1 ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් භටපිරිස.

## බිම්බෝම්බ අටවති

මේ අතර එල්ටීටීඊ ප්‍රහාරකයෝ කිහිප දෙනෙක් 1983 ජුලි 23 වන දා මැදියම් රැයට හෝරාවකට පමණ පෙර සිය මූලික කටයුතු තිරිනැල්වෙලි හි මහපාරේ දී යුහුසුලුව ඇරඹූහ. යුද හමුදා නිල ඇඳුමින් සැරසුණු ඔවුන් උස් හඬින් කතාබස් කළේ සිංහලෙනි. එබැවින් මුලින් ඔවුන් ගැන විමසිලිමත් වුණු අවට නිවැසියෝ නිහඬ වූවෝය. ප්‍රහාර ස්ථානයේ මීටර් 80 ක් පමණ පරතරයක් සහිතව ඔවුන් බිම්බෝම්බ දෙකක් වළ දැම්මේ දුරකතන රැහැන් ඇතිරීමට බිම කණින ලද තැන් පාවිච්චි කරමිනි. පළමු වැනි බෝම්බය තැපැල් පෙට්ටි හන්දියේ සිට මීටර් 30 ක් පමණ යාපනේ දෙසට වන්නටත් දෙවැනි බෝම්බය තැපැල් පෙට්ටි හන්දියේ සිට මීටර් 50 ක් පමණ පලාලි දෙසට වන්නටත් මහ පාරේ වළලන ලදී. මුල් බෝම්බය වැළලූ තැන අසල වෙළෙඳ සැලක කොන්ක්‍රීට් පියැස්ස උඩ පුපුරුවන යන්ත්‍රය තබා එය විදුලි රැහැන්වලින් බිම්බෝම්බ දෙක සමඟ සම්බන්ධ කෙරිණි. ප්‍රහාර නායක සෙල්ලක්කිලි සිටින්නේ පියැස්ස මතය. අනෙක් ප්‍රහාරකයෝ බිම්බෝම්බ පුපුරවන තැන් අබියස පාර දෙපසේ තාප්පවලට මුවා වෙමින් මනාව ස්ථානගත වූහ. ඒ සියලු දෙනා අත තුවක්කු තිබිණි. ඊට අමතර ව ඔවුන් සතුව යාපනේ තැනූ අත්බෝම්බ සහ පෙට්රල් බෝම්බ ද රැසකි.

## සැඟවුණු ප්‍රහාරයක්

විනාඩියෙන් විනාඩිය මෙසේ කාලය ගෙවෙද්දී "44 බ්‍රාවෝ" මුර සංචාරක පිරිස කෙමෙන් ඉදිරියට ගමන්ගති. හෝරාව රෑ 11.28 විණි. පුන් සඳ එළියක් හාත්පස පැතිරුණේය. පසු දිනට ඇසළ පෝය යෙදී තිබිණි. දැන් උරුම්පරාය හන්දිය පසුකළ බවත් තත්ත්වය සන්සුන් බවත් "44 බ්‍රාවෝ" විසින් යාපනේ මූලස්ථානය වෙත රේඩියෝවෙන් දැනුම් දෙන ලදී. ඊළඟ විනාඩි පහ අවසන තිරිනැල්වෙලි හන්දියට පිවිසුණු මුර සංචාරක වාහන දෙකේ පහන් එළි එතැනින් මීටර් 500 ක් එහා තැපැල් පෙට්ටි හන්දිය අසල රැකසිටි ප්‍රහාරකයන්ගේ උකුසු ඇස් සමඟ ගැටිණි. පළමුව පැමිණි ජීප් රිය බිම්බෝම්බය මතින් යන්ම සෙල්ලක්කිලි එය පිපිරවීය. රිය අබලන්ව ඉවතට විසිවුණු නමුත් එය තුළ සිටියවුන්ට හානියක් වූයේ නැත. එහෙත් ඔවුන් ගොදුරු කරගැන්මට දෙපැත්තකින් එල්ටීටීඊ වෙඩි පහර එල්ල කෙරුණේය. 2/ලුතිනන් වාස් ගුණවර්ධන රියෙන් එළියට පැන සතුරාට වෙඩිතබා ග්‍රෙනේඩ් පහරක් එල්ල කිරීමට තැත් කරද්දී වැදුණු මාරක උණ්ඩයකින් මියැදිණි. රියැදුරු මනතුංග රියෙන් බැසීමට යැමේදී වෙඩි පහරින් දිවි තොරවූයේය. රියේ පසුපසින් පිටතට පැනගත් අමරසිංහ, කරුණාරත්න සහ රාජතිලක යන තිදෙනා වෙඩිකාගෙන අභීතව සටන් කළහ. එනමුදු ඔවුන් තිදෙනා ජීප් රිය අසලදීම මරුමුවට පත්වූහ. එලෙසම රියේ පිටුපසින් එළියට පැනගත් ලා/කෝ පෙරේරා ජීපී (පද්මසිරි) හට මුලින් කිසි හානියක් නොවූයෙන් සිය SLR අවියෙන් නොබියව සතුරන්ට පහරදුන්නේය. ඔහු රියෙන් තරමක් දුරට පවා ගොස් සටනේ යෙදුණි. එහෙත්, අවසන පද්මසිරිටත් සිදුවූයේ සතුරාට සිය දිවිය පිදීමටය.

ජීප් රිය යටින් පළමු බෝම්බය පුපුරද්දී ඊට මීටර් 80-85 ක් පමණ පිටුපසින් පැමිණි ට්‍රක්රිය පැදවූ කෝප්‍රල් ප්‍රේරා ඒ බව දුටුව සැණෙන් තිරිංග තදකර යළි ඉදිරියට අද්දා රිය නවතාගති. දෙවැනි බෝම්බය පුපුරවන ලද්දේ රිය එතැනට ඒමට කලිනි. එබැවින් ට්‍රක් රියට ඉන් කිසිදු හානියක් වූයේ නැත. එහෙත්, හදිසියේ තිරිංග යෙදීම නිසා රියේ පිටුපස කොටසේ සිටගෙන විමසිල්ලෙන් සිටි රොබට් සහ විජේසිරි යන දෙදෙනා රිය තුළ ඇදවැටුණෝය. සටනට සූදානම් වීමේදී මඳ පමාවක් ඉන් හටගති. ට්‍රක් රිය වෙත එල්ටීටීඊ සටන්කරුවෝ දෙපැත්තකින් පහර දුන්හ. කෝප්‍රල් ප්‍රේරා රියැදුරු අසුන මතදීම මියගියේය. ඉදිරි අසුන්හි සිටි සැරයන් වේලකරත්න සහ ප්‍රනාන්දු තුවාල ලැබුව ද එළියට බැස සතුරන් සමඟ මරාගෙන මැරෙන සටනකට එළැඹුණෝය. සුළු මොහොතකින් ප්‍රනාන්දුගේ දිවි තොර වූයේය. වේලකරත්න නොබියව සතුරාට වෙඩිතැබූ නමුදු ඔහු වෙත ගැසූ අත්බෝම්බයකින් බරපතළ තුවාල ලැබීය. රොබට්, විජේසිරි සහ සුනිල් යන තිදෙනා රියේ පිටුපස කොටසේදීම සතුරු වෙඩි පහරින් මරු වැළඳගත්හ. ට්‍රක් රියේ පසුපසින් එළියට පැනගත් කෝප්‍රල් පෙරේරා ආර්ඒයූ (උපාලි), ලා/කෝ සුමතිපාල සහ මානපිටිය එතැනම පහත් වී මුවාවක් ගෙන සතුරන් හා සටනෙහි යෙදුණෝය. එහෙත්, සතුරන්ගේ ගණන අනුව වෙඩි බලය දරාගැනීමට අසීරු විය. ඒ අතර මානපිටිය මරුතුරුළට ගියේ සිය අන්තිම ග්‍රෙනේඩය උපාලිට දෙමිනි. සැණෙන් උපාලි එය සතුරන් දෙසට දමාගැසීය. ඉක්බිති රියේ දකුණු පසින් වූ කි.මී. දෙකේ කණුව අසලට පැනගත් ඔහු හා සුමතිපාල පිටට පිට තබාගෙන සිය අවි දෙකෙන් හතර අතේ වෙඩි තැබූහ. අවසන ඔවුන් දෙදෙනාගේ අවිවල ඉතිරි වූයේ උණ්ඩ කීපයක් පමණකි. උපාලි ගේ දෙපාවලටත් සුමතිපාල ගේ බඩටත් වෙඩිවැදී තිබිණි. ආරක්ෂාකාරී පියවරකට එළැඹි උපාලි වහා සුමතිපාලව කි.මී. කණුව අසල

පිහිටි මිටි තාප්පයෙන් ඇතුළත පිහිටි ගොඩනැගිල්ල දෙසට තල්ලුකර ඒ තාප්පයටම ළංව සාදා තිබූ පියැස්සට නැගගති. එහි මුදුනටම ඇදුණු ඔහු පාරට විරුද්ධ පැත්තේ පියැසි පලයේ රැඳුණේ පාර දෙසට සිය හිස යොමු කරමිනි. දෙදෙනාම අවසන් උණ්ඩ කීපය සහිත අවි දෙක තරයේ දැත්හි දරාගත්හ. යුද පිටිය මොහොතකට නිසල විය. සටන නිමාව දිටී. ප්‍රහාරයට ගතවූ මුළු කාලය විනාඩි දහයකි.

රෑ 11.28 න් පසු "44 බ්‍රාවෝ" වෙතින් කිසිදු රේඩියෝ පණිවුඩයක් නොලැබීමෙන් ගුරුනගර් මූලස්ථානයේ රේඩියෝ ක්‍රියාකරුවා කලබලයට පත්විය. දුරින් ආ පිපිරුම් හඬක් මූලස්ථානයට ඇසිණි. ක්‍රියාකරුවා කිහිප වතාවක් "44 බ්‍රාවෝ" ඇමැතුවත් පිළිතුරක් නොවිණි. මේ බව දැනගත් යාපනේ ආරක්ෂක සේනා මූලස්ථානයේ ආඥාපති බ්‍රිගේඩියර් ලයිල් බල්තසාර් ඇතුළු නිලධාරීහු විපිළිසර වූහ. බ්‍රිගේඩියර් බල්තසාර් විගසින් කොමාන්ඩෝ හටයන් සමඟින් මේජර් සරත් මුණසිංහ ඇතුළු නිලධාරී පිරිසක් කැටුව යාපනේ-පලාලි පාර ඔස්සේ ඉදිරියට ගියේය.

## ත්‍රස්ත නායකයාගේ අවසානය

තිරිනැල්වෙලි වෙඩි හඬ නැවතී තිබිණි. ප්‍රහාරකයෝ කෑ කෝ ගසමින් යුහුසුලුව යුද හමුදා භටපිරිසේ අවි එකතු කරන්නට පටන් ගත්හ. සෙබළුන්ගේ ඇඳුම්වල සාක්කු කපමින් උණ්ඩ-පතරොම් සොයනු ලැබිය. අතුරු මඟක තිබූ එල්ටීටීඊ වෑන් රියකට පැහැරගත් සියලු දේ පටවන ලදී. එල්ටීටීඊය සතුටුවූයේ ලොකු ජයකි. ශ්‍රී ලංකා යුද හමුදාවේ මෙතරම් ගණනක සෙබළ පිරිසක් මීට කලින් කවරම කලක වත් මැරුම්කා නැත. සියලු ඝාතකයෝ ප්‍රභාකරන් වටා රොක්වූහ. සිය පිරිසේ සැමට ඔහු ප්‍රශංසා කළේය. පිරිසට සැණෙකින් සෙල්ලක්කිලි ගැන මතක් විණි. ප්‍රහාර නායක සෙල්ලක්කිලි ආගිය අතක් නැත. ඔවුන් වහා දිව්වේ සෙල්ලක්කිලි අවසන් වරට ස්ථානගත වුණු වෙළෙඳ සැල ළඟටය. සෙල්ලක්කිලි ගේ මළ සිරුර එහි බිම වැටී තිබිණි. දරුණු වෙඩි පහරක් ඔහු ගේ ළය සිදුරුකර ගොසිනි. සෙල්ලක්කිලි මරාදමනු ලැබුවේ ජීප්රියේ පැමිණි ලා/කෝ පෙරේරා ජීපී (පද්මසිරි) විසින් යැයි අනුමාන කෙරේ. පැහැරගත් අවි පැටවූ රියටම සෙල්ලක්කිලි ගේ සිරුරත් පටවන ලදී. යුද හමුදා ආධාරක සේනා වහා එතැනට එන බව දත් එල්ටීටීඊ ඝාතක පිරිස සොව හිර කරගෙ නම වහා රහසිගත තිප්පොලකට පැනගියේ සිය ප්‍රබල සගයාගේ මළ සිරුර අබියස වැළපෙමිණි. ප්‍රභාකරන්ගේ හැඬීමක් දුටු පළමු හා අවසන් වතාව එය වූයේය. එල්ටීටීඊයේ ප්‍රධාන ඝාතක සීලන් මැරීමේ පළිය ගැනීමේදී තවත් දරුණුම ත්‍රස්තයකු බිලිදීමට ප්‍රභාකරන්ට සිදුව ඇත.

යුද පිටිය යළි නිහඬ වෙද්දී තාප්පෙන් ඔබ්බේ සිටි උපාලි සහ සුමතිපාල විමසිලිමත් වූහ. දෙදෙනාගේම ලේ වැගිරෙන තුවාල තිබිණි. යළි ප්‍රහාරකයන් පැමිණෙතියි සැකයෙන් මඳ වේලාවක් කල්මැරූ උපාලි මේ සිද්ධිය වහාම යුද කඳවුරට දැනුම්දීමට ඉටාගති. සුමතිපාලට එහිම වසංවීමට සලස්වා සිය අවිය මානාගත් ඔහු මඳ වේලාවකට පෙර දුවුණු යුද පිටියට යළි පා තැබිය. හාත්පස දුටුවේ බටහිර යුද චිත්‍රපටයක බඳු දර්ශනයකි. තැන තැන මියැදුණු සිය සගයන් හා දෙවුවන්ය. ජීප් රියෙහි මූලස්ථාන ඇමතුම් රේඩියෝව බිඳීගොසිනි. වහා දුරකතන ඇමතුමක් දීම සඳහා ඔහුට මතක් වූයේ කොන්ඩාවිල් ලංගම ඩිපෝවයි. අවිය මානාගත් උපාලි සිය දෙපාවලින් ලේ වැගිරෙද්දීම මැදියම් රැයේ ආපසු පලාලි දෙසට මහ පාරේ කි.මී. 2 ක් නොබියව දිවගොස් ලංගම ඩිපෝවට පිවිස අදාළ අංශවලට සිද්ධිය වාර්තා කළේය. පලාලි මාදගල් කඳවුරේ බණ්ඩහාර නිලධාරියකු වූ ලුතිනන් රජීව් වීරසිංහ ඇතුළු පිරිසක් විනාඩි ගණනක් ඇතුළත එතැනට ළඟාවී උපාලිත් කැටුව තිරිනැල්වෙලි සටන්බිම කරා ගියහ.

## සටනේ විශේෂත්වය

මේ සටනේ කැපීපෙනුණු ලක්ෂණ කිහිපයකි. එනම්,

- එල්ටීටීඊය කෙතරම් භයානක ත්‍රස්තයන් ගෙන් යුතු වුවත් ප්‍රහාරයෙන් පසු යුද හමුදා සෙබළුන් ළඟටම පැමිණ අවිආයුද හා උණ්ඩ පැහැර ගත්ත ද අවි දරමින් අත ළඟ සිටි යුද හමුදා සෙබළුන් දෙදෙනකු අබිබැවීමට ඔවුනට නොහැකි විය.
- ඒ සෙබළුන් දෙදෙනා තාප්පයෙන් පැන්න බව එල්ටීටීඊය දුටුවේ නැත.
- බිම්බෝම්බ පිපිරවීමේ කාලම්නුම සියයට පහහක් වැරදිණි.

> "යුද හමුදාපති මේජර් ජෙනරාල් තිස්ස වීරතුංග 1983 ජුලි 24 වන දා දහවල් වෙද්දී ගුරුනගර්හි යාපනේ ආරක්ෂක හමුදා මූලස්ථානයට හෙලිකොප්ටරයකින් පැමිණියේය. ඔහු ඇතුළු යුද හමුදා උසස් නිලධාරීහු යාපනේ රෝහලට ගොස් තුවාල ලත් දෙදෙනා හමුවූහ. කෝප්‍රල් උපාලිට සැරයන් වරයකු ලෙස සටන් බිමේ උසස්වීමක් පිරිනමන ලදී. එය ශ්‍රී ලංකාවේ මුල්ම එවැනි උසස්වීමයි. ලා/කෝ සුමතිපාල හට ද කෝප්‍රල් තනතුරට සටන් බිමේ උසස්වීමක් දුනි. තිරිනැල්වෙලිදී දිවිපිදූ "44 බ්‍රාවෝ" මුර සැරියේ සියලු හමුදා සාමාජිකයෝ ඊළඟ ඉහළ තනතුරට උසස් කරනු ලැබූහ."

බෝම්බයකට ගොදුරු වූයේ එක් වාහනයක් පමණකි. එනම්, ජීප් රියයි. එහෙත්, එය අටවා තිබූ අයුරින් ජීප් රියේ සිටි කිසිවකුට ශාරීරික හානියක් වූයේ නැත. දෙවැනි බෝම්බය පුපුරුවද්දී ට්‍රක්රිය එතැනට පැමිණ නොතිබුණෙන් එයින් ට්‍රක් රියට ද කිසිදු උවදුරක් නොවිණි.

- එල්ටීටීඊ ප්‍රහාර නායකයාටම මරු පහර එල්ල කිරීමට ජීප් රියේ පැමිණි යුද සෙබළෙකුට හැකි විය.
- එල්ටීටීඊ ප්‍රහාර නායකයා මැරුම් කෑ බව කිසිදු සගයකු දක නැත.

## නිසල විරුවෝ

ආගිය අතක් නැතිව සිටි "44 බ්‍රාවෝ" මුර සංචාරකයන් 1983 ජුලි 24 වන දා පාන්දර 00.09 වෙද්දී මුලින්ම දකින ලද්දේ ගුරුනගර් මූලස්ථානයේ සිට පැමිණි හමුදා පිරිස විසිනි. ඔවුන් පළමුව දුටුවේ කැඩීබිඳුණු ජීප් රියයි. ඒ සමග දිස්වුණු දේ ඔවුන්ට අදහාගත නොහැකි තරම්ය. ජීප් රිය වටා සෙබළ සිරුරු විසිර ගොසිනි. මීටර කීපයක් නුදුරින් 2/ලුතිනන් වාස් ගුණවර්ධන ගේ සිරුරයි. එල්ල කිරීමට සූදානම් කළ ග්‍රෙනේඩයක් ඔහුට යටවී තිබිණි. අවසන් මොහොතේ පවා සතුරාට ප්‍රතිප්‍රහාරයක් දීමට ඔහු සැරසුණු සෙයකි. ට්‍රක් රිය තිබුණේ ජීප් රියට මීටර 75ක් පමණ ඔබ්බෙනි. ට්‍රක් රිය අසල තවත් සෙබළ සිරුරු කිහිපයකි. ට්‍රක් රිය යටින් සෙබළකු නගන වේදනාබර හඬක් ඇසුණෙන් විගස ඔහු එළියට ගන්නා ලදී. බරපතළ තුවාල ලත් ඔහු සැරයන් වෙලකරත්නයි. ඔහු කතා කළේය. නොපමාවම ඔහු රෝහලට යවන ලදී. මොහොතකට පසු අසල ගෙවත්තෙන් නොණ්ඩි ගසමින් එන රුවකි. ඔහු ලා/කෝ සුමතිපාලයි. ඔහුත් ඒ වනවිට එතැනට යළි පැමිණ සිටි කෝප්‍රල් උපාලිත් වහා යාපනේ රෝහලට යැවිණි. එහෙත්, රෝහලට ඇතුළු කරද්දී සැරයන් වෙලකරත්න මියගියේය. ඒ අනුව කෝප්‍රල් උපාලි සහ ලා/කෝ සුමතිපාල හැර "44 බ්‍රාවෝ" මුර සැරියේ හමුදා සාමාජික 13 දෙනා සදහටම නිසල රණවිරුවෝ වූහ.

## සටන්බිම් උසස්වීම්

යුද හමුදාපති මේජර් ජෙනරාල් තිස්ස වීරතුංග 1983 ජුලි 24 වන දා දහවල් වෙද්දී ගුරුනගර්හි යාපනේ ආරක්ෂක හමුදා මූලස්ථානයට හෙලිකොප්ටරයකින් පැමිණියේය. ඔහු ඇතුළු යුද හමුදා උසස් නිලධාරීහු යාපනේ රෝහලට ගොස් තුවාල ලත් දෙදෙනා හමුවූහ. කෝප්‍රල් උපාලිට සැරයන් වරයකු ලෙස සටන් බිමේ උසස්වීමක් පිරිනමන ලදී. එය ශ්‍රී ලංකාවේ මුල්ම එවැනි උසස්වීමයි. ලා/කෝ සුමතිපාල හට ද කෝප්‍රල් තනතුරට සටන් බිමේ උසස්වීමක් දුනි. තිරිනෑල්වෙලිදී දිවිපිදූ "44 බ්‍රාවෝ" මුර සැරියේ සියලු හමුදා සාමාජිකයෝ ඊළඟ ඉහළ තනතුරට උසස් කරනු ලැබූහ.



මුරයේ අණදෙන්නා - පාණදුරේ, හොරකපොළ ලුතිනන් නිස්සංක ද වාස් ගුණවර්ධන (උපත 1961)



මුරයේ බණ්ඩාර සැරයන් - බණ්ඩාරගම, කඹුරුගොඩ මාණ්ඩලික සැරයන් වෙලකරත්න එස්වී (උපත 1942)



මුරයේ අනුමාන හොඳම ප්‍රතිප්‍රහාරකයා - බත්තරමුල්ලේ, තලංගම උතුර කෝප්‍රල් පෙරේරා පීපී (පද්මසිරි) (උපත 1959)




මුරයේ 2 වැනි දිවිගැලවීම්කරු/ ශ්‍රී ලංකාවේ දෙවැනි සටන්බිම් උසස්වීම්ලාභියා - පාදුක්කේ, කෝප්‍රල් සුමතිපාල අයිඑච්





මුරයේ 1 වැනි දිවිගැලවීම්කරු/ ශ්‍රී ලංකාවේ මුල්ම සටන්බිම් උසස්වීම්ලාභියා - ගාල්ලේ සැරයන් පෙරේරා ආර්ඒයූ (උපාලි). තරුණ විසේ රොසැමේ ලෙස (වමේ) සහ පසුව ලුතිනන් නිලයට උසස් වූ උපාලි පෙරේරා (දකුණේ). රණශූර පදක්කම (ආර්එස්පී) සඳහා ශ්‍රී ලංකාවේ මුලින්ම නිර්දේශ කෙරුණු හමුදා සාමාජිකයා ඔහුය.



මුරය අතින් මැරුම්කෑ ත්‍රස්ත ප්‍රහාර නායකයා - යාපනය කල්වියන්කඩුවේ සෙල්ලක්කිලි හෙවත් සතාසිවම් සෙල්ලනායගම් (උපත 1953)

## ජුලි කලහය ඇරැඹේ

මෙය 1948 න් පසු 1983 ජුලි 23 දක්වා ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල කවර අංශයකට හෝ මෙතෙක් තනි සිද්ධියකදී විඳින්නට වුණු විශාලම ගණනක මරණ සහිත හදිසි විපත්තියයි. සිද්ධියෙන් පසු හමුදා මළ සිරුරු 13 ත්, හමුදා තුවාලකරුවන් දෙදෙනාත් ජුලි 24 වන දා සවස ගුවනින් රත්මලානට ගෙනයනු ලැබිණි. හමුදා අවමඟුල ජුලි 24 වන දා බොරැල්ල කනත්තේ සිදුකිරීමට මුලින් කටයුතු සූදානම් කළත් පසුව ආණ්ඩුවේ තීරණයක් අනුව සියලු මළ සිරුරු ඥාතීන්ට භාරදෙන ලදී. ජුලි 24 වන දා හවස් යාමයේ "ජුලි කලහය" හෙවත් "කළු ජුලිය" යනුවෙන් හඳුන්වන ජාති භේද කලහය කොළඹ කනත්තට නුදුරේ බොරැල්ල හන්දියෙන් ඇරැඹුණෙන් රට පුරාම පැතිර ගියේය. එයින් වනසා දමන ලද මිනිස් ජීවිත සහ දේපළ රැසකි. 1983 "ජුලි කලහය" යනු ශ්‍රී ලංකාව කිසි දිනෙක අත්නොදක නොතිබුණු අයුරක මහා විනාශයක් වූයේය.

සම්පාදනය අතුල විජයසිංහ විසිනි.
(ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨයේ ස්ථාපිත ආයතනයක ප්‍රධානියෙකි)
විද්‍යුත් තැපෑල : -athulawijayasinha@gmail.com



# සෙබළ සිතුවිලි

## පුතේ මං නුඹ වැදූ අම්මා...

ගිය සතියෙ නුඹ ගෙදර ආවම
මගෙ අතින්ම බතුත් කැව්වා
නුඹගෙ ඇස්වල දුකක් ඇති බව
මගෙ හිතත් මට හොරෙන් කිව්වා...

අනේ කරගැට එනතුරුම මං
නුඹට හිමි ජීවිතය හෙව්වා
සකුල් රිදුනත් නුඹේ පාරට
කළුලින්ම මං පළස එළුවා...

කටු ඔටුනු මගෙ හිසට බරමුත්
නුඹෙ ලොවට මං කිරුළ මැව්වා
සරසවිය වෙත පා නැගූ දා
හිතෙන් මං ලොකු හීන මැව්වා...

නොයෙන්නම නුඹ යන්න ගිය බව
සිහිනයෙන් මෙන් කවුද කිව්වා
පටාචාරාවක් වලසින්ම මං
පුතේ නුඹ හැම තැනම හෙව්වා...

යන්න පෙර මට නොකිව්වේ ඇයි
මගේ හිත හැම වේලේ කිව්වා
බිඳුණු හිතක කඳුළු මල් මං
නුඹේ සොහොනේ උඩින් තිව්වා...

සෙ/418034
කෝප්‍රල් තිලකරත්න ජීඩබ්ලිව්ජීවස්
5 ගැහේබ

## හමුදා ඇඳුරිඳු...

වැටුණු තැනකින් නැගිට ගන්නට
හදින් සැමවිට දිරිය දී
ඔවා දුන් දින ගණන නිතරම
තවම නොදනී සැමවිට
වචනවල බර තදින් දැණුනත්
නිහඬ බවින් ඒ දරන් සිටියා
කහට නැත හදේ කිසිදින
ඒ වදන් මා දිරිකළා
දිසාපාමොක් විය මගේ ලෝකේ
හමුදා ඇඳිරිඳු නුඹය මාගේ

සෙ/එස්108189
ඉසෙ නිමල්ශාන්ත
13 ඉසේබ - යුහමු

## පොඩි පුතු...

රඹ කඳක් සිටවලා සැරසුවෙමි ගොක් පතින්
මට කිසිත් උරුම නැත මා හැදුව සම්පතින්
නුඹ විසින් හැඳිය යුතු සොහොන්පල මගෙ ඉතින්
කවුද මා ගෙන යන්නෙ පුතුනි හෙට කර මතින්

ලේ කඳුලු දහදියෙන් අටවගත් නිවහනේ
ජීවිතය දුටුව අඩු නැතුව මා පිය සෙනේ
මා අතින් නැත කිසික් දරුවන්ට අඩු වුනේ
මා මෙලෙස තනි කරල කොහෙද ගියෙ පොඩි පුතේ

ජී කාන්ති විජේලතා (මව)
සෙ/427749
කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ - 12 ගැහේබ
ජනමාධ්‍ය හා මව්මෙ අම

## අම්මා...

සතුටු සයුර මත
කඳුළු කැට ඇත
ගැඹුරු ජලය යට
දුක් සෝ සුසුම් ඇත
වසා පැතිරුණු සිනා ගඟුල
මවයි සතුටු ලෝකයක
නිහඬව ගලායන
සතුටු සයුර ලග
හෙලපු දහදිය ඇත
වඩාබර ඔබ
සුසුමක් එගොඩ කරයි
ජීවන සිනහ සිත්තම්
සමගම මගේ අම්මා

සෙ/වජ්100858
පාසෙ දුෂ්නාත කුරේ එම්වම්වස්
10(සෙවි) ගැහේබ

## උහුලපන් මගෙ පුතුනී...

අර පෙනෙන මායිමේ
මහා රකුසන් කැලක්
ලේ පිපාසෙන් සරයි
බිලි ගන්නට නුඹේ දිවිය...
උහුලපන් මගේ පුතුනි
මිතුරු මේ ගිනි අවිය
එයම වෙයි එකම මග
රැකගන්නට ජීවිතය...
කියයි ඒ වදන්
මවා සිත රකුස් කැලේ
වෛරයෙන් පිරෙව්වා
මගේ මොලකැටි හිතම...
දිනක ආවා ළඟට
ඒ කියූ රකුස් කැළ
වැටහුණා එදින මට
රකුස් කැළ කවුද වග...

සෙ/534932
පාසෙ හැරල්ඩ් එම්කේබීකේ
18 විපාරෙ

## සෙබළ පෙම...

වියරු වූ මිහිකත ගිණිගත් සමයක
ඉඩෝර නියගය දිය බිඳක් අයදින සේ
ලැබේ යැයි සිතා නොයිඳුල් සෙනෙහේ ඔබේ
කප්පරක් පෙරුමන් පුරා අහස් ගැබ තරම්
බලා සිටියද තල් අරණේ තනි වූ මට
හිමිවූයේ
අත රැඳි ගිණි අවිය පමණි...

සෙ/518846
ලා/කෝ මහේෂ් කුමාර ඒවම්
8 විපාරෙ


## මොකටද...

උඹ මොන ජගතෙක් උනත්
උඹටවත් මටවත් බැහැ
සොබාදහම වෙනස් කරන්න
ඒකට අනුගත වෙයන්
එයයි සදාකාලික සුවය
සොබා ධර්මය...

අජන්ත හේරත්
අයවැය හා මුපඅම

# කෙළිබිමේ

## පෑ විරු හපන්කම්





# ‘Mahameruwa Rally Cross - 2024’ තරඟාවලියෙන් යුද්ධ හමුදාවට ජයග්‍රහණ රැසක්

*“Mahameruwa Rally Cross - 2024”* තරඟාවලිය ගිරිඋල්ල, මහාමේරුව මෝටර් රථ ධාවන පථයේදී දිපවාප්ත තරඟකරුවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ජනවාරි මස 13 සහ 14 යන දිනයන්හිදී පැවැත්විණ. එහිදී, විවිධ කාණ්ඩ යටතේ පදක්කම් 12ක් දිනාගැනීමට යුද්ධ හමුදා මෝටර් රථ ධාවකයෝ සමත් වූහ.

# බර ඉසිලීමේ ශූරතාවලියෙන් යුද හමුදා ක්‍රීඩිකාවන්ට පදක්කම් රැසක්







"යොවුන් කනිෂ්ඨ සහ ජ්‍යේෂ්ඨ ජාතික බර ඉසිලීමේ ශූරතාවලිය - 2023" ඉකුත් දෙසැම්බර් මස 27 සිට 30 දින දක්වා පොළොන්නරුව, ගල්ලැල්ල ජාතික ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්විණ. මෙම තරඟාවලිය සඳහා දිවයින පුරා වෙසෙන බර ඉසිලීමේ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රැසක් සහභාගී වූහ. ඒ අතර යුද්ධ, නාවික සහ ගුවන් හමුදා ක්‍රීඩකයින් ඇතුළුව ක්‍රීඩා සමාජ 11 ක තරඟකරුවෝ ඇතුළත් වූහ. එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බර ඉසිලීමේ කණ්ඩායම එම ශූරතාවලියේදී රිදී පදක්කම් 3 ක් සහ ලෝකඩ පදක්කම් 2 ක් දිනා ගැනීමට සමත් විය.



# ‘ජාතික බේස්බෝල් ශූරතාවලිය - 2024’ ජය යුද්ධ හමුදාවට

"ජාතික බේස්බෝල් ශූරතාවලිය - 2024" දියගම බේස්බෝල් පිටියේදී ඉකුත් ජනවාරි 06 සිට 21 දින දක්වා දිවයිනේ නන් දෙසින් සහභාගී වූ කණ්ඩායම් 19 ක සහභාගීත්වයෙන් පැවැත්විණි. යුද්ධ හමුදා බේස්බෝල් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ප්සී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම මත යුද්ධ හමුදා කණ්ඩායමක් ද ඊට සහභාගී විය. එහිදී, අවසන් තරගයේදී නාවික හමුදා ක්‍රීඩකයින් සමග තරගවැදී ලකුණු 4 ට 9 ලෙස ශූරතාව දිනාගැනීමට යුද හමුදා ක්‍රීඩකයෝ සමත්වූහ.




## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක "රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර,
ranaviruwa@yahoo.com

# දසරාජ ධර්ම



බෞද්ධ ඉගැන්වීම්වලට  අනුව රජවරුන් සඳහා අනුගමනය කිරීමට පනවා ඇති ධර්මතා දහයක් මෙසේ සඳහන්ව ඇත.

**දානං (දානය)**

ඔබ විසින් නායකත්වය දරනු ලබන පිරිසගේ අභිවෘද්ධිය සඳහා කරනු ලබන ඕනෑම ආධාරයක් හෝ උපකාරයක් දානය යනුවෙන් අදහස් කෙරේ.

**ශීලං (ශීලය)**

මෙයින් අදහස් කරනුයේ පෞද්ගලික ජීවිතයේ විවෘත සහ පිරිසිදු භාවයයි. පෞද්ගලික ජීවිතයේ පිරිසිදු භාවය ඔබ වෙත ප්‍රභූත්වයක් සහ ආකර්ශනීය පෞරුෂයක් ලබාදෙයි.

**පරිච්ජාගං (පරිත්‍යාගය)**

මෙයින් අදහස් කරනුයේ ඔබගේ කාලය, ශ්‍රමය, ධනය, සැප සම්පත් සහ හැකියාවන් පොදු යහපත වෙනුවෙන් යෙදවීමයි. ආත්ම පරිත්‍යාගය නායකත්වයට අත්‍යාවශ්‍ය ගුණයකි.

**අජ්ජමං (සෘජු බව)**

යනු හැම විටම යම් නීතියකට සහ සම්මුතියකට අනුව සියල්ලන් හට එකසේ සාධාරණත්වය ඉටු කිරීමේ සෘජු භාවයයි.

**මජ්ජමං (මෘදු බව)**

යනු නිහතමානී කරුණාවන්ත භාවයයි. මේ සඳහා ඉවසීම සහ දරාගැනීමේ ශක්තිය අවශ්‍ය වේ.

**තපං (තපස)**

ලද දෙයින් සතුටු වී ගත කරන චාම් සහ සරල ජීවන පැවැත්මයි. අවම අවශ්‍යතා ප්‍රමාණයකින් තෘප්තිමත් වීමයි.

**අක්කෝධෝ (ශාන්තිය)**

යනු ඉවසීමයි. ඔබට සතුරුකම් කරන අයවලුන් හට පෙරලා පහරනොදී සන්සුන්ව සිටීමේ ශක්තියයි.

**අවිහිංසාව (අවිහිංසාව)**

යනු ඔබ සතු බලතලවලින් සෙස්සන්ට හිංසා කිරීමෙන් වැළකී සිටීමයි.

**ඛන්තිච (අක්‍රෝධය)**

යනු වෛරයෙන් සහ ඊර්ෂ්‍යාවෙන් වැළකී සිටීමයි.

**අවිරෝධතා (අවිරෝධතාවය)**

ඔබගේ අදහස්වලට හෝ වැඩවලට එකඟ නොවන අයවලුන් හට විරුද්ධ නොවී ඉවසා සිටීමේ හැකියාව.


# රණවිරුවා





**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේඑච්එන් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ජීවිත ද සා
ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව්ලිව් ලක්ෂිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**
සෙ/752158 ඔනි II සේනාරත්න ජීසී    3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම්    11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**
රණවිරුවා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.



**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුත දිගුව**

51445 / 51446 / 51447


**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**


**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# සැඟවුණු වෙඩික්කරු

## පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්

දියතලාව, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසල මගින් මාස එකොළහක කාලසීමාවක් පුරාවට පවත්වනු ලැබූ සැඟවුණු වෙඩික්කරු පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරනු ලැබූ සිසුන්ගේ විසිරයාමේ සහ නිල ලාංඡන පැළඳවීමේ උත්සවය පසුගිය දා පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස එම පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම් ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී සහභාගී විය.

එහිදී, නිලධාරීන් දෙදෙනෙක් සහ සෙසුනිලයන් 16 දෙනක් සැඟවුණු වෙඩික්කරුවන් ලෙස සුදුසුකම් ලැබූ අතර, ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් ඔවුන් විශේෂ සම්මානයෙන් පිදුම් ලැබීය. පාඨමාලාවේ දක්ෂතම වෙඩික්කරු ලෙස විජයබාහු පාබල රෙජිමේන්තුවේ කපිතාන් ඩබ්ලිව්ජ්කේඑම් ප්‍රදීප් කුමාර ද හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි ශිෂ්‍යයා ලෙස කමාන්ඩෝ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් රූපසිංහ පීඑස් ද සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයා ලෙස කමාන්ඩෝ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් නිරෝෂන් කේඑච්ජී ද සම්මාන හිමිකරගත්හ.

# යුද වැදුණු කලපුවේ ඔරු පදින විරුවෝ...







රණබිමේ මතක

2009 වසරේ මුලතිව් නන්දිකඩාල් හිදී එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් කළ අවසන් සටන පිළිබඳ සිහිපත් කරද්දී නිතැතින්ම මතකයට එන තවත් නාමයක් වනුයේ පුදුමාතලන්ය. දහස් සංඛ්‍යාත සිවිල් ජනතාවක් ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවාගනු ලැබුවේ එම කලපුව හරහාය. ත්‍රස්තවාදය උග්‍රව පැවති සමයෙහි ඔවුන්ගේ මර්මස්ථානයක්ව පැවති මෙම කලපු ප්‍රදේශය බොහෝ ගැටුම් ඇවිළුණු ලේ කඳුළු වැගිරුණු තැනක් විය. රණවිරුවන්ගේ එම ලොවක් මවිත කළ ඓතිහාසික මානුෂීය මෙහෙයුම පිළිබඳ මතක තවමත් එහි කලපු දිය අතර සැඟව ඇතුවාට සැක නැත. පසුගියදා 68 වන සේනාංකයේ මෙහෙයවීමෙන් ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ද සහයෝගයෙන් එහි ඔරු පැදීමේ තරඟාවලියක් පැවති අතර, සැබැවින්ම එය එදවස පැවති ත්‍රස්තවාදයට කළ සරදමක් සේම සාමයේ අගය විදහා පෙන්නූ අපූරු අවස්ථාවක් ද විය.